# SIYABAS LAKARA

OR

# SINHALESE RHETORIC

BY

## KING SIḶÁMÉGHAVARṆA

PARAPHRASED BY

## RATNAMADHVÁCHÁRYA MAHÁ THÉRA

REVISED BY


## H. JAYATILAKA

*Editor of the "Amáwatura," "Námáwaliya," "Girásandésaya," "Heranasika," "Selalihinisandésaya," &c.*


---

# සියබස් ලකර : ස්වභාෂාලඞ්කාරය

**ශිලාමෙඝවර්ණ මහරජහු විසින් විරචිතයි**

**රත්නමධ්වාචාර්ය්‍ය මහතෙරුන්වහන්සේ විසින් ලියනලද**
**අර්ථවර්ණනා සහිතයි.**

**එච්. ජයතිලක විසින් ලිපිදොෂ ශුද්ධකොට සකස්කරණලදී.**

---


PRINTED AT THE "GRANTHAPRAKASA" PRESS, COLOMBO.

1901

# සංඥාපනය.

කාව්‍යයන් හොබවන්නාවූ නොහොත් වාක්‍ය රචනාවන් ප්‍රියමධුර බවට පමුණුවන්නාවූ ශාස්ත්‍රය අලඞ්කාර නම්. සිංහලජනයා විසින් පුරුදුපුහුණු කටයුතුවූ හෙවත් ස්වභාෂාවට ශොභාකරවූ අලඞ්කාර ශාස්ත්‍රය සියබස් ලකර නම් වේ. ශ්‍රීමත් දණ්ඩ්‍යාචාරීන් විසින් සඞ්ග්‍රහීතවූ කාව්‍යාදර්ශ නම් සංස්කෘත ග්‍රන්ථය සිංහලට පෙරළා මේ ග්‍රන්ථය රචනාකරණලද බැව් පෙණේ. එසේ නුමුත්, දීපකාදි සමහර අලඞ්කාරයන් සම්බන්ධව කාව්‍යාදර්ශයෙහි නොදක්වනලද සූක්ෂ්මභෙද විස්තරකිරීමද අන් සමහර තැනෙක අතිශයින් කියයුතු කොටස පමණක් දක්වා සෙස්ස නොකියා හැරීමද යනාදි විශෙෂයන් මෙහි දක්නාලැබෙත්. යමකවර්ගයද කව් කීපයකින් නිමවා තිබේ.

ක්‍රි: ව: 846 වැන්නෙහි ලක්දිව සේසත් නැගූ සිංහල රාජපරම්පරායෙහි 110 වැනිව සිටි 1 වෙනි ශිලාමෙඝවර්ණරජු විසින් මේ සියබස් ලකර රචනාකරණලදී. ඒ රජතුමාගේ සහොදරවූ අමරගිරිකාශ්‍යප* නම් මහඇපාතන් විසින් මෙය රචනාකරණුසඳහා ආරාධනාකරණලදබව මෙහි අග 399 වෙනි ගියෙන් පෙණේ. මේ දෙදෙනා පිළිබඳ ප්‍රවෘත්තිය මහාවංශයෙහි 50 වෙනි පරිච්ඡේදයෙන් දතයුතුයි. රත්නමධ්වාචාර්ය [රත්නමතිපාද?] නම් මහතෙරකෙනෙකුන් විසින් මීට ව්‍යාඛ්‍යාන ලියනලදූයි මෙම ග්‍රන්ථසමාප්තියෙහි පෙණෙන නමුත්, මෙකල්හි විද්‍යමානවූ පොතපතකින් හෝ ඇදහියයුතු කථාමාත්‍රයකින් හෝ මේ විචක්ෂණ ආචාර්යවරයන්වහන්සේගැණ මෙහි සඳහන්කළයුතු ප්‍රවෘත්තියක් නොදතහැකි විය.

ඡන්දස් ව්‍යාකරණාදි අවශෙෂ ශාස්ත්‍රයන් මෙන්ම මේ අලඞ්කාර ශාස්ත්‍රයද වෙන්වශයෙන් උගතමනා වුවද, පරිචයවශයෙන් ස්වදෙශීන් අතුරෙහි එබඳු පරිශ්‍රමයක් නොපවත්නා බැව් පෙණේ. මෙසේ වීමට ප්‍රධාන හෙතුව නම්, මේ ශාස්ත්‍රය් ඉගෙණීමට ඉවහල්වූ මෙම පොතින් ඵල ලැබීම මෙපමණකල් සම්බාධව පැවැත්මයි. මේ මහත් පාඩුව පිරිමසන ආශාවෙන් මෙම ග්‍රන්ථය මුද්‍රණයකොට ප්‍රසිඬකරණ පිණිස දීර්ඝ කාලයක් මුලුල්ලෙහි පුස්කොළ පොත් රැස්කෙළෙමු. ඉන් සමහරක පද්‍යයෙහි පෙණෙන පද සන්නයෙහිද, සන්නයෙහි පෙණෙන පද පද්‍යයෙහිද නොමැතිවී මහත් විරලභාවයක් දක්නාලදී. බොහෝ පොත්හි

---

* “සිරිසංබෝ කපුබ් මහරද්හු සොහොවුර් අභාසලමෙවන් ම පර්මුකා” යනු ශිලාලෙඛනයි.

පදගත සන්නය මුත් පද්‍යබන්ධනය නොමැතිව යාවද, පොතකළ උත්තමයා විසින් දක්වනලද අදහස්වලට අතිශයින් විරුද්ධවූ දේ මිශ්‍රවනලද බැව්ද පෙණේ. 841 වෙනි ගිය සඳහා ලියා තිබෙන භාවසන්නයට යෙදූ අඩොලිපියෙන්ද එබඳු තැනක් හඟවන බැව් දතයුතුයි.

2 වෙනි ගියෙහි පෙණෙන "වාමන"* ශබ්දය පාතරට සියලු පොත්හිම "බාමහ"† යයිද "බාරත" යයිද ලියාතිබේ. උඩරටින් ලැබුනු (සම්පූර්ණ කවි 400යෙන් යුත්) පොත් දෙකක පමණ "වාමන" යයි පෙණුනු හෙයින් ඒ එසේ යෙදීමු.

අවුරුදු දහසකිනුත් අධිකවූ කාලයක් මුලුල්ලෙහි මෙසේ ව්‍යාකූලව පැවති මේ පොත සම්පූර්ණ ශුද්ධියකට පැමිණවීම ප්‍රථම මුද්‍රාඞ්කණයෙහි නොකටහැකිබව උගත් ජනයාට සුවසේ වැටහේමය. එබැවින් මෙහි ඉතිරිව පෙණෙන යම් දෝෂයක් ඇත්නම් ව්‍යක්ත ලෝකයා විසින් දක්වනුලැබේවා. අපගේ ආචාර්‍ය්‍යවූ විද්‍යෝදයපරිවෙණාධිපති ශ්‍රීපාද ස්ථානයෙහි සහ පාතරට ප්‍රධාන සඞ්ඝනායකපදප්‍රාප්ත ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය ශ්‍රී සුමඞ්ගලාභිධාන මහාස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍යවූ, උගත් ගුණවත් මහගොඩ ඤාණිස්සර ස්වාමිපාදයන්වහන්සේ විසින් මෙහි පැවති ග්‍රන්ථස්ථාන කීපයක් විසඳාදුන් බවද මේ කාර්‍ය්‍යය පිණිස බොහෝ අනුබල දුන් බවද ප්‍රශංසා පෙරදැරිව කියාසිටිමු.

---

* "කාව්‍යාලඞ්කාර සූත්‍රවෘත්ති" නම් අලඞ්කාර ග්‍රන්ථය කළ ආචාර්‍ය්‍යවරයායි.

† ආචාර්‍ය්‍ය වරරුචි රචිත ප්‍රාකෘතප්‍රකාශයට "මනොරමා" නම් ටීකාව කළ ආචාර්‍ය්‍යවරයායි.

# සියබස් ලකර.

---

## නමවිමුනිසරණ.

1\. සඳුවා මුව තඹර—වෙනෙනද සිවුමුවා,
සරසවියහස සවිසුදු—කිවිසිත් දුල් මදෙවු විල්.

1\. සවිසුදු, සර්වශුක්ලවූ; සරසවියහස, සරස්වතීසඞ්ඛ්‍යාත හංසධේනු තොමෝ; සිවුමුවා, චතුර්මුඛයාගේ; මුව තඹරවෙනෙන්, මුඛසඞ්ඛ්‍යාත තාමරස වනයෙන්; අද, අවුත්; කිවිසිත්, කවිචිත්ත නැමති; දුල් මදෙවු විල්, දුලූවූ මන්දාකිණි සරස; සඳුවා, සඤ්ජනකරාවා.

2\. මහබඹ සකා සුර—ඇජර එ කසුබුඉසි,
පවර වාමන දඬි ඇ—නැමද කවිලකුණැජරන්.

2\. මහබඹ, මහාබ්‍රහ්මය; සකා, ශක්‍රය; සුරඇජර, බෘහස්පතිය; පවර, උතුම්වූ; එ කසුබුඉසි, ඒ කාශ්‍යප (නම්) ඍෂිය; වාමන දඬි ඇ, වාමනය දණ්ඩිය යනාදිවූ; කවිලකුණැජරන්, කාව්‍යලක්ෂණාචාර්‍ය්‍යයන්; නැමද, නමස්කාරකොට.

3 දෙරැස්වස් කියමි—පෙර ගත් සකෙවිනිදු වූ,
නොදත නොදත දෙව්බස්—සියකවිලකුණිනෙක්දෙස්.

3\. පෙර, පූර්වයෙහි; සකෙවිනිදු වූ, සඞ්ක්ෂේපයෙන්ද වූ; ගත්, ශාස්ත්‍රය; නොදත, නොදත්තාවූද; දෙව්බස්, දිව්‍යභාෂාව; නොදත, නොදත්තාවූද; දෙරැස්වස්, උභයරාශිවංශයට හෙවත් උභයපක්ෂයෙහි ජනයන්ට; සියකවිලකුණින්, ස්වකීය (භාෂාමයවූ) කාව්‍යලක්ෂණයෙන්; එක්දෙස් කියමි, එකදෙශයක් කථනයකෙරෙමි.

4\. මෙහි වියත් අවියත්—සියල් වදනුත්ම පහන්,
ගුණෙන් පවති සවාරෙන්—තෙමෙ ලෝයා පවත්මින්.

4\. මෙහි, මේ ලොකයෙහි; වියත්, ව්‍යක්තවූද; අවියත්, අව්‍යක්තවූද; සියල් වදනුත්ම, සමස්ත වචනයන්ගේම; පහන්ගුණෙන්, ප්‍රසාදගුණයෙන්; සවාරෙන්, සර්වාකාරයෙන්; ලෝයාතෙමෙ, ලොකයාත්‍රා තෙමේ; පවත්මින්, ප්‍රවෘත්තවෙමින්; පවති, පවත්නේය.

5 මෙ තුන්ලෝ සියල්—ඉදි සද වැටුප්රැස් රැස්,
නොදිලියෙතදබැව්ද—තමකදනො කල්හායෙන්.

5\. ඉදි, ඉදින්; සද, ශබ්දසඞ්ඛ්‍යාතවූ; වැටුප්රැස් රැස්, ප්‍රදීපරශ්මි රාශිය; නොදිලියෙත්, අජ්වලිතවී නම්; මෙ සියල් තුන්ලෝ, මේ සකල

ත්‍රෛලොක්‍යය; කල්තායෙන්, යුගප්‍රමාණයෙන්; අඳබැව්දු, අන්ධභාව දැයකවූ; තමකඳනො, තමඃ ස්කන්ධයෙක්මැනො.

6. පෙර මහරු මහරජ—යසපිළිබිඹු ගොස් බස්,
කැටතෙලෙහි සිටුනෙ පෙණේ—පිළි ඔවුන නට කල්හිදු.

6. පෙර, පූර්වයෙහි; මහරු, මහාර්ඝවූ; මහරජ, මහාරාජයන්ගේ; යස පිළිබිඹු, යශස් සඞ්ඛ්‍යාත ප්‍රතිබිම්බය; ගොස්, ගොසින්; බස්කැටතෙලෙහි, වචනසඞ්ඛ්‍යාත දර්පණතලයෙහි; සිටුනෙ, තිෂ්ඨමානවූයේ; පිළි, නැවත; ඔවුන නට කල්හිදු, ඒ (පූර්ව) ක්ෂත්‍රියයන් නෂ්ටකාලයෙහිදු; පෙණේ, දෘශ්‍යමානවේ.

7. ගව්හන වේ පසස්—නදු බස් කරු සකස්,
පියසුවහට අන්හට—ගවබැව්ම හුදු සාදු.

7. බස්, වාණීතොම; සකස්කරු, සුශබ්දකොට; පියසුවහට, ප්‍රකාශ කළාහට; පසස්නදු, ප්‍රශස්තදෘයකවූ; ගව්හන වේ, ධේනුවක් වේ හෙවත් අභිමතාර්ථදායකවූ සුරභිධේනුවක් වන්නීය; අන්හට, අන්‍යයා හට හෙවත් (අපශබ්ද මිශ්‍රනෙයින්) අපවිත්‍රකොට ප්‍රකාශකරණ්නුවහට; හුදු ගවබැව්ම සාදු, කෙවලගොත්වයම සාදු.

8. එබව්නි කව්හි මද—දොසුදු සොයන්නට වත්,
තුනු එක් ලපෙක්නි සියල්—සිරිහුන්වෙ සොඳුරුදු වූ.

8. එබව්නි, එසේ බැවින්; කව්හි, කාව්‍යයෙහි; මද දොසුදු, ස්වල්ප දෝෂයක්ද; සොයන්නට වත්, අන්වේෂණයකරන්නට යුත්තේය හෙවත් පරීක්ෂාකටයුත්තේය; (ඒ එසේමැයි) සොඳුරුදු වූ, සුන්දර වූද; සියල් තුනු, සමස්ත ශරීරය; එක් ලපෙක්නි, එක් කලඞ්කයෙකින් හෙවත් එක් කුෂ්ඨයෙකින්; සිරිහුන්වෙ, ශ්‍රීශූන්‍යවේ.

9. ගුණදොස් කෙසේ ගත්- නොදන්නා දෙනෙ කෙරෙ තොර,
කිම අඳහට ඇත සබඳ—රුබේ දස්නෙහි සියල්.

9. ගත් නොදන්නා දෙනෙ, ශාස්ත්‍ර නොදන්නාවූ ජනතෙමේ; ගුණ දොස්, ගුණ දෝෂ දෙක; කෙසේ තොරකෙරෙ, කවර පරිද්දෙකින් විභාගකරන්නේද; කිම, (ඒ) කිමෙක්ද; අඳහට, අන්ධයාහට; සියල් රුබේ දස්නෙහි, සකල රූපභෙද දර්ශනයෙහි; සබඳ ඇත, සම්බන්ධයෙක්නම් ඇද්ද. (නීල පීතාදි වර්ණභෙද නොදක්නේමැයි සේයි.)

10. එම්නෙයිනි සත්ලෝ—වියත්කරණ පවස් ධුත්,
පෙර පඬුවො බඳහු ලකුණු—විසිතුරු මග වදනුනට.

10. එමනෙයිනි, ඒ කාරණයෙන්; සත්ලෝ, සත්වලොකයා; වියත් කරණ පවස් ධුත්, ව්‍යාකරණ ප්‍රෙච්ඡායෙන් යුක්තවූ; පෙර පඬුවො, පූර්ව පණ්ඩිතවරනු; විසිතුරු මග, විචිත්‍ර මාර්ග ඇති; වදනුනට, වචන යන්ට; ලකුණු, ලක්ෂණ; බඳනු, රචනාකළෝ.

**11.** ඔවුන් විසින් පැණි ති—කව් සිරුරුත් ලකරුත්,
කැමැතිය අත් දක්වූ—වදන් පබඳෙහි සිරුරු

**11.** ඔවුන් විසින්, ඒ ලක්ෂණ කර්තෘන් විසින්; කව්සිරුරුත්, කාව්‍යශරීරත්; ලකරුත්, අලඞ්කාරත්; පැණිති, නිදර්ශිතයි; එහි, ඒ ශරීරාලඞ්කාර දෙක්හි; කැමැතිය අත් දක්වූ, අභිප්‍රේතාර්ථ ප්‍රකාශකලාවූ; වදන් පබඳ, වචන ප්‍රබන්ධ; සිරුරු, ශරීරයි.

**12.** ඒ හුදුපෙදෙන් වේ—සියල් වදන් පබඳිනුදු
එදෙක්හි යුත් පියොවිනුදු—පිළි එහි තුන් වෙතියර.

**12.** ඒ, ඒ කාව්‍යශරීරයතෙම; හුදුපෙදෙන් වේ, කෙවල පද්‍යයෙන්ද වෙයි; සියල් වදන් පබඳිනුදු, සකල වචනප්‍රබන්ධයෙනුදු වෙයි; පිළි, නැවත; එදෙක්හි යුත් පියොවිනුදු, ඒ පද්‍ය ගද්‍ය මිශ්‍රවූ ප්‍රයොගයෙනුදු වෙයි; මෙ, මේතෙම; එහි තුන් නියර, එහි ත්‍රිවිධාකාරයයි.

**13.** වනු මැනවි සියබසී—නේකව් බඳ සිරිදු යම්,
වදන් පබදෙක්ද කියූ—පෙදෙන් විසිතුරු සපු යී.

**13.** සපු යී කියූ, චම්පූයයි කීවාවූ; පෙදෙන් විසිතුරු, පද්‍යයෙන් විචිත්‍රවූ; යම් වදන් පබදෙක්ද, යම් වචනප්‍රබන්ධයෙක් ඇද්ද; ඒ කව්බඳ සිරිදු, ඒ කාව්‍යබන්ධනශ්‍රීයද; සියබසින් වනු මැනවි, ස්වකීයවූ සිංහල භාෂාවෙන් වනු මැනවි.

**14.** සඟාතදු කොස මුත්—ඇළ කුලකත් සගෙනි,
පළවනුයෙනෙපද විතර—පෙර ඇදුරෝද නොකියත්.

**14.** සඟාතදු, සඞ්ඝාතද; කොස, කොෂද; මුත්, මුක්තකද; සළ, නැවත; කුලකත්, කුලකද; සගෙහි පළවනුයෙන්, සර්ගබන්ධනයෙහි ප්‍රකටවන හෙයින්; එ පද විතර, ඒ පද්‍ය විස්තරය; පෙර ඇදුරෝද, පූර්වාචාර්යවරයෝද; නො කියත්, කථනය නොකෙරෙත්.

මෙහි—සඞ්ඝාතනම්, සන්ධ්‍යාවර්ණනාදිවූ එක් භිත්තියක් අශ්‍රය කොට වෙන වෙන ක්‍රියානිෂ්ඨා ඇති බොහෝ කවිහුයි; කොෂනම්, නොයෙක් භිත්ති අශ්‍රයකොට ක්‍රියානිෂ්ඨා කීපයක් ඇති කවිහුයි; මුක්තකනම්, වෙන වෙනම ක්‍රියානිෂ්ඨා ඇති අන්‍යොන්‍ය සම්බන්ධ නිරපෙක්ෂවූ කවිහුයි; කුලකනම්, වෙනවෙන ක්‍රියානිෂ්ඨා නැති එක් ක්‍රියාවක් අපෙක්ෂාකරණ හෙයින් එකසම්බන්ධව සිටි කවිහුයි.

**15.** කලාගුරු සුලුපා—වැසිවූ කුළුණු නුවණ යුත්,
කලණමිතෙව්යතුන්—ගත්හි පියුම් ලකුණු ඈ.

**15.** කලාගුරු සුලුපා වැසිවූ, (අභයගිරි විහාරයෙහි) කාලාගුරු නම් සුලුපායෙහි විසුවාවූ; කුළුණු නුවණ යුත්, කරුණා ප්‍රඥාවෙන් යුක්තවූ; කලණමිත්, කල්‍යාණමිත්‍ර නම්වූ; එව්යතුන් ගත්හි, ඒ ව්‍යක්තයන්ගේ ශාස්ත්‍රයෙහි; පියුම් ලකුණු ඈ, පද්මාදි දෙවපානී අමසතුන්ගේ ලක්ෂණයි:—

16. පිදුම් ගි දෙ සතරව—දෙලොස් සොළොස් පදනම්,
සැහැලි ඇහැලිදු නම් ඇත්—පිළි උපහැලි බැහැලි නම්.

16. පිදුම, පිදුම්; ගි, ගිය; දෙ, ද්විපාදය; සතර, චතුෂ්පාදය; අට, අෂ්ටපාදය; දෙලොස්, ද්වාදශපාදය; සොළොස්පද නම්, ශොඩශපාද නම්වූද; ඇත්, (බන්ධන) ඇත; සැහැලි, සැහැලිය; ඇහැලිදු නම්, ඇහැලි නම් වූද (බන්ධනයෙක් ඇත), පිළි, නැවත; උපහැලි, උප හැලිය; බැහැලි නම්, බැහැලි නම් වූද (බන්ධනයෙක් ඇති).

17. අඹහැලි නමැත් දූයෙක්—පිළි පිහියොඹ නම් ඇත්,
සිතිලිගි නම් යමෙකැත්—උතුසඳ වසම්සඳ නම්.

17. අඹහැලි නම් දූයෙක් ඇත්, අඹහැලි නම් ජාතියෙක්ද ඇත; පිළි, නැවත; පිහියොඹ නම් ඇත්, පිහියොඹ නම් බැඳුමෙකුදු ඇත; සිතිගිලි නම් යමෙකැත්, සිත්ලිගිය යන යම්කිසි බන්ධනයෙකුදු ඇත; උතුසඳ, ඍතුජඤ්ස නම් වූද; වසම්සඳ නම්, විෂම ඡඤ්ස නම් වූද (බන්ධන ඇත).

18. යළ ගලසඳ නමැත්—සුත්ගිස් යත්නෙකුදු ඇත්,
දෙව්පානි නමුදු ඇත්—පදබැඳුමෙහි නියර මේ.

18. යළ, නැවත; ගලසඳ නම් ඇත්, ගලච්ඡඤ්ස නම් බන්ධනයෙකුදු ඇත; සුත්ගිස් යත්නෙකුදු ඇත්, ශිරශ්ශීත්‍ර නම්වූ බන්ධනයෙකුදු ඇත; දෙව්පානි නමුදු ඇත්, දෙවපාන් නම් බන්ධනයෙකුදු ඇත; පදබැඳුමෙහි, පද්‍යබන්ධනයෙහි; මේ නියර, මේ ප්‍රකාරයි.

19. ගැඹුරු කව් සයුරු—වැදමේ බද සිතැත්නට,
ගේ නැව් වේ පියවහන්—විසිත් ලකර මිණිරුවන්.

19. ගැඹුරු, ගම්භිරවූ; කව්සයුරු, කාව්‍යසඞ්ඛ්‍යාත සාගරයට; වැද මේ, ප්‍රවේශයෙහි; බද සිතැත්නට, බඩවූ චිත්ත ඇත්තානට; ගේ, ඒ සියබස්තෙම; පියවහන්, ප්‍රියවාහනවූ; නැව් වේ, නෞකා වන්නේය; විසිත්ලකර, විචිත්‍රාලඞ්කාරනම්; මිණිරුවන්, (ඒ නෞකාවෙහි) මාණික්‍යරත්නයි.

20. පෙදෙන් බුදුසිරිතැ—බසින් වත් සිරිත් ඈ,
පද යුතු බසින් නළු ඈ—අනතුරු ලකුණු දක්වම්.*

20. පෙදෙන්, පද්‍යයෙන්; බුදුසිරිත් ඈ, බුද්ධචරිතාදිය වින්නේය; බසින්, කාව්‍ය වචනයෙන්; වත සිරිත් ඈ, ව්‍රතචාරිත්‍රාදිය වින්නේය; පදයුතු බසින්, පද්‍යයෙන් යුක්තවූ වචනයෙන්; නළු ඈ, නාටකාදිය වින්නේය; අනතුරු, ඉක්බිත්තෙන්; ලකුණු දක්වම්, ලක්‍ෂණ ප්‍රකාශ කරමි.

21. සග සියෝ මහකව්—කිමෙහි ලකුණු වියත්වත්,
වත් නිදෙස ඇසි හෝ—නම්කර පෙර පෙරව වේ,

21. සග සියෝ, සර්ග සහිත වූයේ; මහකව්, මහාකාව්‍ය නම් වේ;

* වත්වම්; වත්තෙම්; සමගර.

එහි ලකුණු, ඒ මහාකාව්‍යයෙහි ලක්‍ෂණ; කිම වියත්වත්, කිමෙක්ද යතහොත්; වත්තිදෙස, වස්තුනිර්දේශය (හෝ), ඇසි හෝ, ආශිර්වාදය හෝ; නමකර හෝ, නමස්කාරය හෝ; පෙරට වේ, ප්‍රථම වේ. මේ තුණෙහි විධාන කාව්‍යාදර්ශන්තයෙන් දතයුතු.

22. හෙ වී මෙසේ යන—පුවතෙයිනන් පුවත් හෝ,
සිවුවනපල සබඳව—උලාර නා සියෝ වේ.

22. හෙ, ඒ කාව්‍යයතෙම; මෙසේ වී යන පුවත්, මෙසේ වීය යන ප්‍රවෘත්තියෙක් හෝ වෙයි හෙවත් ඉතිහාස කථාවෙක් හෝ වෙයි; එයින් අන් පුවත් හෝ, ඒ පුරාණ කථාවෙන් අන්‍යවූ (කවි නිර්මිතවූ හෝ වර්තමානවූ හෝ) ප්‍රවෘත්තියෙක් වෙයි; සිවුවග පල සබඳව, (අර්ථ; ධර්ම; කාම; මොක්‍ෂ යන) චතුර්වර්ග ඵල සම්බන්ධව; උලාරනා සියෝ වේ; උදාරවූ කථානායකයා විසින් යුක්තවේ.

මෙහි—අර්ථනම්, දිග්විජය දුෂ්ටනිග්‍රහාදියෙන් වික්‍රමයටද නීති ශාස්ත්‍රයටද අවිරුද්ධකොට පැමිණි වස්තුවයි; ධර්මනම්, යාග තපස්වී පූජාදීන් කරණ කුශලධර්මයයි; කාමනම්, විවාහ සම්භොග උද්‍යාන ක්‍රීඩා ජලක්‍රීඩාදීන් වර්ණනීයවූ පඤ්චකාමයයි; මොක්‍ෂනම්, තපො ධ්‍යානාදීන් පැමිණියයුතු නිර්වාණයයි. මේ චතුර්වර්ගඵල නම් වේ.

23. නුවර සයුරු ගිරි සූ—සිසි හිරු උදා, වැන්මෙන්,
උයන් දලකිඩුනි මහත්—අවන් මනදෙළ කෙළියෙන්.

23. නුවර, නගරය; සයුරු, සාගරය; ගිරි, පර්වතය; සූ, ඍතුය; සිසි හිරු උදා, චන්ද්‍රොදය සූර්යොදය (යන) මොවුන්ගේ; වැන්මෙන්, වර්ණනාකිරීමෙන්ද; මහත්, මහත්වූ; උයන් දලකිඩුනි, උද්‍යානක්‍රීඩා ජලක්‍රීඩායෙන්ද; අවින් මනදෙළ කෙළියෙන්, ආසවපාන ක්‍රීඩා මනොරථ ක්‍රීඩා යන මෙයින්ද.

24. පෙළඹුම් විවා ගැණුම්—කුමරු නුපැත් වැඩමෙන්,
මතුරුදු දූගමන් යුද—උලාර නා උදෙනිදු.

24. පෙළඹුම්, විප්‍රලම්භය; විවාගැණුම්, විවාහග්‍රහණය; කුමරුනුපැත්, කුමාරයන්ගේ උත්පත්තිය; වැඩමෙන්, වර්ධනය යන මෙයින්ද; මතුරුදු, මන්ත්‍රද; දූ, දූතයන්ගේ; ගමන්, ප්‍රයාණද; යුද, යුධද; උලාර නා උදෙනිදු, උදාරවූ කථානායකයාගේ උදය හෙවත් ජය යන මෙයින්ද.

25. ලකුළු කව්රසබැවි—නතුරු නුවුත් නොවිතර,
සගින් යුත් සවන් ගත්—සුසද පිළි නොදමදවූ.

25. ලකුළු, අලඞ්කෘතවූ; රසබැවින්, රසභාවයෙන්; අතුරු නුමුත්, නිරන්තරවූ; නොවිතර, අවිස්තීර්ණවූ හෙවත් මහත් නුවූ; පිළි, නැවත; නොදමදවූ, ස්වල්පද නුවූ; සුසද, මනාවූ සන්ධි ඇති; සවන් ගත්, ශ්‍රවණීයවූ; සගින් යුත්, සර්ගයෙන් යුක්තවූ; කව්, කාව්‍යය තෙම:—

26. ලෝ මන රදනෙ කිවි—කරු දනන් පලදනේ,
තහවුරුව සිටිනෙ දෙනේ—විසිතුරු ලකර ලගනේ.

26. ලෝ මනරදනෙ, ලෝකයාගේ මනොරඤ්ජනය කරන්නේ; කිවිකරුදනන්, කාව්‍යකාරක ජනයාට; පලදනේ, ප්‍රසාධන වූයේ; විසිතුරු ලකර ලගනේ, විචිත්‍රාලඞ්කාර ලක්‍ෂණීය වූයේ හෙවත් පෙණෙන ස්වභාවාඛ්‍යානාදි අලඞ්කාර ඇත්තේ; තහවුරුව සිටිනෙ, (දීර්ඝ කාලයක්) ස්ථාවරව පවත්නේ; දෙනේ, ජයගන්නේයි. මේ සතරකව කුලක නම්. මෙහි රසනම්:—

ශෘඞ්ගාරහාස්‍ය කරුණා—රෞද්‍ර වීර භයානකාඃ,
බීභත්සාද්භූත ඉත්‍යෂ්ටෞ—මන්‍යන්තෙ මුනී නාරදාඃ.

යන මේ අටයි. භාවනම්:—

රතිර්හාසශ්ච ශොකශ්ච—ක්‍රොධොත්සාහෞ භයං තථා,
ජුගුප්සා විස්මයශ්චාෂ්ටෞ—ස්ථායිභාවා ඉමෙ මතාඃ-යනාමේ අටයි.

27. උනුදු හොත් අගකිනි—මෙහි කව් සව්සිරි බෙජේ,
කිපූ තන්හි රසවෙසෙස්—සනහා නමේ දන්නන්.

27. කිපු තන්හි, (පුරවණ්ණනාදීන් අතුරෙන්) කිපාවූ ස්ථානයෙහි; රසවෙසෙස්, රසවිශෙෂය, එ දන්නන්, ඒ කාව්‍ය දන්නවුන්; සනහා නම්, පිණනය කෙරේනම්; මෙහි, මේ පුරවණ්ණනායෙහි, අඟකිනි ඌනු දුහොත්, යම් කිසි අඞ්ගයකින් ඌනවූවහොත්ද; කව්, කාව්‍යයතෙමේ; සව්සිරි බෙජේ, සර්වෛශ්වර්‍ය්‍යය භජනයකෙරේ. සමහර වණ්ණනාවක් නැතද, කී වණ්ණනා ශාස්ත්‍ර දන්නවුන් සිත් ගණ්නම්, දොෂ නැතැයි යතු භාවිසි.

28. කිවිබැවිනත් කලඟ—නිදොස් පිණැතියානට,
කැමැතිය අත් සිදුහි—උවනම් නොමවේද කවර.

28. කිවිබැවින්, කවිභාවයෙන් හෙවත් කවිහුගේ අභිප්‍රායෙන්; කල අන්අඟ, කරණලද අතික් අඞ්ගයෙක්ද; නිදොස්, නිර්දොෂයි; (ඒ එසේ මැයි;) පිණැතියානට, පුණ්‍යවන්තයන්ට; කැමැතියඅත් සිදුහි, අභිමතාර්ථ සිඬකිරිමෙහි; කවර, කවරෙක්; උවනම් නොමවෙද, උපාය නම් නොවේද. මෙහි නොකී රාජවණ්ණනාදි යම්කිසි අඞ්ගයක් කවිහු තමාගේ අභිප්‍රායෙන් කිවද දොෂ නැත; පිණැතියන්ගේ අභිලාෂ සිඬියට කාරණා නොවන්නේනම් කිමෙක්ද?

29. ගුණහෙයිති දක්වා—පෙර නාවා ඔහු විසින්,
රුපුඹුලු මැඩම කියත්—පියවි සොඳුරු මග මේ.

29. පෙර, ප්‍රථමයෙහි; නාවා, නායකයා; ගුණහෙසිති දක්වා, වංශාදි ගුණහෙසීන් දක්වා; ඔහු විසින්, ඒ කථානායකයා විසින්, රුපුම්බුලු මැඩම, ශත්‍රුමණ්ඩල මර්දනය; කියත්, කියත්නොත්; මේ පියවි සොඳුරු මග, මෙ ප්‍රකෘතිසුන්දර මාර්ගයයි. (ස්වභාවයෙන් යහපතැයි සෙස.)

30. වස් වැර සුරු ගතැ—වණා සතුරු රජුනුදු,
දිනීමෙන් ඔවුනිසුරද—කියත්නු මන ගණී තමා.

30. සතුරුරජුනුද, ශත්‍රුරාජයන්ගේද; වස්, වංශය; වැර, වීර්‍ය්‍යය; සුරු, ශෞර්‍ය්‍යය; ගත් ඇ, ශාස්ත්‍රය යනාදිය; වණා, වර්ණනාකොට; ඔවුන් දිනීමෙන්, ඒ ශත්‍රූන් ජයගැන්මෙන්; ඉසුරද, නායකයාගේ ඓශ්වර්‍ය්‍යයද; කියත්නු, කථනයකරත්ම; තමා මන ගණී, තමාගේ සිත් ගණී; (අප ලගණීයයි සේයි).

31. මටසිලුටු පහන්—සම්බැව් මිහුරු සුකුමර,
අරුත්පළ උලාරෙද—දනකල් සමාදි මෙසේ.

31. මටසිලුටු, සුශ්ලිෂ්ටබවය; පහන්, ප්‍රසන්නබවය; සම්බැව්, සමත්වයය; මිහුරු, මාධුර්‍ය්‍යය; සුකුමර, සුකුමාරත්වය; අරුත්පළ, අර්ථව්‍යක්තිය; උලර, උදාරබවය; ඔද, ඔජසය; දනකල්, ජනකාන්තය; සමාදි, සමාධිය (යන), මෙසේ, මේ ආකාරයෙන්:—

32. දස පමණ කිවිකමැ—පණලකර වේ පත්හිස්,
මෙයින් රුවන් දිවිහි—දනනට යුත් කියත් පත්.

32. කිවිකමැ, කවිකර්මයෙහි; පණ දසපමණ, ප්‍රාණයතෙමේ දශ ප්‍රමාණවන්නේය; ලකර පත්තිස්වේ, අලඞ්කාර පත්තිසෙක්වන්නේය; මෙයින්, මේ ප්‍රාණාලඞ්කාරයෙන්; කියත්, කථනයකෙරෙත්; රුවන් දිව්හි, රත්නද්වීපයෙහි, දනනට, ජනයන්ට; යුත්පත්, යුක්තප්‍රාප්තයි.

මේ දශප්‍රාණයෙන් අල්පප්‍රාණාක්ෂරයෙන් මතු කරණලද්දේ සුශ්ලිෂ්ට නම් නොවෙයි; එහෙයින් මහාප්‍රාණාක්ෂරත් මිශ්‍රකළ කල සුශ්ලිෂ්ට ගුණය ඇත්තේනම් වන්නේය; එබඳු තන් හෙලුයෙහි* මුත් කාව්‍ය දියෙහි නොලැබෙන්නේය; සුශ්ලිෂ්ට ගුණයෙහි ලක්‍ෂණ නොකියා ප්‍රසාදගුණ කියත්.

33. පහන්නම් පළුවත්—සුදනිය බස් හෙ මෙසේ,
සිසිහු සසලේ පුල් නිල්—මහනෙල් කැලුම් ලගනේ.

33. පහන්නම්, ප්‍රසාදනම්; පළවත්, ප්‍රකටවූ අර්ථ ඇති; සුදනිය බස්, සුවිඥෙයවූ වචනයි; හෙ මෙසේ, ඒ ප්‍රසන්නය මෙසේයි; සිසිහු, ශශාඞ්කයාගේ; සසලේ, ශශලෙඛාතොම; පුල් නිල් මහනෙල්කැලුම්, ඵුල්ලනීලොත්පලයට බදු කාන්ති ඇත්තේ; ලගනේ, හොබනේයි නොහොත් පෙණෙන්නේයි. **මේ සෙවදහි ඊතියි.**

34. පළටුදු මෙ අත් මෙසේ—නොඉස්නෝ ඉස්හි මෙසේ;
නුසුදු සුලුසුල සුරක්—පළ අක් සේරුස් දිසේ.

34. මෙ අත්, මේ අර්ථය; මෙසේ පළටුදු, මෙසේ ප්‍රකටවූවද; නොඉස්නෝ, නොකැමැත්තෝ; මෙසේ ඉස්හි, මෙසේ කැමතිමෙත්; සේරුස්, ශෛතරශ්මිතෙම හෙවත් චන්ද්‍රතෙම; නුසුදු, අශ්වෙතවූ;

* මිශ්‍රාත්මක ගද්‍යයෙහි යන අදහසයි.

පුලුදුල, උපලෝත්පලයක් හා හෙවත් ප්‍රබුද්ධෝත්පලයක් හා; සුරක්, සඳුශවූයේ; පල, ව්‍යක්තවූ; අක්, අඩක ඇත්තේ හෙවත් ශශලාඤ්ඡන ඇත්තේ; දිසේ, දෘශ්‍යයි. **මේ ගෞඩීය රීතියි.**

මෙහි—ප්‍රකාශාර්ථ කල ප්‍රසන්නයයි ආදි කිලෙස බැඳීම වෛදර්භී රීතියි; එසේ නොව ප්‍රෞඪාර්ථ කල යහපතැයි කියා පසුව කිලෙස බැඳීම ගෞඩීය රීතියි; මත්තෙහිදු මෙසේමයයි දතයුතු. **මේ ප්‍රසන්නප්‍රාණයි.**

ඉක්බිති සමප්‍රාණනම් අල්පප්‍රාණ මහාප්‍රාණයන් නිසා විෂමකොට දුටමනා දෙයක් හෙයින්ද, මෙහි මහාප්‍රාණ නැතිහෙයින්ද; සම ප්‍රාණය හැමවිටම ලබාතුයි, ඒ හැර මාධුර්‍ය්‍යප්‍රාණ කියත්.

35. මියුරුනම රෙසෙන්—රසවත් සදත්හිඳු මත්,
යමෙක්නි වෙද වියත්—දෙනෙ මියෙනෙව් බිඟුමුළු.

35. යමෙක්නි, යම් ගුණයෙකින්; වියත් දෙනෙ, ව්‍යක්ත ජන තෙමේ; මියෙන්, මධුයෙන්; බිඟුමුළු එව්, භෘඞ්ගසමූහයා මෙන්; මත් වෙද, මත්තවේද; සද, ශබ්දයෙහිද; අත්හිඳු, අර්ථයෙහිද; රෙසෙන්, රසයෙන්; රසවත්, රසවත්වූ (ඒ ප්‍රාණයතෙම); මියුරුනම, මධුර නම්වේ.

36. ඉතා නුදුරු සම—වණ එක්නි දෙක්නිඳු හොත්,
ලකුළු රස මෙමෙනි යෙත්—වදන් රස දත්නො මෙසේ.

36. ඉතා නුදුරු, අති දූරනුවූ; සම, සදෘශවූ; වණ, වර්ණයන්; එක්නි දෙක්නිදු, එකින් දෙකිනුදු; ලකුළුහොත්, අලඞ්කෘත වුව හොත්; වදන් රස දත්නො, වචනරස දත්තෝ; රස මෙමෙනි යෙත්, රස වහනය කෙරෙතියි කියත්; මෙසේ, (ඒ අනුප්‍රාසයෙන්) මධුර තාව මෙසේයි.

37. මෙරද දෙරණිසුරු—ලදද යම් කල් විප්කල්,
එකල් සිමින් ලෙව්හි—පැවැත් දහම්සුරු මහත්.

37. විප්කල්, බ්‍රාහ්මණප්‍රියවූ; මෙරද, මේ රජතෙමේ; යම් කල්, යම් කාලයෙක්හි; දෙරණිසුරු ලදද, ධරණීයෙහි ඓශ්වර්‍ය්‍ය ලදද; එකල් සිමින්, ඒ කාලයෙහි පටන්; ලෙව්හි, ලෝකයෙහි; මහත් දහම්සුරු, උදාරවූ ධර්මෛශ්වර්‍ය්‍යය; පැවැත්, ප්‍රවෘත්තවී. මෙහි—දකාර ලකාරා දීන්ගේ නැවත නැවත දක්මෙන් අනුප්‍රාසරස මාධුර්‍ය්‍යය දතයුතු.

38. ඉසිත් මෙසේ සද—රස නුදුරකුරෙනි දුනු,
නොඉස්නි කල්බද වත්—පියුමෙක්දුයි උළිඳු වී.

38. මෙසේ, මේ ආකාරයෙන්; නුදුරකුරෙනි, අදූරාක්ෂරයෙන්; දුනු, ජනිතවූ; සදරස, ශබ්දයෙහි රසය; ඉසිත්, කැමතිවෙත්; උළිඳු, චන්ද්‍ර තෙම; කල්බද, කාන්තාදෙහ ඇත්තියගේ; වත්පියුම්, වක්ත්‍ර පද්මයහා; එක්දුයි වී, එකාකාරයයි කියා; නොඉස්නි, නොකැමති වෙත්.

මේ පද්‍යබන්ධනයෙහි "කල්බඳ" යයි කී තැන ලකාර දකාර "ළළිඳු" යයි කියා අන්තයෙහි පැණුනා සේ, මධ්‍යයෙහි බොහෝ අක්ෂරයන් විසින් ව්‍යවධාන කල අනුප්‍රාස නොකැමැත්තාහයි සේයි.

39. තහවුරු හැම ලකර—අරුතෙහි රස මමාවා,
ඉතිඳු අගම් සියෝ බැව්—වහා එ හැම බොහෝසේ.

39. තහවුරු, ඒකාන්තයෙන්; හැම ලකර, සර්වාලඞ්කාර; අරුතෙහි, අර්ථයෙහි; රස මමාවා, රසවහනය කෙරේවා; ඉතිඳු, එතකුදු වුවත්; අගම් සියෝ බැව්, අග්‍රාම්‍යත්වයෙන් යුක්ත බව; ඒ හැම, ඒ සියලු රස යම්; බොහෝසේ, බහුප්‍රකාරයෙන්; වහා, වහනය කෙරේ හෙවත් උපලා.

40. කුළුණු වියො වියොවග—සොර වෙසෙසින් මා දෙසේ,
මියුලැස තියට නොඑසේ—වියත් මෙ අත් රස මේමේ.

40. මියුලැස, මෘගාක්ෂිය; වියොවග සොර, අනඞ්ගචෝරතෙම; වෙසෙසින්, විශේෂයෙන්; මා දෙසේ, මා දිශායෙහි; කුරුණු වියො, කරුණාවියුක්තය හෙවත් නිෂ්කරුණය; තියට නොඑසේ, තිට එසේ නොවන්නේය (එහෙයින් තිට ශරප්‍රහාර නොකරන්නේයයි); වියත්, කියත් හොත්; මෙ අත්, මේ අර්ථය; රස මෙමේ, රස වහනය කෙරේ.

41. කැමැතිය ම මනකත්—කෙසේ නොඉස්නී වියත්,
මේ ගම්වැසි වදනරුත්—රසහුන්බවටම වැටේ.

41. කත්, කාන්තාව; කැමැතිය මන, කැමැත්තාවූ සිත් ඇති; ම, මා; කෙසේ නොඉස්නී වියත්, කවර පරිද්දෙකින් නොකැමැත්තේදැයි කියත්හොත්; මේ ගම්වැසි වදනරුත්, මේ ග්‍රාම්‍ය වචනාර්ථයතෙම; රසහුන්බවටම වැටේ, රසහීනබවටම වැටෙන්නේය.

42. දුවදන් පදසදෙහි—වදන් පබඳනෙහිදු වූ,
සොයන්න සේ කිවිනෙයට—පවුත් නොයුත් නිදසුන්.

42. සේ කිවින්, ඡේකවූ කවීනි; පදසඳෙහි, පදයන් දෙදෙනෙකුගේ සන්ධියෙහිද; වදන් පබඳතෙහිදු වූ, වචනප්‍රබන්ධාර්ථයෙහිද වූ; දුවදන්, දුර්වචනයන්; සොයන්න, අන්වේෂණයකොට හරණු; එයට නිදසුන්, ඒ ග්‍රාම්‍යවචනයට නිදර්ශන; පවුත් නොයුත්, දක්වත් නුසුදුසුසි.

වෙන වෙන සිටි පදවයෙක සන්ධි එක්වූ තැන දෙකින් මුසුව අසභ්‍ය වචනයක් හැඟේනම්ද, යහපත්වූ අර්ථයක් ප්‍රකාශකරන්නාවූ අසභ්‍ය වචනයක් ඇත්නම්ද, එසේවූ බස් ප්‍රබන්ධයෙන් හැර සුඩකටයුතුය යනු භාවයි.

43. එවන් පෙර පියොවක්—දුටද නොහැරබෙත් වත්,
දිවවදනෙව් යත් යත්—පෙරළේදනො සියවදන්.

43. එවන්, එවැනිවූ ( හෙවත් වර්තමානකාලයෙහි අසභ්‍යවචන ස්වරූපවූ ); පෙර පියොවක් දුටද, පූර්වකවීන්ගේ ප්‍රයොගයක් දුටද;

නොහැරෙබත් වත්, නොහැරෙබත්නව සුදුසුයි; දිවමදනෙව්, දිවා භාෂා (නම්වූ සංස්කෘතය) මෙන්; සියවදන්, ස්වභාෂාතොමෝ හෙවත් සිංහලභාෂාතොමෝ; යත් යත්, කාලාතික්‍රාන්ත වත් වත්; නොපෙරළේද, පරිවර්තනය නොවේද; (පෙරළි අතික් ලෙසක් වේමැයි). මධුරප්‍රාණයි. සුකුමාර ප්‍රාණනම්, මහාප්‍රාණ අකුරු බොහෝ නුවුව මනා ගුණයක් හෙයින්, හෙවත් අල්පප්‍රාණම හෙයින්; ඒ හැර ඉතර ප්‍රාණයන් කියත්.

44. අරුත්පල නම් නොනෙ—බැවරුත් ගේ මෙගින් වෙන්,
සුරසුන් නා හුරිරු රත්—දලනිදුනි උපුලෙ පොළෝ.

44. අරුත්, අර්ථයාගේ; නොනෙබැව්, අනෙයත්වය හෙවත් කාරණය ශබ්දාර්ථයෙන් ප්‍රතීතබව; අරුත්පල නම්, අර්ථව්‍යක්ති නම්; ගේ මේගින්, ඒ මේ ආකාරයෙනි; වෙන්, විෂ්ණුතෙම; සුරසුන්, ඛුරයෙන් සුණුකරණලද; නා, නාගයන්ගේ; හුරිරු, රුධිරයෙන්; රත්, රක්තවූ; දලනිදුනි, ජලනිධියෙන්; පොළෝ උපුලෙ, පෘථිවිය උත්පාටනය කෙළේය. මෙහි—අනෙයත්වය නම්, කවීන්ද්‍රහු විසින් මේ බස මේ අභිප්‍රායෙන් කීමියි නොකියා ඇසූ විඥයන්ට අර්ථ ප්‍රතීතවන බවයි.

45. මී උපුලේ එමහ—හුරු රත් සයුරුනෙන් වී,
මෙනෙක් මත් දුවහොත්—උරිදු හුරිරට නේබැව්.

45. එ මහහුරු, ඒ මහා වරාහතෙම; රත් සයුරුනෙන්, රක්ත සාගරයෙන්; මී උපුලේ වී, පෘථිවිය උත්පාටනය කෙළේයයි කියා; මෙතෙක් මත් දුවහොත්, මෙපමණක් දුවහොත්; උරිඳු හුරිරට, උරගෙන්ද්‍ර රුධිරයට; නේබැව්, නෙයබවයි. මෙහි—විෂ්ණුවරාහයා රත්මුහුදින් පොළොව නැගියයි කී කල ඇසූවන්ට කෙසේ මුහුද රත්විද යනු නොයැහෙන හෙයින්, උහුගේ ඛුරයෙන් සුණුකළ නයින්ගේ ලෙයින් රත්වියයි ප්‍රතිපාදනයකොට හැකවිය යුතුය; මෙසේවූ නෙයබන්ධනය නොබැන්ද යුතු. විෂ්ණු වරාහවිලාසයකින් ශ්‍රීකාන්තාව නිසා මුහුදු වැද නාගයන් වනසා පොළොව නැගිය යනු සිද්ධාන්තයි.

46. බැඳුම්හි මේ නියර—බුහුමන් නැත් මගදනා,
නොහගවන තම අරුත්—වදනියර* ඇත්ද කවර.

46. මේ නියර, මේ ප්‍රකාරවූ; බැඳුම්හි, බන්ධනයෙහි; මගදනා, මහාජනයාගේ; බුහුමන් නැත්, බහුමානයෙක් නැත හෙවත් ආදර නැත; තම අරුත් නොහඟවන, තමාගේ අර්ථ ප්‍රකාශ නොකරන්නාවූ; කවර වදනියර, කවරනම් වාග්රීතියෙක්; ඇත්ද, ඇත්තේද. අර්ථව්‍යක්ති ප්‍රාණයි.

47. වැජඹි ගුණ නේරුස්—හැගේද යම් දෙයක් වත්,
උලාරනමෙයිනි සියල්—කිව්මග වොරජනෙ මෙසේ.

47. යම් දෙයක් වත්, යමක් ප්‍රකාශකරත්ම; වැජඹි, විජෘම්භිතවූ;

* වදනිසිර—සමහර. සන්නයෙහි—වචනෙනාඥවයකියෙක්.

තේ ගුණරැස්, අනෙක ගුණරාශිය; හැනේද, දුනේද; උලාරනම්, (ඒ) උදාරනම; එසිති, ඒ ප්‍රාණයෙන්; සියල් කිඹිමන, සකලකම්මාගීය; වොරජනෙ, විරාජමානවන්නේය; මෙසේ, (ඒ උදාරප්‍රාණය) මේ ආකාරයි.

48. යදි කවණැස් කෙණෙක—හිනිනම් මෙ තා වත්නී,
එවණින් අතිසුරු මුහුණු—පිළි නොබලා මහකුළුණු.

48. මහකුළුණු, මහාකාරුණිකය; යදි, යාචකයන්ගේ; කවණැස්, කෘපණවූ දෘෂ්ටිය; කෙණෙක, ක්‍ෂණයෙක්හි; මෙ තා වත්හි, මේ තාගේ වක්ත්‍රයෙහි; හිනිනම්, පතිතවීනම්; එවණින්, ඒ සැටියෙන්; අන්ඉසුරු, අන්‍ය ඊශ්වරයන්ගේ හෙවත් සෙසු දනන්ගේ; මුහුණු, වක්ත්‍රයන්; පිළි, නැවත; නොබලා, නොබලන්නේය.

49. මෙ දෑගුණය මෙන්—නන් ගුණරැස්හි වෙසෙස්,
හැඟෙත්නොත් හඟුත් යුත්—උලාරසිරි සියෝබැව්.

49. මෙ දෑගුණය මෙන්, මේ දානගුණය පරිද්දෙන්; නන් ගුණරැස්හි, නානාගුණ රාශියෙහි; වෙසෙස්, විශේෂය; හැඟෙත්නොත්, ප්‍රකාශවත්හොත්; උලාරසිරි සියෝබැව්, උදාරනම් ප්‍රාණයාගේ ශ්‍රියෙන් යුක්ත බව; හඟුත් යුත්, සලකන්නට යුක්තයි.

50. මහගු වෙසෙසුන් යුත්—අත් කෙනෙකුලාර වියත්,
මෙසේ ගේ මිණිහිනුදම්—රුවන්වලා දිමුත් හර.

50. මහගු වෙසෙසුන්, මහාර්ඝවූ විශේෂණයෙන්; යුත්, යුක්තවූ; අත්, අර්ථය; කෙනෙක්, සමහර කෙනෙක් හෙවත් ගෞඩීයයෝ; උලාර වියත්, උදාරයයි කියත්; ගේ මෙසේ, ඒ මෙසේයි; මිණිහිනුදම්, මණි මෙඛලාදාමයයිද; රුවන්වලා, රත්නවලයයිද; දිමුත් හර, දීප්තිමත් මුක්තාහාරයයිද කියායි. මෙහි—මාහාර්ඝ විශේෂණනම්, මිණි යනුද; රුවන් යනුද; දිමුත් යනුද වේ. **උදාර ප්‍රාණයි.**

51. සමස්ති ලකළ වද—පබදෙහි ඔදපණ නම්,
පසසිත් කෙනෙක් එනියර, පදබැඳුමෙහිදු හෙ මෙසේ.

51. වදපබදෙහි, ගද්‍ය ප්‍රබන්ධයෙහි; සමස්ති ලකළ, සමාසයෙන් අලංකෘතවූව; ඔදපණනම්, ඔජඃ ප්‍රාණනම් වෙයි; කෙනෙක්, සමහර කෙනෙක්; පදබැඳුමෙහිද, පද්‍යබන්ධනයෙහිද; එනියර, ඒ ප්‍රකාරය; පසසිත්, ප්‍රශංසාකෙරෙත්; හෙ, ඒ (පද්‍යයෙහි වූ ඔජෝගුණය); මෙසේ, මේ ආකාරයි.

52. සුපුන් සරා සිසී—රස්කලඹෙව් සෙමෙර රජ,
දහසැඳිලි මුදුනෙ වී ලඹ—පලඹනෙහි න බජත් කග.

52. න පලඹනෙහි, තාගේ ප්‍රලම්බවූ හස්තයෙහි; කග, ඛඩ්ගය; බජත්, නොබනා කල්හි; සුපුන්, සම්පූර්ණවූ; සරා සිසී, ශරච්චන්ද්‍රයාගේ; රස්කලඹෙව්, රශ්මිකදම්බ වැනිවූ; ලඹ, ලම්බමානවූ; සෙමෙර, චාමර ඇති; රජ දහස්, ක්‍ෂත්‍රිය සහස්‍රයන්ගේ; ඇඳිලි, අඤ්ජලිතෙම;

මුදුනෙහි, මස්තකයෙහි පිහිටියේය. මෙහි—පූර්වාර්ධයෙහි හැම පදයන් සමාසව සිටිහෙයින් ඔජස්වී නම්. **ඔජස් ප්‍රාණයි.**

**53.** දනකල්නමික්මැනො—පැවතුම් ලොවි වටමෙන්,
හෙ වැත්තා වදනෙහි වේ-පිළි වැත්මෙහිදු හෙ මෙසේ.

**53.** ලොවි වටමෙන්, ලෞකික ප්‍රවෘත්තියෙන්; නොඉක්මැ පැවතුම්, අතික්‍රාන්තනොව පැවැත්ම; දනකල් නම්, ජනකාන්ත නම් (ප්‍රාණය) වෙයි; හෙ, ඒ කාන්තගුණයතෙම; වැත්තා වදනෙහි වේ, වාර්තා වචනයෙහි වන්නේය; පිළි, නැවත; වැත්මෙහිදු, වර්ණනා යෙහිදු (වන්නේය); හෙ මෙසේ, ඒ මෙසේයි. මෙහි—ලොකාතීත නොව, ලෞකිකාර්ථයෙහි සිට විදග්ධාවිදග්ධ ජනයාට ප්‍රියවන ගුණය ජනකාන්තනම් වෙයි; මේ ස්වාගතයෙහි හා වර්ණනායෙහිද පැණෙයි යනු භාවයි.

**54.** ගෙනම් හෙම තවසර—යමෙක් න බඳෝ තමන්,
පිවිතුරුවූ සරණයුග—රජරැස්නි රඳවත්නම්.

**54.** තවසර, තපශ්චාරිය; නබඳෝ, නොපබඳුවූ කෙනෙක්; තමන්, තමන්ගේ; පිවිතුරු වූ, පවිත්‍රවූ; සරණයුග රජරැස්නි, චරණයුග රජෝ රාශියෙන්; යමෙක්, යම් ගෘහකෙනෙකුන්; රඳවත් නම්, රඤ්ජනය කරත්නෝ වූහුනම්; ගෙනම් හෙම, ගෘහනම් ඒ ගෘහයෝමැයි **මේ ස්වාගතයෙහි කාන්තගුණයි.**

**55.** වැජඹෙන මෙ පියවුරු—බරව අත්ලිය අතුරු,
පමණ නොමවේ වැඩමට—කලහස ලසගමන් තී.

**55.** කලහස, කාලහංසයන් සේ; ලසගමන්, අලසවූ ගමන් ඇති; තී, තිගේ; වැජඹෙන, විජෘම්භමානවන; මෙ පියවුරු බරට, මේ පයොධර භාරයට; අත්ලිය අතුරු, බාහුලතාවන්ගේ අන්තරය; වැඩමට පමණ නොමවේ, වැඩීමට ප්‍රමාණ නොවන්නේය හෙවත් නොසෑහෙන්නේය. **මේ පයොධරවර්ණනාවෙහි කාන්තගුණයි.**

**56.** ඉසිත් මෙසෙ නුවතන—දෙනෝ ලෙව්හි වැටුම්,
කෙනෙක් තුසිත්ලු මෙසේ—කියත් වියතුන්ම කෙරේ.

**56.** ලෙව්හි වැටුම්, ලොකයෙහි ප්‍රවෘත්තිය; නුවතන දෙනෝ, අනුවර්තනයකරණ ජනයෝ හෙවත් ලෞකිකාර්ථය නොඉක්ම පවත්නා ජනයෝ; මෙසේ ඉසිත්, මේ යටකී පරිද්දෙන් කැමතිවෙත්; වියතුන්ම කෙරේ, ව්‍යක්තයන්ම අතුරෙහි; කෙනෙක්, සමහර කෙනෙක් හෙවත් ගෞඩීයමාර්ගී ගත් කෙනෙක්; මෙසේ කියත්, මේ (මතුකියන) ආකාර යෙන් (ලොකාතීත කොට) කියත්හොත්; තුසිත්ලු, සතුටු වෙත්ලු.

**57.** සුරගෙ නියම්න් අද—හිමින් අයදමට වත්,
නිවෙස් තමා සරණ නා—සරණ රජ දො පවිරැස්.

**57.** තමා නිවෙස්, තමාගේ භවනය; සරණ නා, සරණවූ නාගේ;

ස්වර්ණරජ, පාදරජසින්; ද්‍යූ, ධෞතවූ හෙවත් ශුද්ධකරණලද; පවිරුස්, පාපරාශි ඇත්තේ; අද හිමින්, අද පටන්; සුරගෙ නියමින්, දෙවාල යක් පරිද්දෙන්; අයදමට වත්, ආරාධනාවට සුදුසුයි හෙවත් තම තමන්ගේ අභිප්‍රාය සිද්ධකරගන්ට අපගේ ගෙට පූජකරන්ට සුදුසුයි. මේ ස්වාගතයෙහි අත්‍යුක්තියෙන් විදග්ධයන්ට මතු සන්තොෂකරණ ගෞඩීය මාර්ගීයයි.

58. නහමාංනො කර මද—මැවී බඹ නුබ සියල්,
මෙබඳුව තී වන බැව්—පියවුරු පතර පැතුරුම්.

58. තී, තීගේ; පතර, ව්‍යාප්තවූ; පියවුරු, පයොධරයන්ගේ; පැතු රුම්, පැලඹීම; මෙබඳුව, මේ ආකාරයෙන්; වනබැව්, වන්නාවූ භාවය; නොනහමා, පරීක්ෂානොකොට; බඹ, බ්‍රහ්මතෙම; සියල් නුබ, සකලා කාශය; මඳකර මැවී, ස්වල්පකොට නිර්මාණයකෙළේය. මේ පයොධර වර්ණනාව විදග්ධ අවිදග්ධයන් සිත් නොගන්නා අත්‍යුක්තියි.

59. නොවේ පණ දනකල්—නම් අතිසය ලකර වී,
කියත් යුත් සලෙලු කල්—මෙයට පෙර කී මග සර.

59. දනකල් නම් පණ නොවේ, (මේ යටකී කවි දෙක) ජනකාන්ත නම් ප්‍රාණය නොවේ; අතිසයලකර වී, අතිශයාලඞ්කාරයයි; කියත් යුත්, කියන්නට සුදුසුයි; සලෙලු කල්, දග්ධයන්ට කාන්තය; මෙයට, මේ (සජ්ජන මනොඥවූ) කාන්ත නම් ප්‍රාණයට; පෙර කී මග, ආදි ස්වාගත (පයොධරවර්ණනා වශයෙන් කී) මාර්ගීය; සර, සාරයි. **ජන කාන්තප්‍රාණයි.**

60. අන් දහමක් අතික්—තැනෙක්හි ලෝ වටමෙන්,
මොනවට පිහිටුවත්හොත්—සමාදිය යෙත් හෙ මෙසේ.

60. ලෝ වටමෙන්, ලොක ප්‍රවෘත්තියෙන් හෙවත් ලොකස්වභා වානුකූලවීමෙන්; අන් දහමක්, අන්‍ය (වස්තුවක්හුගේ) ස්වභාවයක්; අතික් තැනෙක්හි, අන්‍යස්ථානයෙක්හි; මොනවට පිහිටුවත්හොත්, සම්‍යක් ප්‍රතිෂ්ඨිත කරත්හොත් හෙවත් අනුචිත නොකොට ආරො පණය කරත්හොත්; සමාදිය යෙත්, සමාධියයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි.

61. කුමුදන් නිදෘ පියුම්—වෙනෙ පුබුදුවෙ විදූ මෙන්,
මෙ නෙත්කිරිය දූරීමෙන්—කියන වදන් සුලබවේ.

61. කුමුදන් නිදෘ, කෞමුද නිදන්නේය; පියුම් වෙනෙ, පද්මවනය; පුබුදුවෙ විදූ මෙන්, ප්‍රබොධවෙයි කිවාක් මෙන්; මෙ නෙත්කිරිය, මේ (නිද්‍රා ප්‍රබොධ සඞ්ඛ්‍යාතවූ) නෙත්‍රක්‍රියා; දූරිමෙන්, අධ්‍යාරොපණ යෙන්; කියන වදන්, කියන්නාවූ වචන; සුලබවේ, සුලභවෙයි. මෙහි—ඉන්ද්‍රියබද්ධවූ නෙත්‍රයන්ගේ නිදීම් පිබිදීම් යන නෙත්‍රක්‍රියාව නිරින්ද්‍රියවූ කුමුද පද්මයන්හි අධ්‍යාරොපණය කළ හෙයින් සමාධි ප්‍රාණ නම් වේ. **සමාධිප්‍රාණයි.**

62. සම්බැව් මටසිලුටු—සුකුමර මෙතුන් වියතුන්,
දිව වදනින්ම යෙදේ—පවසත්හොත් පළට කොට.

62. සම්බැව්, සම්ප්‍රමාණය; මටසිලුටු, සුශ්ලිෂ්ට ප්‍රාණය; සුකුමර, සුකුමාර ප්‍රාණය (යන); මෙ තුන්, මේ තුන්ගුණය; වියතුන්, ව්‍යක්ත යන්; පළට කොට, ප්‍රකට කොට; දිව වදනින්ම, ගිර්වාණවාණීයෙන්ම; පවසත්හොත්, ප්‍රකාශ කරත්හොත්; යෙදේ, යෙදෙන්නේය. හෙළු යෙන් නොකිය හැකි හෙයිනැයි සේයි.

63. සකුරු කිරි මී උගු—වෙන් වෙන් රස වෙසෙස් වේ,
කියතේ අසකිය ගින්—දුකිය පිළි කිවියරමග.

63. සකුරු, ශර්කරාය; කිරි, ක්ෂීරය; මී, මධුය; උගු, උක්ය යන මෙහි; රස වෙසෙස්, රස විශේෂය; වෙන් වෙන් වේ, පෘථග් පෘථග් භූතවෙයි හෙවත් වෙන වෙන ලෙසය; ඒ කියත්, ඒ අන්තරය කියත් හොත්; අසකිය ගින්, අශක්‍යය මෙන්; පිළි, නැවත; කිවියරමග, (අනෙකප්‍රකාර) කවිවර මාර්ගයද; දුකිය, දුකකථයි හෙවත් නොකිය හැක්කේය. මෙහි—ගුඩාදීන්ගේ දූරාන්තරවූ රස විශේෂය නොකිය හැක්කා මෙන්, කවියක්හු පාසා වෙන් වෙන්ව සිටියාවූ සූක්ෂ්මභෙද ඇති කව්මාර්ගය කියාගත නොහැක්කේය. එහෙයින් ප්‍රසිද්ධවූ වෙනස් ඇති වෛදර්භ ගෞඩීය දෙමාර්ගයෙන් කිසිවෙක් කියනු ලැබේය යනු අභිප්‍රායි.

64. නිසග සිදු පිළිබන්—උගත් ගත් විමල් නේ,
නොමඳබියොවුදු හේ වේ—වෙසෙසින් මෙ කව්සපුවට.

64. නිසග සිදු පිළිබන්, නිසර්ග සිද්ධවූ ප්‍රතිභානයද හෙවත් පූර්ව වාසනා බලයෙන් ස්වයංසිද්ධවූ වැටහෙන බුද්ධියද; විමල් නේ උගත් ගත්, නිර්මලවූ නොයෙක් උගත්නාලද ශාස්ත්‍රද; නොමඳබියොවුදු, අමන්දවූ ශාස්ත්‍රාභියොගයද හෙවත් එක්වන් බැඳීමද; මෙ කව්සපුවට, මේ කාව්‍යසම්පත්තියට හෙවත් මේ රචනාවිභූතියට; වෙසෙසින්, විශෙෂයෙන්; හේ වේ, හෙතු වෙයි.

65. නැතද හේ කළ තැත්—ගතින් අයදිය වදන්,
සිරි අනුගුරක්ම කෙරේ—තීකුත් කවර දනක්හට.

65. හේ නැතද, පූර්වවාසනා හෙතු නැතද; තැත් කළ, යත්න කළ කල්හි; ගතින් අයදිය, ශාස්ත්‍රයෙන් ආරාධනා කළ හෙවත් එක්වන් ලක්ෂණශාස්ත්‍රාභියොගයෙන් විශ්‍රතකළ; වදන්, වාණීතොමෝ; කවර දනක්හට, කිසි මුග්ධ ජනයක්හට; තීකුත්, එකාන්තයෙන්; සිරි අනුගුරක්ම කෙරේ, ශ්‍රීමදනුග්‍රහක්ම කරන්නීය.

66. එබව්නි බද තැතින්—නිබද බස් අරියන්නේ,
කිව්බැව් නැතද ඉව්හත්—වියත් සෙබෙ ඉසිර බෙජේ.

66. එබව්නි, එසේබැවින්; නිබද බද තැතින්, නිබද්ධබද්ධවූ ප්‍රයත්නයෙන්; බස්, ඒ සරස්වතිය; අරියන්නේ, ආරාධනා කරන්නේය;

කිවිබැව් නැතද, කවිත්වයක් නැත්තේද; වියත් සෙබෙ, ව්‍යක්ත සභා යෙහි; ඉමහත්, අති මහත්වූ; ඉසිර, ඓශ්වර්‍ය්‍යය; බෙජේ, භජනය කරන්නේය හෙවත් පණ්ඩිත සභායෙහි විසීමට පොහොසත්බැව්ම සෙව්නේය.

67. තෙපුලම අතිසය සෙ—ලකුණු පණ තුබූ සේ,
කියූ මනා මෙරුම් මග—ගියෙ මේ පළමුවන සග.

67. තෙපුලම, වචනයම; අතිසය සෙ, අතිශය පරිද්ද; ලකුණු පණ, කාව්‍යලක්ෂණ ප්‍රාණ; තුබූ සේ, තුබූ පරිද්ද; මනා මෙරුම් මග, සතමාර්ග අසතමාර්ග දෙකද; කියූ, කථනය කළාවූ; මේ පළමුවන සග, මේ ප්‍රථම සර්ගය; ගියෙ, සමාප්තයි.

පළමුවන සග නිමි.

---

# දෙවන සග.

68. කවි සිරි අරණ අත්—ලකරොනු අද දක්වා,
විකපෙත් කෙ ඔවුන සියල්—කියත පොහොසත්නු දියේ.

68. කවි සිරි අරණ, කාව්‍යයෙහි ශ්‍රී එලවන්නාවූ; අත්, අර්ථය; ලකර, අලඞ්කාරයි; ඔහු, ඒ අලඞ්කාරයෝ; අද දක්වා, අද දවස් තිම්කොට; විකපෙත්, විකල්ප වෙති හෙවත් භෙදයට පැමිණෙති; සියල් ඔවුන, සමස්ත ඒ අලඞ්කාරයන්; කියත්, කථනය කරත් හොත්; දියේ, ජගත්හි; කෙ පොහොසත්නු, කවුරු නම් සමර්ථයෝද. පෙර කී ශබ්ද නමැති ශරීරයට ශොභාකාරවූ අර්ථයෝ අලඞ්කාර නම්හ; ඔහු අද දක්වා අනෙකාකාරයෙන් මිශ්‍රව භින්නව උපදිති; ඔවුන් සර්වාකාරයෙන් කියන්නට කවුරු සමර්ථයෝද යනු භාවයි.

69. ඉතිදුහොත වියත්—පෙර ඇදුරන් කළ විකප්,
වහරෙන් එක් දෙක් බිදු—කියනැත් පවස් මෙ තමා.

69. ඉතිදුහොත, මෙසේ අලඞ්කාරයන් සර්වාකාරයෙන් නොකිය හැකි වුවද; වියත්, ව්‍යක්තවූ; පෙර ඇදුරන්, පූර්වාචාර්‍ය්‍යයන්; කළ, කර ණලද; විකප්වහරෙන්, භෙද නමැති වර්‍ගයෙන්; එක් දෙක්බිදු කියන, එක් දෙබිඳුවක් කියන හෙවත් එකදෙශයක් කියන; පවස්, ප්‍රෙච්ඡාව; මෙ තමා ඇත්, මේ මා තුළ ඇත හෙවත් මා සිත්හි ඇත.

70. වත්කියමන් උවම්—රූපක දිපක නම්,
පැවතුම් අකෙව් නම් ඇත්—පිළ අතතුරුනැසූදු ඇත්.

70. වත්කියමන්, වස්තුකථන නම් අලඞ්කාරයෙක හෙවත් ස්වභාවොක්ති නම් අලඞ්කාරයෙක; උවම්, උපමා නම් අලඞ්කාරයෙක;

රූපක, රූපක නම් අලඞ්කාරයෙක; දීපක, දීපක නම් අලඞ්කාර යෙක; පිළි, නැවත; පැවතුම්, ප්‍රවෘත්ති නම් අලඞ්කාරයෙක; අකෙව් නම් ඇත්, ආක්ෂෙප නම් යුත් අලඞ්කාරයෙක; අනතුරු නැසුදු ඇත්, අර්ථාන්තරන්‍යාස නම් අලඞ්කාරයෙක්ද ඇත.

**71.** වැතිරෙක විබහවූන්—සමාස අතිසය නම්,
අයලසිතිවිලිදු හේ—සියුම් ලව පිළිවෙළ නම්.

**71.** වැතිරෙක, ව්‍යතිරෙකය; විබහවුන්, විභාවනාය; සමාස, සමාසොක්තිය; අතිසය, අතිශයොක්ති නම් අලඞ්කාරය; අයලසිතිවිලිදු, බැහැරින් චින්තාවද හෙවත් උත්‍ප්‍රෙක්ෂාද; හේ, හෙතුද; සියුම්, සූක්ෂමද; ලව, ස්වල්පද හෙවත් ලෙසද; පිළිවෙළ නම්, ක්‍රම නම් (අලඞ්කාර) ද ඇත.

**72.** පිය රසවත් හිව්—පරියා සමාහිත නම්,
උදත්තා නම් පිළිකෙව්—සෙලෙසැත් වෙසෙස් සමයෝ.

**72.** පිය, ප්‍රෙයද; රසවත්, රසවත් නම්ද; හිව්, අහඞ්කාර නම් අලඞ්කාරද; පරියා, පර්‍යායොක්ති නම්ද; සමාහිත නම්, සමාහිත නම් අලඞ්කාරද; උදත්තා නම්, උදාත්ත නම්වූද; පිළිකෙව්, ප්‍රතිෂෙප නම්වූද; සෙලෙස්, ශ්ලෙෂ නම්වූද; වෙසෙස්, විශෙෂ නම්වූද; සමයෝ, තුල්‍ය යොග නම්වූද; ඇත්, (අලඞ්කාරයෝ) ඇත.

**73.** විරුදත් නොපත් වැණුම්—වැජවැණුමුදු නිදසුන්,
සහකියමන් පෙරළුම්—පිළි ආසී මුසු හැඟුම්.

**78.** විරුදත්, විරුද්ධාර්ථ නම්ද; නොපත් වැණුම්, අප්‍රාප්ත වර්ණනා වද හෙවත් අප්‍රස්තුතයද; වැජවැණුමුදු, ව්‍යාජස්තුතියද; නිදසුන්, නිදර්ශනද; සහකියමන්, සහකථනයද හෙවත් සහොක්තියද; පෙරළුම්, පරිවෘත්තියද; පිළි, නැවත; ආසී, ආශීර්වාදද; මුසු, මිශ්‍ර හෙවත් සඞ්කීර්ණාලඞ්කාරද; හැඟුම්, භාවික හෙවත් භාවාලඞ්කාරද (යන මෙකී) අලඞ්කාරයෝ ඇත.

**74.** මෙ බස්ලකණ ලකුළු—ලකරමුළු රුවන්රැස්,
කළහොත් සිත් මදෙස්හි—සිරිමත්නොවන්නො කවර.

**74.** බස්ලකණ, ශබ්දලක්ෂණ ඇතුළත්වූ; ලකුළු, අලඞ්කෘතවූ; මෙ ලකරමුළු රුවන්රැස්, මෙ අලඞ්කාර සමූහ නමැති රත්නරාශිය; සිත් මදෙස්හි, චිත්ත නමැති මඤ්ජුෂාවෙහි; කළහොත්, වින්‍යාස කළහොත්; සිරිමත් නොවන්නො, ශ්‍රීමත් නොවන්නෝ; කවර, කවරහුද. මෙසේ මාතෘකා දක්වා යථාක්‍රමයෙන් නිර්දේශ කෙරෙත්.

**75.** පදත් නන් තියරිති—සිටිනා රූ දක්වත්,
වත්කියමන් නම් ඒ—පිළි දැකිවුම් හෙ මෙසේ.

**75.** පදත්, පදාර්ථයන්ගේ හෙවත් වස්තූන්ගේ; නන් තිරිති සිටිනා රූ, නානාප්‍රකාරයෙන් සිටිනා රූපය; දක්වත්, ප්‍රකාශ කරත්

හොත්, ඒ, ඒ අලඞ්කාරයතෙම; වත්සියමින් නම්, වස්තුතර්ත හෙවත් ස්වභාවොක්ති නම් වෙයි; පිළි, නැවත; දැකියුම්, ජාතිකර්ත නම්ද වෙයි; හෙ මෙසේ, ඒ අලඞ්කාරය මෙපරිද්දෙනි.

76. තුඩින් වක් සුරත්—මරාපැහැ කොමල පියෙන්,
ගෙලෙන් මොනු තිවණ රජ—මියුරු වදන් සුවො සියල්.

76. වක් සුරත්, වක්‍රව සුරක්තවූ; තුඩින්, චඤ්චුවෙන් හෙවත් තුණ්ඩයෙන්ද; මරාපැහැ, මරකත වර්ණවූ; කොමල පියෙන්, මෘදුවූ පක්ෂයෙන්ද; තිවණ රජ, ත්‍රිවර්ණ රාජි ඇති; ගෙලෙන්, ග්‍රීවයෙන්ද (උපලක්ෂිතවූ); මියුරු වදන්, මධුර වචන ඇති; මොනු සියල්, මොනු හැමදෙනා; සුවො, ගිරාහුයි. ජාති වර්ණනායි.

77. කලරැව් ගැබ ගෙලෙන්—පරෙව් පිය සසල නුවන්,
පිරිවත්මිනඟන තමා—සිඹී පියඹ රිසි සියෝ.

77. පිය පරෙවි, වල්ලභවූ පාරාපතතෙම; පියඹ රිසි සියෝ, ශෘඞ්ගාර රුචියෙන් යුක්තවූයේ හෙවත් කාමතෘෂ්ණා සහිත වූයේ; සසල නුවන්, චචලවූ නෙත්‍ර ඇත්තේ, කලරැව් ගැබ, මනොඥවූ රාව ගබ් කොට ඇති; ගෙලෙන්, කණ්ඨයෙන් යුක්තව, තමා අඟන, තමාගේ අඞ්ගනාව හෙවත් පාරාපතකාන්තාව; පිරිවත්මින්, පරික්ෂෙප කෙරෙමින්; සිඹී, චුම්බනයකෙරේ. ක්‍රියා වර්ණනායි.

78. ලොමුදුගැඟැ බදමින්—සිතුහි නිවුම් කෙරෙමින්,
පියවමිනි නුවන් යුග—පියන් පහස් පවත්නේ.

78. ඇඟැ, ශරීරයෙහි; ලොමුදුහැ බදමින්, රොමාචබන්ධනය කෙරෙමින්; සිතුහි, චිත්තයෙහි, නිවුම් කෙරෙමින්, නිවීම කෙරෙමින්; නුවන් යුග පියවමිනි, නෙත්‍රයුගලය නිමිලනය කෙරෙමින්; පියන් පහස්, ප්‍රියාවන්ගේ ස්පර්ශය; පවත්නේ, පවත්නේයි. ගුණවර්ණනායි.

79. නිල්නෙළෙනත්ලෙ ලූ—කබල්ලෙන් සිනිඳු තඹ,
දෙළෙන් ගවයන් පළවි—සිසිකඩ කඩාමල්කඩ.

79. නිල්ගෙළෙන්, නීලවර්ණවූ කණ්ඨයෙන් යුක්තවූ; අත්ලෙ ලූ, හස්තයෙහි නික්ෂිප්තවූ; කබල්ලෙන්, කපාලයෙන් යුක්තවූ; සිනිදු, සත් ගඩවූ; තඹදෙළෙන්, තාම්‍රවර්ණ ජටායෙන් යුක්තවූ; සිස්කඩ කඩා මල් කඩ, චන්ද්‍රඛණ්ඩය ශෙඛරකොට ඇති; ගවයන්, වෘෂභවාහනතෙම හෙවත් ඊශ්වරතෙම; පළවී, ප්‍රකටවී. ද්‍රව්‍ය වර්ණනායි.

80. දෑ කිරිය ගුණ වත්—සතර කිපුම් මෙ නියර,
මුළුනත්හි ඉසුරු බෙජේ—පිළි කවිනිදු පළටවේ.

80. දෑ කිරිය ගුණ වත් සතර, ජාති-ක්‍රියා-ගුණ-වස්තු-යන සතර දෙනාගේ; කියුම්, කථනයකිරීම, මෙ නියර, මේ ආකාරයි; මුළුගත්හි, සමස්ත ශාස්ත්‍රයෙහි; ඉසුරු බෙජේ, ඓශ්වර්‍ය්‍ය භජනය කෙරේ; පිළි, නැවත; කවිහිදු, කාව්‍යයෙහිද; පළටවේ, ප්‍රකටවේ.

ස්වභාවොක්ති නිමි.

81. කියන එක් පලහක්—තැනෙක්හි වූ යම්සේ,
උවමිනමෙහි විතර—තියර කියනෙම් හෙ මෙසේ.

81. තැනෙක්හි වූ, ස්ථානයෙක්හි වූ; එක් පලහක්, (පදාර්ථයන් දෙදෙනෙක්හුගේ) එකසදෘශවූ ආකාරයක්; යම්සේ කියත, යම් කිසි පරිද්දෙකින් කියත්හොත්; උවම් නම්, උපමා නම් වේයි; එහි, ඒ උපමායෙහි; විතර තියර, විස්තර ප්‍රකාරය; කියනෙම්, කථනය කෙරෙම්; හෙ මෙසේ, ඒ මෙසේයි:—

82. කමලෙව් රතත්තල—තී මෙ වියත් දහමුවම්,
දෙවත්හි ඇති දහම්—පළකොට නිදස්වීමෙන්.

82. තී අත්තල, තීගේ හස්තතලය; කමලෙව්, පද්මයක් මෙන්; රත්, රක්තයි; මෙ වියත්, මෙසේ කියත්; දෙවත්හි, (උපමා උපමෙය යන) වස්තුවයෙහි; ඇති දහම්, විද්‍යමානවූ ධර්මය; පළකොට නිදස්වීමෙන්, ස්ඵුටකොට හෙවත් ප්‍රකාශකොට දක්වීමෙන්; දහමුවම්, ධර්මෝපමා නම් වේ. **ධර්මෝපමායි.**

83. පියුමෙව් තී වූවත්—වී ඉඳුවරෙව් දෙනුවන්,
වියත් වත්උවම් මේ—පිළි හැඟුනෙක්දහම් වේ.

83. තී වුවත්, තීගේ වදනය; පියුම් එව් වී, පද්මයක් හා සදෘශයයිද; දෙනුවන්, උභයනෙත්‍රය; ඉඳුවර එව්, ඉන්දීවර වැන්නැයිද; වියත්, කියත්හොත්; පිළිහැඟුනෙක්දහම්, ප්‍රතීතවූ එක්ස්වභාව ඇති; මේ, මේතෙම; වත්උවම් වේ, වස්තූපමා නම් වෙයි. මෙහි—වක්ත්‍රය පද්මයක් වැන්නැයි කීමෙන්ම සෞම්‍යශ්‍රිය හා සදෘශවෙයි; නෙත්‍රවය නීලෝත්පල වැන්නැයි කීමෙන්ම දීර්ඝත්වය ප්‍රකාශවෙයි; එහෙයින් සම්ගුණය පැහැයෙහි නොකියා උපමාකළ හෙයින් මේ වස්තූපමා නම්. **වස්තූපමායි.**

84. වූවනෙව් තී පුබුදු—පියුම් වියයි යත් ලෙව්,
පළවත් පෙරළමෙන් මේ—පෙරළුම්උවම් නම් වේ.

84 පුබුදු පියුම්, ප්‍රබුද්ධවූ පද්මයතෙම; තී වුවනෙව්, තීගේ මුඛය මෙන්; වියයි යත්, වියයි කියත්හොත්; ලෙව්, ලෝකයෙහි; පළවත්, ප්‍රකටවූ අර්ථයාගේ; පෙරළමෙන්, පෙරළීමෙන්; මේ, මේතෙම; පෙරළුම් උවම් නම් වේ, විපර්‍ය්‍යාසොපමා නම් වේ. **විපර්‍ය්‍යාසොපමායි.**

85. වූවනෙව් තී පියුම්—පියුමෙව් තී පිළි වූවත්,
වියත් අනුනුවම් වේ—උසසොවූනොවූන් දිස්වූ.

85. පියුම්, පද්මයතෙම; තී වුවත් එව්, තීගේ වක්ත්‍රය වැන්න; පිළි, නැවත; තී වුවත්, තීගේ වදනය; පියුමෙව් වියත්, පද්මය වැන්නැයි කියත්; ඔවුනොවුන්, අන්‍යොන්‍යයන්ගේ; උසස් දිස්වූ, වෛචිත්‍ර්‍යය දක්වූ (හෙයින්); අනුනුවම් වේ, අන්‍යොන්‍යොපමා නම් වේ. **අන්‍යොන්‍යොපමායි.**

86. තී වූවන් කමලක්—හාම් සුදුසු නොවන් හා,
වියතනුවම් වැළැක්මෙන්—නියම උවම් වියත් වේ.

86. තී වුවන්, තීගේ වදනය; කමලක් හාම සුදුසු, පද්මයක් හාම සදෘශය; නොවන් හා, අන්‍ය වස්තුවක් හා සදෘශනොවෙයි; වියත්, කියත්හොත්; අන් උවම් වැළැක්මෙන්, අන්‍ය උපමාවන්ගේ නිවාරණයෙන්; මේ නියමඋවම් වියත්, මේ නියමොපමායයි කියත්. **නියමොපමායි.**

87. තී වූවන් පියුමෙක්—වැනි පිළි අනෙපලහවත්,
එ උවම් වේවා මේ—වියතනියම් උවම් යෙත්.

87. තී වුවන්, තීගේ වක්‍ත්‍රය; පියුම් එක්වැනි, පද්මයක් හා එකාකාරය; පිළි, නැවත; අන්, අන්‍ය වස්තුවක්ද; එපලහවත්, එකාකාර වත් හෙවත් ඒ පද්මය හා සදෘශවේනම්; එ උවම් වේවා, ඒද උපමා වේවයි; වියත්, කියත්හොත්; මේ අනියම්උවම් යෙත්, මේ අනියමොපමායයි කියත්. **අනියමොපමායි.**

88. පැහැන් මතු වූවන්—සිරි තී සඳ නොඅනු වේ,
සැනහීමෙනුදු අනුවේ—වියත් සමුසුඋවම් නම්.

88. තී වුවන් සිරි, තීගේ මුඛශ්‍රිය; පැහැන් මතු, ප්‍රභායෙන් මතු; සඳ නොඅනු වේ, චන්‍ද්‍රයා හා සමවන්නේ නොවෙයි; සැනහීමෙනුදු (සිත්) සනහන ගුණයෙන්ද; අනුවේ වියත්, අනුවන්නේයයි කියත් හොත්; සමුසුඋවම් නම්, සමුච්චයොපමා නම්. **සමුච්චයොපමායි.**

89. තී කෙරෙ වේ වූවන්—සිරි තී නුබෙ සුපුන්සඳ,
දිවිම් මෙතෙක් මෙ අතුරු—වියතතිසයඋවම් යෙත්.

89. තී වුවන් සිරි, තීගේ මුඛශ්‍රිය; තී කෙරෙ වේ, තී කෙරෙහි වෙයි; සුපුන්සඳ, සම්පූර්ණ චන්‍ද්‍රයා; නුබෙ, ආකාශයෙහි (වෙයි); මෙතෙක් මෙ අතුරු, මෙපමණවූ මේ අන්තරය; දිවිම් වියත්, දුටිමියි කියත්හොත්; අතිසයඋවම් යෙත්, අතිශයොපමා නමැයි කියත්. **අතිශයොපමායි.**

90. මම කෙරේ ඈ වත්—සිරි යී දපෙත් සඳහට,
නොපත් හේ පියුමද ඈත්—වියතයලසිතුවම් වේ.

90. ඈ වත්සිරි, ඇයගේ වක්‍ත්‍රශ්‍රිය; මම කෙරේ යී, මාම කෙරෙහි යයි; දපෙත්, දර්පණය කරත්හොත් හෙවත් අභිමාන කරත්හොත්; සඳහට, චන්‍ද්‍රයාහට; නොපත්, අප්‍රාප්තය හෙවත් නුසුදුසුය; හේ, ඒ මුඛශ්‍රිය; පියුමද ඇත්, පද්මයෙහිද විද්‍යමානයයි; වියත්, කියත්හොත්; අයලසිත් උවම් වේ, අයලචින්තා උපමා හෙවත් උත්ප්‍රේක්ෂිතොපමා නම් වේ. **උත්ප්‍රේක්ෂිතොපමායි.**

91. නැඟ් බැම සසල නෙත්—යම් කමලක් වත්හොත්,
හේ වත්සිරි දෙරේ නි—වියත් අසිරි උවම් නම්.

91. නැඟි බැම, උද්ගතවූ භ්‍රෑ ඇති; සසල නෙත්, චචලවූ නෙත්‍ර ඇති; යම් කමලක් වීත්හොත්, යම් පද්මයක් විද්‍යමානවත්හොත්; හේ, එසේවූ පද්මයතෙම, තී වත්සිරි දෙරේ, තිගේ මුඛශ්‍රීය දරන්නේ යයි, වියත්, කියත්හොත්; අසිරි උවම් නම්, ආශ්චර්‍ය්‍යෝපමා නම් වේ. **අද්භුතොපමායි.**

92. සුපුන් සිසිමඬලැයි—තී වූවනත උපෙසිම්,
පිළිපදිම්යි ඔහුද වත්—වියත් එ මොහොඋවම් යෙත්.

92. සුපුන් සිසිමඬලැයි, සම්පූර්ණ චන්‍ද්‍රමණ්ඩලයයි සිතා; තී වුවනත, තිගේ වක්ත්‍රය, උපෙසිම්, උපෙක්ෂා කෙරෙම්; ඔහුද, ඒ චන්‍ද්‍රයාද; වත්, වක්ත්‍රය කොට; පිළිපදිම්යි, ප්‍රතිපාදනයකෙරෙම් හෙවත් චන්‍ද්‍රයා දුට තී මුහුණයයි සිතම්යි; වියත්, කියත්හොත්; එ මොහොඋවම් යෙත්, ඒ මෝහොපමායයි කියත්. **මෝහොපමායි.**

93. අතුර බුමු බමර—කම්ලෙක් හො සසල නුවන්,
වූවනත හො තී ම මෙනේ-ලෙලෙ යත් සැකඋවම් යෙත්

93. අතුර බුමූ බමර, අභ්‍යන්තර්භ්‍රාන්තවූ භ්‍රමරයන් ඇති; කමලෙක් හො, පද්මයෙක් දෝහෝ; සසල නුවන්, චචලවූ නෙත්‍ර ඇති; තී වුවනත හො, තිගේ වදනය දෝහෝයි; ම මෙනේ, මාගේ චිත්තය; ලෙලෙ, භ්‍රාන්තවන්නේයයි; යත්, කියත්හොත්; සැකඋවම් යෙත්, සංශයොපමායයි කියත්. **සංශයොපමායි.**

94. සඳ නිගත් කමලහු—කැල්මෝ සඳ නොවෙළපත්,
වූවනතමෙ තී මෙ එසින්—වියත නිරණඋවම් නම්.

94. සඳ නිගත්, චන්‍ද්‍රයා විසින් නිගෘහිතවූ හෙවත් නිග්‍රහ කරණලද; කමලහු, පද්මයාගේ; කැල්මෝ, කාන්තීහු; සඳ නොවෙළපත්, චන්‍ද්‍රයා විඩම්බනය නොකෙරෙත්; එසින්, ඒ කාරණයෙන්; මෙ, මේතෙම; තී වුවනතමෙ, තිගේ වදනයමැයි; වියත්, (මෙසේ) කියත් හොත්; නිරණ උවම් නම්, නිර්ණයොපමා නම් වේ. **නිර්ණයොපමායි.**

95. මෙ තී වූවන් සසක්—පිළිවක් සුවඳ සිරිමත්,
සුපුල් කම්ලෙව් ලඟනේ—වියනෙක් මේ සෙලෙසුවම්.

95. සසක් පිළිවක්, ශශාඞ්ක ප්‍රතිපක්ෂවූ හෙවත් චන්‍ද්‍රයාට ශත්‍රුවූ; සුවඳ, සුගන්ධවූ; සිරිමත්, ශ්‍රීමත්වූ; මෙතී වුවන්, මේතීගේ වදනයතෙම; සුපුල් කමලෙව්, සුනුවුලූ පද්මයක් මෙන්; ලනනේ, හොබනේයයි; වියත්, කියත්හොත්; මේ, මේතෙම; එක් සෙලෙසුවම්, එකශ්ලෙෂොප මායි හෙවත් අභින්නපදශ්ලෙශොපමායි. **එකශ්ලෙෂොපමායි.**

96. කළ හෝපලු මුහුලු—වරලින් යුත් රුපුනුවර,
තා ඇතොරන් හා වියත්—පබදසෙලෙසුවම් නම්.

96. කළ, කළගසින් හා; හෝපලු, හෝපලුගසින් හා; මුහුලු, මුහුලු ගසින් හා; වරලින්, වරල්ගසින්ද (යුක්තවූ); දෝහෝ නොහොත්—හෝපලු, අශොකපල්ලවයන්; මුහුලුකළ, මුකුලිත කළාවූ හෙවත්

කෙසයෙහි ලා ගවසනලද්දාවූ; වරලින් යුත්, කෙශකලාපයෙන් යුක්තවූ; රුපුනුවර, ශත්‍රුනගරය; තා ඇතොරත් හා, තාගේ අන්තඃපුර ස්ත්‍රීන් හා (සදෘශයයි); වියත්, කියත්හොත්; පබඳසේලෙසුවම් නම්, ප්‍රබන්ධශ්ලෙෂොපමා නම්. **සන්තානශ්ලෙෂොපමායි.**

97\. පියුම් රජරස් මුසු*—සසක් කිසඅත්ම බෙජේ,
මේ දෙක සෙමෙද්නිරිවත්—වියත් ගරහළුවම් යෙත්.

97\. පියුම්, පද්මයතෙම; රජරස් මුසු, රෙණුරාශියෙන් ගැවසිගත්තේය නොහොත් රජස් නම්වූ දොෂරාශියෙන් ගැවසිගත්තේය; සසක්, චන්ද්‍රතෙම; කිසඅත්ම බෙජේ, (කෘෂ්ණපක්ෂයෙහි) ක්ෂයවන ආත්මයක්ම භජනයකරන්නේය නොහොත් ක්ෂයරොග ඇති ආත්මයක් භජනය කරන්නේය; මේ දෙක සෙමෙද, මේ පද්ම චන්ද්‍ර යන වස්තුවය හා සමවූද; නි වත්, තිගේ වක්ත්‍රය; ඉතිරි, අතිරික්තය හෙවත් ඒ දෙකට අධිකයයි; වියත්, කියත්හොත්; ගරහළුවම් යෙත්, ගර්හෝපමායයි කියත්. **නින්දොපමායි.**

98\. සිවුවතුපත් කමල්—සඳ ඉසුරු සිරෙනි දූරු,
මෙ දෙක සෙමෙ නි වත් හා—වියත් පසස්ළුවම් නම්.

98\. කමල්, පද්මයතෙම; සිවුවත් උපත්, චතුර්මුඛයාහට උත්පත්තිස්ථානය; සඳ, චන්ද්‍රතෙම; ඉසුරුසිරෙනි දූරු, ඊශ්වරයාගේ සිරසින් ධාරිතය; මෙ දෙක, මේ පද්ම චන්ද්‍ර දෙක; නි වත් හා සෙමෙ, තිගේ වදනය හා සදෘශයයි; වියත්, කියත්හොත්; පසස්ළුවම් නම්, ප්‍රශංසොපමා නම්. **ප්‍රශංසොපමායි.**

99\. සඳ සෙමෙ නි වත් වී—කියනු පසසි මා සිත්,
හෙ වේවා ගුණනුගුණු හෝ—වියත් කියනපවසුවම්.

99\. තිවත්, තිගේ වක්ත්‍රය; සඳ සෙමෙ වී, චන්ද්‍රයා හා සමයයි; මා සිත් කියනු පසසී, මාගේ චිත්තය කථනයකරණු කැමතිය; හෙ, ඒ කථනයතෙම; ගුණ වේවා, ගුණ හෝ වේවයි; අගුණු හෝ, අගුණ හෝ වේවයි හෙවත් දොෂ හෝ වේවයි (මාගේ සිත වනාහි එසේ කියනු කැමතියයි), වියත්, කියත්හොත්; කියනපවසුවම්, කථනප්‍රවෘත්ත්‍යොපමායි. **අචික්ඛ්‍යාසොපමායි.**

100\. පුබුදු පියුම් සරා—සිසිබිඹු සොම් වුවන් නි,
මෙ තුන් විරුදෙවුනොවුනට—වියත් විරුදුළුවම් යෙත්.

100\. පුබුදු පියුම්, ප්‍රබුඩ පද්මය; සරාසිසි බිඹු, ශරච්චන්ද්‍ර බිම්බය; නි සොම් වුවන්, තිගේ සෞම්‍ය වදනය (යන); මෙතුන්, මේ තුණ; ඔවුනොවුනට විරුදු, අන්‍යොන්‍යයන්ට විරුඬයයි හෙවත් ශත්‍රුයයි; වියත්, කියත්හොත්; විරුදු උවම් යෙත්, විරුඬොපමායයි කියත්. **විරුඬොපමායි.**

---

* "සමුඩ-සමුස" සමහර.

101. පොහොසත්බැවෙක් නැත්—සැහැසෙත් ති වූවත් හා,
සහ කැඩුම්පත් සිසිහට—වියත් පිළිසෙව්වම් නම්.

101. සහකැඩුම පත්, සකලඩකාඞ්ඛයට පැමුණුනාවූ හෙවත් ශශ කලඩක සහිතවූ; සිසිහට, චන්ද්‍රයාහට, ති වුවත් හා සැහැසෙත්, තිගේ වක්ත්‍රය හා ප්‍රතිවාදයට, පොහොසත්බැවෙක් නැත්, සමර්ථභාවයෙක් නැතැයි, වියත්, කියත්හොත්; පිළිසෙව්වම් නම්, ප්‍රතිෂෙධොපමා නම්. ප්‍රතිෂෙධොපමායි.

102. මිහුලැස්නි පුත් ති—වූවනත සඳ මුවසියෝ,
ඉන්දුහොතෙනුවෙසෙස්—වියත් වෙ සෙව්වදනුවම්.

102. ති වුවනත, තිගේ වදනය; මිහුලැස්නි පුත්, මෘගනෙත්‍රයෙන් යුක්තය හෙවත් මුවන්ගේ ඇසින් යුක්තය; සඳ මුවසියෝ, චන්ද්‍රතෙම සකල මෘගයා විසින් යුක්තය, ඉතිදුහොත්, එසේද වුවත්; එ, ඒ (සකල මෘගයා ඇති) චන්ද්‍රතෙම (මෘගයාගේ ඇස් පමණක් ඇති ති මුහුනට); නුවෙසෙස්, අවිශෙෂය හෙවත් නොවැඩියයි; වියත්, කියත්හොත්; සෙව්වදනුවම් වෙ, සෙව්‍යවචනොපමා නම් වේ. චාටූපමායි.

103. වූවන්ම නො පියුම්—පිළි නො බමරයුග නුවන්,
වියතෙක්වැනි විලස්නෙන්—තතුකියුමුවම් නම් වේ.

103. නො පියුම්, (මේ) පද්මයෙක් නොවෙයි; වුවන්ම, (තිගේ) වදනයමැයි; පිළි, නැවත; නො බමරයුග, භ්‍රමර යුගමයෙක්ද නොවෙයි; නුවන්, නෙත්‍රයුගමයමැයි; වියත්, කියත්හොත්; එක්වැනි විලස්නෙන්, එකාකාර විලාසයෙන් හෙවත් මේ දැක්වූ එකස්වරූප ලීලාව කරණකොටගෙණ; තතුකියුමුවම් නම් වේ, තත්වාඛ්‍යානොපමා නම් වේ. තත්වාඛ්‍යානොපමායි.

104. සඳ කමලෙක්වැනි—විලසික්ම ති මෙ වූවන්,
අත්ම සෙමේ වී යත්—නොඅන්සුදුසු උවම් නම්.

104. එක්වැනි, එකාකාරවූ; සඳ කමල්, චන්ද්‍ර පද්මයන්ගේ; විලස් ඉක්ම, විලාසය අතික්‍රාන්තව හෙවත් මැඩ; ති මෙ වූවන්, තිගේ මේ වදනය; අත්ම සෙමේවී යත්,(තමහට)තමාම සදෘශවියයි කියත්හොත්; නොඅන්සුදුසුඋවම් නම්, අනන්‍යසදෘශොපමා නමි. අසාධාරණොපමායි.

105. තැනෙක්හි වූ හැම—පියුම් පැහැසර රැස් මෙන්,
වොරජනෙ ති වත් යත්—නොඋවම් නම් වියත් මේ.

105. තැනෙක්හි වූ, එක්ස්ථානයෙක්හි ජනිතවූ; හැම පියුම්, සර්ව පද්මයන්ගේ; පැහැසර රැස් මෙන්, ප්‍රභාසාර රාශියක් මෙන් (හෙවත් ලොකයෙහි විද්‍යමානවූ පද්මයන්ගේ ප්‍රභාසාරය එක්තැනෙක ඉපිද රාශිව සිටියාක් මෙන්); ති වත්, තිගේ වක්ත්‍රය; වොරජනෙ යත්, විරාජමාන වන්නේයයි කියත්; මේ, මේ උපමාව; නොඋවම් නම් වියත්, අභූතොපමා නමැයි කියත්. අභූතොපමායි.

106. වස සෙ සඳින් සඳුන්—දෙලෙන් හුතැස් මෙන් ගී,
මේ වත්නි කැකුළු වදන්—වී යත් දුහදුවම් නම්.

106. තී මේ වත්නි, තිගේ මේ වක්ත්‍රයෙන්; කැකුළු වදන්, කර්කශ වචනයන්; සඳින් වස සෙ, චන්ද්‍රයා කෙරෙන් විෂ පරිද්දෙන්ද, සඳුන් දෙලෙන්, චන්දන ජලයෙන්; හුතැස් මෙන්, හුතාශනය හෙවත් වහ්නිය මෙන්ද; වී යත්, වියැයි කියත්හොත්; දුහදුවම් නම්, දුශ්ශ්‍රාධ්‍යොපමා හෙවත් අසම්භාවිතොපමා නම් වේ. **අසම්භාවිතොපමායි.**

107. සඳුන්දල සඳරැස්—සිසිකත මරු කපුරු හර,
හැලි හෙල්මැලි සිහිල් නි—පහස වියත් බුහුලුවම්.

107. තී පහස, තිගේ ස්පර්ශය; සඳුන්දල, චන්දනොදක සේද; සඳ රැස්, චන්ද්‍රරශ්මි සේද; සිසිකත, චන්ද්‍රකාන්ති මාණික්‍ය සේද; මරු, (මන්ද) මාරුතය සේද; කපුරු, කර්පූර සේද; හර, මුක්තාහාර සේද; හැලි, නිර්ඣර සේද; නෙල්මැලි, කල්හාර සේද; සිහිල්, සීතලයයි; වියත්, කියත්හොත්; බුහුලුවම්, (බොහෝදෙනා හා සදෘශකළහෙයින්) බහූපමා නම් වේ. **බහූපමායි.**

108. කළ වන් සිසිබිඹුනි—ගෙණුපුළු වන් ති දුවවත්,
තඹුරු ගැබින් තුනුවඟ—වියත් විකරළුවම් යෙත්.

108. තුනුවඟ, තන්වඞ්ගිය හෙවත් කෘශවූ ශරීර ඇත්තිය, තී වූවත්, තිගේ වක්ත්‍රය; සිසිබිඹුනි, චන්ද්‍රබිම්බයෙන්ද; තඹුරුගැබින්, තාමරස ගර්භයෙන්ද; උපුළ වන්, උදුරණලද්දාවූ වර්ණය; ගෙණ, ග්‍රහණය කොට; කළ වන්, කරණලද වනැයි; වියත්, කියත්හොත්; විකරළුවම් යෙත්, වික්‍රියොපමායයි කියත්. **වික්‍රියොපමායි.**

109. ගුවන දවසෙව් දවස—හිරෙව් හිරුද රස් එව්,
සියවික්ම ත කෙරේ දිනි—සිරි යත් මල්ලුවම් නම්.

109. සියවික්ම, ස්වකීය වික්‍රමයතෙම; ත කෙරේ, තා කෙරෙහි; සිරිදින්, ශ්‍රී ජනිතකෙළේ; (කුමක් මෙන්ද යත්)—ගුවන දවසෙව්, ආකාශයෙහි ශ්‍රී ජනිතකළ දිවසය මෙන්ද: දවස හිරෙව්, දිනයෙහි ශ්‍රී ජනිත කළ සූර්‍ය්‍යයා මෙන්ද; හිරුද රස් එව්, සූර්‍ය්‍යයා කෙරෙහි ශ්‍රී ජනිත කළ රශ්මිය මෙන්දැයි; යත්, කියත්හොත්; මල්ලුවම් නම්, මාලොපමා නම්. **මාලොපමායි.**

110. වදපබඳක් හා යම්—වදපබඳරුත් සමවත,
හෙ එක් නොඑක් එව්සද—වදපබදුවම් නම් වූ.

110. වදපබඳක් හා, වචනප්‍රබන්ධයක් හා; යම් වදපබඳරුත්, යම් වචනප්‍රබන්ධාර්ථයක්; සමවත, සදෘශවත්හොත් හෙවත් එක් වාක්‍යාර්ථයක් හා අනික් වාක්‍යාර්ථයක් හා තුල්‍යාකරත්හොත්; වදපබඳ උවම් නම්වූ, වචනප්‍රබන්ධඋපමා නම්වූ හෙවත් වාක්‍යාර්ථොපමා නම්වූ; හෙ, ඒ උපමාලඞ්කාරයතෙම; එක් නොඑක් එව්සද, එක් 'එව්' ශබ්ද නොඑක් 'එව්' ශබ්ද ඇතිවන්නේයි. (ඒ මෙසේයි):—

111. සල නෙත් වොරජනා—දසන් මෙරජ වූවත් නි,
බුඹු බමර දුල කෙසුරු—පුබුදු පියුමෙව් හොබනේ.

111. සල නෙත්, චපලවූ නෙත්‍ර ඇති; වොරජනා, විරාජමානවූ; දසන් මෙරජ, දසනමරීචි ඇති; නි වුවන්, නිගේ වක්ත්‍රය; බුඹු බමර, භ්‍රාන්තවූ භෘඞ්ගයන් ඇති, උදුල කෙසුරු, උජ්වලවූ කෙශර ඇති; පුබුදු පියුමෙව්, ප්‍රබුද්ධ පද්මයක් මෙන්; හොබනේ, විරාජමානවන්නේයි. **ඒකේවශබ්දවාක්‍යෝපමායි.**

112. සර වන් එ තුනුවන—කමල් සෙමේ වුවන්හී,
බමරෙව් බිඹි කෙලෙනෙම්—මුවම් මී සුදුසුවූ.

112. සර වන්, ශරයක් වැනිවූ; එ තුනුවන, ඒ තන්වඞ්ගියගේ; කමල් සෙමේ, පද්මයක් හා සදෘශවූ; වුවන්හි, වදනයෙහි; මී සුදුසුවූ, මධු හා සදෘශවූ; මුවම්, මුඛමධුව; බිඹි, පානයකෙරෙමින්; බමරෙව්, භෘඞ්ගයෙකු මෙන්; කෙලෙනෙම්, ක්‍රීඩාකෙරෙම්. මෙහි–ආදිකව්හි උපමෙයවස්තූන් එකවිට දක්වා, පසුව තත්සදෘශවූ උපමාවස්තූන් දක්වා, එකම සාදෘශ්‍ය වාචිවූ ශබ්දය ප්‍රයොගකරණලද; දෙවන කව්හි උපමා උපමෙය වස්තූන් වෙනවෙනම දක්වා, සාදෘශ්‍යවාචී ශබ්දද වෙනවෙනම දක්වා ප්‍රයොගකරණලදී. **අනේකේවශබ්දවාක්‍යෝපමායි.**

113. කියා එක්වත් එක්—දහමක්නු දක්වත්හොත්,
සමබැව් පිළිවත්නු වී—පිළිවත්උවම් හෙ මෙසේ.

113. එක්වත් කියා, (පුරුෂාදි) එක් වස්තුවක් දක්වා; එක් දහමක්නු දක්වත්හොත්, (ඒ වස්තුව හා සමාන ගුණ ඇති) අන්‍ය වස්තුවක්නු පවුත්හොත්; සමබැව් පිළිවත්නු වී, සමභාවයට ප්‍රතිවස්තු වීනුයි; පිළිවත් උවම්, ප්‍රතිවස්තූපමා නම්; හෙ මෙසේ, ඒ මෙසේයි.

114. න සේ නැතන් රදෙක්—උපදන රදුනතුරේ,
දෙවනුව නැත්මැයි තුරෙක්—පරසතු නම් තුරුවරට.

114. උපදන රදුනතුරේ, උත්පාද්‍යමානවූ රජදරුවන් අතුරෙහි; න සේ අන්රදෙක් නැත්, නා සේවූ අන්‍යරාජයෙක් නැත; (ඒ එසේ මැයි); පරසතු නම් තුරුවරට, පාරිජාත නම් තරුවරයට; දෙවනුව තුරෙක් නැත්මැයි, විතියව (තත් සදෘශවූ) වෘක්ෂයෙක් නැත්මැයි. **ප්‍රතිවස්තූපමායි.**

115. ඉතිරි යමක්නු හා—මෙරමා හා කමෙහි එක්,
සමයෝ කරු පවත්වත්—සමයෝඋවම් හෙ මෙසේ.

115. ඉතිරි යමක්නු හා, අධිකතරයක්නු හා; මෙරමා හා, එයින් අන්‍යයා හා හෙවත් ඕනට අඩු තැනැත්තනු හා; එක් කමෙහි, එක් ක්‍රියාවෙහි; සමයෝ කරු, සමයොග කොට හෙවත් සමසේ එක්කොට; පවත්වත්, ප්‍රවෘත්තනය කරත්හොත් හෙවත් කියත්හොත්; සමයෝ උවම්, තුල්‍යයොගොපමායි; හෙ මෙසේ, ඒ මෙසේයි:—

116. දෙවිඳු රකී සුරලෝ—ගිම්ඳ රකී මුලුපොළෝ,
වනසා නෙ අසුර සහස්—හිමි වනසා රුපු සහස්.

116. දෙවිඳු, දෙවේන්ද්‍රතෙම; සුරලෝ රකී, දිව්‍යලෝකය රක්‍ෂා කෙරෙයි; ගිම්ඳු, ස්වාමිද, මුලුපොළෝ රකී, සමස්ත පෘථිවිය රක්‍ෂා කෙරෙයි; නෙ, ඒ (දෙවේන්ද්‍ර) තෙම; අසුර සහස්, අසුර සහස්‍රයන්; වනසා, නසන්නේය; හිමි, ස්වාමිතෙම; රුපු සහස්, ශත්‍රු සහස්‍රයන්; වනසා, නසන්නේය. මෙහි—අධිකවූ දෙවේන්ද්‍රයා හා අඩුවූ රජු හා දෙදෙනා රක්‍ෂා විනාශ ක්‍රියාවන්හි සමකොට යෙදූ හෙයින්, තුල්‍යයෝගෝපමා නම් වෙයි. **තුල්‍යයොගොපමායි.**

117. පැහැන් නිසඹුරු වන්—තෙදින් හිරු තො මහරජ,
ගැඹුරෙන් සයුරු වැන්නෙහි—යත් මේ ගේළුවම් නම්.

117. මහරජ, මහාරාජය; තො, තෝ වනාහි; පැහැන්, ප්‍රභාවෙන්; නිසඹුරු වන්, නිශාකරයා වැන්නෙහිය; තෙදින්, තෙජසින්; හිරු, සූර්‍ය්‍යයා වැන්නෙහිය; ගැඹුරෙන්, ගම්භීරත්වයෙන්; සයුරු වැන්නෙහි, සාගරය වැන්නෙහියයි; යත්, කියත්හොත්; මේ, මේ උපමාතොමෝ; ගේළුවම් නම්, ගේතූපමා නම්. **හෙතූපමායි.**

118. කමලතල ඉඳුසැව්—බැමලේ ලතුදල ලවන්,
කන කතුරු මිටු කන්පට—කනකැට මිටු සුවට කට.

118. කමලතල, කමල හස්තතලය; ඉඳුසැව් බැමලේ, ඉන්ද්‍රචාප භ්‍රෑලේඛාය; ලතුදල ලවන්, අලක්තපත්‍ර අධරය; කන කතුරු මිටු කන්පට, කනකකත්තිරි මෘෂ්ටිකර්ණපට්ටය; කනකැට මිටු සුවටකට, කනකදපිණ මෘෂ්ටිසුවෘත්ත කණ්ඨයයි කියාද.

119. කිසලත සඳ වූවන්—ඉඳුවර නෙතකුසු ගහන්,
වදුරුමැද තුනු තිසර—පියවුරු කොඳවැල දසන්.

119. කිසලත, කිසල හස්තය; සඳ වූවන්, චන්ද්‍ර වදනය; ඉඳුවර නෙත්, ඉන්දීවර නයනය; අකුසු ගහන්, අඞ්කුසඝ්‍රාණය; වදුරුමැද තුනු, වජ්‍රමධ්‍ය ශරීරය; තිසර පියවුරු, හංස පයොධරය; කොඳවැල දසන්, කුන්දාවලී දසනයයිද.

120. කඩතඹර පාතල—රඹසුග වවොර බිඟුරජ,
වසා සරුසිසි මෙරජ—සිරිපත් සිනා යෝනන්.

120. කඩතඹර පාතල, අභිතාමරස පාදතලයයිද; රඹසුග වවොර, රම්භායුගම ඌරුයයිද; බිඟුරජ වසා, භෘඞ්ගරාජ රොමාවලියයිද; සරු සිසි මෙරජසිරි පත්, ශරච්චන්ද්‍රමර්චිශ්‍රීප්‍රාප්තාවූ; සිනා යෝනන්, ස්මිත යුවතින්ගේයයි කියාද.

121. සසක් වූවන් මිණි—නිල් නෙත් ලිය කොමලඟැ,
කිසු අරුනෙවුසඳ හළ—පිළි මේ සමසුවම් නම්.

121. සසක් වුවන්, ශශාඞ්ක වදනයයිද; මිණි නිල් නෙත්, මණි නීල නෙත්‍රයයිද; ලියකොමලඟ ඇ, ලතාකොමලාඞ්ගියයිද යනාදිවූ;

කියූ අරුත්, උක්තාර්ථයෙන්; එව්සද හළ, උපමා වාචීවූ එව්ශබ්දය හළවාවූ (හෙමත් සමාසකළ හෙයින් උක්තාර්ථයන්ගේ අප්‍රයොගය වේනුයි. ඉව ශබ්දය ලොප්කොට පූවාවූ;) මේ පිළි, මේ වනාහි; සමසූ වම නම්, සමාසොපමා නම්. **සමාසොපමායි.**

**122.** අන්පද අරුත්සර—උතුරුපදරුත්සර හා,
පෙරපද අරුත්සර හා—දෙපදඅරුත්සරද නැත්.

**122.** උතුරුපදරුත්සර හා, උත්තරපදාර්ථ ප්‍රධාන සමාසය හා; පෙරපද අරුත්සර හා, පූර්වපදාර්ථ ප්‍රධාන සමාසය හා; දෙපද අරුත් සරද, උභයපදාර්ථ ප්‍රධානසමාසයද; නැත්, නැතහොත්; අන්පද අරුත්සර, අන්‍යපදාර්ථ ප්‍රධානසමාස නම්.

මෙහි—උත්තරපදාර්ථ ප්‍රධාන සමාසනම්, "රාජපුරුෂඃ" යනුයි; මෙහි රාජන්ශබ්දය පුරුෂයා වෙසෙසන්ට සිටිබව මුත් 'රාඥඃ පුරුෂඃ' යී කියයුතු පුරුෂයාටම පරපදවූ හෙයිනි. පූර්වපදාර්ථ ප්‍රධාන සමාසනම්, "උපකුම්භම්" යනාදියයි; මෙහි කුම්භයාගේ සමීපාර්ථය හඟවන්නාවූ උපශබ්දය පූර්වපදව සිටි හෙයින් "කුම්භස්‍ය සමීපම්" කියා කියයුතු වූයේ සමීපයයි. උභයපදාර්ථ ප්‍රධාන සමාස නම්, "අශ්වවෘෂභම්" යනාදියයි; "අශ්වගවවෘෂභාශ්ව" යී පූර්වාපර දෙපදය කියයුතු ද්‍රව්‍ය හෙයිනි. අන්‍යපදාර්ථ ප්‍රධාන සමාස නම්, "චන්‍ද්‍රමුඛී" යනාදියයි; මෙහි-පූර්වපදවූ චන්‍ද්‍රයාත් පරපදවූ මුඛයත් යන දෙකින් පිටත්වූ අනික් පදාර්ථයක්ම වාච්‍යහෙයිනි; එහෙයින්, මේ "චන්‍ද්‍රමුඛී" යන්න මෙන් සම් අන්‍යාර්ථසමාසයෙක් උපමා හඟවන්නේයයි දතයුතු.

**123.** නොඑක් ලිඟු වදනුදු—කුදු මහ වතුදු උවමට,
නිදොස් පෙර කිවිවරන්—පියෝ ඇසුරුකරත්හොත්.

**123.** නොඑක් ලිඟු වදනුදු, භින්නලිඞ්ග භින්නවචනද හෙමත් නොසමවූ ලිඞ්ගවචනද; කුදු මහ වතුදු, ක්‍ෂුද්‍ර මහත් දෙයද; පෙර කිවිවරන් පියෝ, පූර්වකවිවරයන්ගේ ප්‍රයොග; ඇසුරුකරත්හොත්, ආශ්‍රය කරත්හොත්; උවමට නිදොස්, උපමාවට නිර්දොෂයි. එමෙසේයි:—

**124.** ගැහැණි එව් හෙ සෙරේ—පිරිමිනු මෙන් හෝ බෙණේ,
පණුන් සෙ පියව් සබද—වුනු විදුහු දනකෙව් රැස්.

**124.** හෙ, ඒ පුරුෂතෙම; ගැහැණි එව් සෙරේ, ස්ත්‍රියක් මෙන් ගමන්කරන්නේය; හෝ, ඒ ස්ත්‍රීතොමෝ; පිරිමිනු මෙන් බෙණේ, පුරුෂයකු මෙන් බස් කියන්නීය; (මේ දෙක ලිඞ්ගභෙද කොට උපමා කී කල දොෂ නැතිබවට උදාහරණයි.) සබඳ, මිත්‍රතෙම; පණුන් සෙ පියව්, ඉෂ්ටප්‍රාණයන් සේ ප්‍රියය; (මේ එකවචනවූ මිත්‍රයාහට බහුවචනවූ ප්‍රාණයන් උපමාකළ හෙයින්, වචනභෙද කොට උපමා කී කල දොෂ නැතිබවට උදාහරණයි.) විදුහු, විද්‍යුත්හුමෝ; දනක් එව්, ධනයක් මෙන්; රැස්වුනු, රාශිවූහු; (මේ ස්ත්‍රීලිඟු බහුවචනවූ විද්‍යුත්වන්ට නපුංසකලිඟු එකවචනවූ ධනය උපමාකළහෙයින් ලිඞ්ගවචනභෙද එක්වූ තැන දොෂ නැතිබවට උදාහරණයි).

**125.** න මෙන් ගිම් මිහිපල්—වොරජනේ සක්දෙව්රජ,
පළතෙදිනි තො සහස්රැස්—සෙමෙ යත් නිදසුනෙතුණැව.

**125.** මිහිපල් හිමි, මහීපාල ස්වාමිය; න මෙන්, තා පරිද්දෙන්; සක්දෙව්රජ, ශක්‍රදෙවරාජයා; වොරජනේ. විරාජමාන වින්නේය; (මේ අධිකයාහට හීනයා උපමාකළ තැන නිර්දොෂබවට උදාහරණයි.) තො, තෝවනාහී; පළතෙදිනි. ප්‍රකට තෙජසින්; සහස්රැස් සෙමෙ, සහස්‍රරශ්මිහු හා සමයෙහිය; (මේ හීනයාහට අධිකයා උපමාකළ තැන නිර්දොෂ බවට උදාහරණයි.) යත්, [මෙසේ දූශීකවින්ගේ ප්‍රයොග යට අවිරුඩිකොට උපමා] කියත්හොත්; එතුණට නිදසුන්, ඒ ලිඞ්ග ගෙද-වචනභෙද-හීනාධිකත්ව යන තුණට නිදශීනයි.

126 සිසි හස්කනෙව් සුදු—නුබ වී විමල් විල් සේ,
ගිම් බැති බෙලෙ සුවටු වන්—රිවි මෙන් කදෙ දිස්නේ.

**126.** සිසි, චන්ද්‍රතෙම; හස්කතෙව්, හංසකාන්තාවක් මෙන්, සුදු, ශුභ්‍රය; (මේ ලිඞ්ගවිරොධයට උදාහරණයි.) නුබ, අකාශයතෙමේ; විල් සේ, සරසුන් පරිද්දෙන්; විමල් වී, නිර්මල විය; (මේ වචනවිරොධ යට උදාහරණයි ) හිමි බැති, ස්වාමිභක්තිකවූ හෙවත් ස්වාමිපක්‍ෂ පාතවූ; බෙලෙ, භටතෙම; සුවටු වන්, ශ්වානයෙකු හෙවත් බල්ලකු වැන්න; (මේ අධිකයාහට හීනයා උපමාකළ විරොධයට උදාහරණයි.) කදෙ, බජේජනතෙම; රිවි මෙන්, සූර්‍ය්‍යයා මෙන්; දිස්නේ, දෘශ්‍යමානයි; (මේ හීනයාහට අධිකයා උපමාකළ තැන විරොධයට උදාහරණයි ) **උපමාදොෂයි.**

127. ඇතද හෙ නියවත්හු—නොමපසසිත් මේ උවම්,
දූසි සුරු සුදු සුරක් එව්—එක්බදු නුරු පිළිරු.

**127.** හෙ ඇතද, (උපමාකරන්නට සුදුසුවූ) ශුභ්‍ර භවාදී හෙතු ඇතද; නියවත්හු, ඥාණවන්තයෝ; මේ නොමපසසිත්, මේ ප්‍රශංසා නොකෙරෙත්; (ඉක්බිති උපමාවාචී ශබ්ද කියනුලැබේ) **උවම්, උප මාව**—දූසි යනුද; සුරු යනුද; සුදු යනුද; සුරක් යනුද; එව් යනුද; එක්බදු යනුද; නුරු යනුද; පිළිරු යනුදූයි; (මෙකී ශබ්දයෝද.)

128. අයුරු වැනි වලා—පලහ හරණ ගින් මෙන්,
දහළු සුලා හළු වන්—විපක් පිළිවක් බඳු සේ.

**128.** අයුරු යනුද; වැනි යනුද; වලා යනුද; පලහ යනුද; හරණ යනුද; ගින් යනුද; මෙන් යනුද; දහළු යනුද; සුලා යනුද; හළු යනුද; වන් යනුද; විපක් යනුද; පිළිවක් යනුද; බඳු යනුද; සේ යනුදූයි (මෙකී ශබ්දයෝද.)

**129.** නොපිටිගණී ගැහැවේ—සැවේ නසා වනසා,
නොඅඩුවෙ වඩා වඩවා—වියවා සුරු පරදවා.

**129.** නොපිටිගණී යනුද; ගැහැවේ යනුද; සැවේ යනුද; නසා යනුද; වනසා යනුද; නොඅඩුවෙ යනුද; වඩා යනුද; වඩවා යනුද; වියවා යනුද; සුරු යනුද; පරදවා යනුදූයි (මෙකී ශබ්දයෝද.)

130. සැහැසේ රෙසේ සේ—පැහැසේ වැසේ අවුසේ,
දෙනේ තෙනේ තුවේ—කොවුලා කොවා වෙළප.

180. සැහැසේ යනුද; රෙසේ යනුද; සේ යනුද, පැහැසේ යනුද; වැසේ යනුද; අවුසේ යනුද; දෙනේ යනුද; තෙනේ යනුද; තුවේ යනුද; කොවුලා යනුද; කොවා යනුද; වෙළුපා යනුදැයි මේ ශබ්දයෝද (වෙත්). **උපමාභෙදක ශබ්දයි.**

131. මේ ඈ නත් උවම්—කියන වදන් මිණිරුවන්,
කිවින් හිදඅත්හි කරත්—පොහොසත්වත් කවර බර.

181. මේ ඈ, මේ ආදිවූ; නන්, නානාප්‍රකාරවූ; උවම් කියන, උපමා වාචීවූ; වදන් මිණිරුවන්, වචන නමැති මාණික්‍යරත්නයන්; හිදඅත්හි කරත්, හෘදයාභ්‍යන්තරයෙහි කරත්හොත් හෙවත් සිත තබත්හොත්; කිවින්, කවීන්; පොහොසත්වත්, සමෘද්ධිමත්නට; කවර බර, කුමන භාරයෙක්ද.

උපමාලඞ්කාර නිමි.

---

132. සියල්ලෙනත්සෙසින්—හෙයිනුදු තනු වැළැක්මෙන්,
උවම් වැතිරෙක සෙලෙස්—වෙසෙස් වසම් අකෙව්දූත්.

182. සියල්ලෙන්, සමස්තයෙන්ද; අන්සෙසින්, ඒ සමස්තයෙන් අන්‍යවූ අවයවයෙන්ද; හෙයිනුදු, හෙතුයෙන්ද; තනු වැළැක්මෙන්, තත්වාපහරණයෙන්ද හෙවත් ඇති තත්වය නොකීමෙන්ද; උවම්, උපමායෙන්ද; වැතිරෙක, ව්‍යතිරෙකයෙන්ද; සෙලෙස්, ශ්ලෙෂයෙන්ද; වෙසෙස්, විශෙෂයෙන්ද; වසම්, විෂමයෙන්ද; අකෙව්දු, ආක්ෂෙපයෙන්ද (යුක්තවූ රූපක); ඈත්, ඇත්තේය.

133. උවම්මෙ නැසුනු බේ—රූපක නම් හෙ මෙසේ,
බහුලිය අත්නල පියුම්—තුවනිඳුවර උවන් සඳ.

138. නැසුනු බේ, සැඟවුනු භෙද ඇති; උවම්මෙ, උපමාම; රූපක නම්, රූපාලඞ්කාර නම් වෙයි; හෙ මෙසේ, ඒ මෙසේයි. බහුලිය, බාහුලතායයිද; අත්තල පියුම්, හස්තතල පද්මයයිද; තුවනිඳුවර, නයනෙන්දීවරයයිද; වුවන්සඳ, වක්ත්‍රචන්ද්‍රයයිද කියායි. මෙහි "බහුලිය" යයි බාහුව ලතාවක් කොට රූපණයකොටලා බාහු නමැති ලතාව යයි සමාසකොට කීහෙයින්, මේ ආදි දෙය සමස්තරූපක නම් වෙයි. **සමස්තරූපකයි.**

131. සුරතැඟිලි වී පලු—තියරුස් වී කුසුම්රුස්,
අත්හුදු වී ලිය වසත්—සිරි තො අපට පසක්සර.

184. සුරතැඟිලි, සුරක්තවූ අඞ්ගුලි; පලු වී, පල්ලව විය; තියරුස්, නඛරශ්මිය; කුසුම්රුස් වී, කුසුමරාශි විය; අත්හුදු, හස්තද; ලිය වී, ලතා විය; (එහෙයින්) තො, තෝ විනාහි; අපට, අපහට; පසක්සර,

ප්‍රත්‍යක්‍ෂසාරිණීවූ; ව්‍යක්තසිරි, ව්‍යක්තශ්‍රී විය. මෙහි අඞ්ගුලාදීන් පල්ලවාදියෙහි රූපණය කොට, සමස්ත නොකොට දක්වූ හෙයින් ව්‍යස්තරූපක නම්. **ව්‍යස්තරූපකයි.**

**135.** සමස නම් පෙර කියෙ—නොසමස නම් වේ පිළි,
සමසනොසමසුදු ඇත්—දක්වන්නෙම් හේ මෙසේ.

**135.** පෙර කියෙ, ආදි දක්වූයේ; සමස නම්, සමස්ත (රූපක) නම් වේ; පිළි, නැවත (දක්වූයේ); නොසමස නම් වේ, අසමස්ත (ව්‍යස්ත) රූපක නම් වේ; සමසනොසමසුද ඇත්, [ඉක්බිති] සමස්තාසමස්ත (රූපකද) ඇත; හේ මෙසේ දක්වන්නෙම්, ඒ මෙසේ දක්වන්නෙමි.

**136.** සොම් වූවත් සුපුන්—සිසිමඬලු තී කල්බඳ,
සිරිපත් සිනාමෙ මෙරජ—ම මන කුමුදු පුබුදුවී.

**136.** කල්බඳ, කාන්තවූ දෙහ ඇත්තිය; තී, තීගේ; සොම් වුවත්, සෞම්‍ය මුඛ නමැති; සුපුන් සිසිමඬල, සම්පූර්ණවූ චන්ද්‍රමණ්ඩලයාගේ; සිනාමෙ, හාස්‍යයම; මෙරජ සිරිපත්, මරීචිශ්‍රියට ප්‍රාප්තවිය; ම මන කුමුදු, මාගේ මනස් නමැති කෞමුදය; පුබුදුවී, ප්‍රබොධවිය. මෙහි—"සොම් වුවත්" "සුපුන් සිසිමඬල" යනු සමස්තපදයි; "සිනාමෙ" යනුද "මෙරජසිරි පත්" යනුද ව්‍යස්තපදයි; එහෙයින් මේ සමස්ත ව්‍යස්ත රූපක නම්. **සමස්තව්‍යස්ත රූපකයි.**

**137.** සුරතැඟිලි පත්පෙළ—තියරුස් කෙසුරු ත සරණ,
කමල් මිහිපල් මුදුනේ—නරනිඳු අරද රදනේ.

**137.** නරනිඳු. නරෙන්ද්‍රය; සුරතැඟිලි පත්පෙළ, සුරක්තාඞ්ගුලි නමැති පත්‍රපඞ්ක්ති ඇති; තියරුස් කෙසුරු, නඛරශ්මි නමැති කෙශර ඇති, ත සරණ කමල්, තාගේ චරණ නමැති පද්මයතෙම; මිහිපල් මුදුනේ, මහීපාලයන්ගේ මස්තකයෙහි; අරද. නිරන්තරයෙන්; රඳනේ, රඤ්ජමාන වන්නේය. මේ සර්වාකාරයෙන් රූපණයකළ හෙයින්, සකලරූපක නම් වේ. **සකලරූපකයි.**

**138.** රත් නුවන් මහනෙල්—සසල ලවන් කිසල් තී,
වූවනත කවර කරුණෙනී—විසිනත නැත තමා දෙස්.

**138.** විසිනත, පරීක්‍ෂා කරත්හොත්; තමා දෙස් නැත, මාගේ දොෂයෙක් නැත; තී වුවනත, තීගේ වදනය; කවර කරුණෙනී, කවර කාරණයෙකින්; රත් නුවන් මහනෙල්, රක්තවූ නෙත්‍රොත්පල ඇත්තේද; සසල ලවින් කිසල්, චඤ්චලවූ අධරපල්ලව ඇත්තේද.

මෙහි—නෙත්‍රයන් උත්පල කොට හා අධරයන් කිසලය කොටද රූපණය කොට; (අවයවීවූ) වක්ත්‍රය රූපණයනොකළ හෙයින්, අවයව රූපක නම් වේ. **අවයවරූපකයි.**

**139.** සුනත් බැමලේ මුත්—සරම දලබිඳු රත් නෙත්,
පළුවකෙරේ මදසමා—සිරිමත් වත්පිසුම් තී.

**139.** සුනත් බැමලේ, සුනම්‍රනත භ්‍රැලෙඛා ඇති; මුත් සරම

දලබිඳු, මුඛනාවූ ඝර්මජලබිඳු ඇති; රත් නෙත්, රක්තවූ නෙත්‍ර ඇති; සුරිඹුත්, සුරාමත්වූ, තී මිත්පියුම්, තිගේ වක්ත්‍රපද්මය; මදසමා, මදන කාලය; පළවකෙරේ, ප්‍රකාශකෙරේ මෙහි—අවයවයන් රූපණය නොකොට, (අවයවිවූ) මුඛය මතු පද්මය කොට රූපණයකළ හෙයින් අවයවිරූපක නම්. **අවයවිරූපකයි.**

> **140.** මදුරත් කොපොල් රත්—නුවන් මහනෙල් නෙත්කල්,
> වුවනතිනි තී මෙ සියල්—දනරැස් රාමුවා වී.

**140.** මදරත් කොපොල්, මන්දරක්තවූ කපොල ඇති; රත් නුවන් මහනෙල්, රක්තවූ නෙත්‍රොත්පල ඇති; නෙත්කල්, නෙත්‍රකාන්තවූ හෙවත් ඇසට ප්‍රියවූ; මෙ තී වුවනතිනි, මේ තිගේ වදනයෙන්; සියල් දනරැස්, සකල ජනරාශිය; රාමුවා වී, රාගමය වී. **ඒකාඞ්ගරූපකයි.**

> **141.** එකඟරූපක මේ—මෙසේ දෙඅඟ තුණඟ වේ,
> සිදුවූ රූපකින් යළ—පලවූ රූපක මෙසේ.

**141.** මේ ඒකාඞ්ග රූපක, මේ (යට කී කම, අවයවිවූ වක්ත්‍රයද සෙසු අවයවයන්ද රූපණයකොට, නෙත්‍රයන් මතු උත්පලත්වයෙන් රූප ණයකළ හෙයින්) ඒකාඞ්ගරූපක නම් වෙයි; මෙසේ දෙඅඟ, මෙ පරිද්දෙන් (අවයවී හා සමහර අවයවයන් හා රූපණයකොට අවයව වයක් රූපණයකළහොත්) ද්ව්‍යඞ්ගරූපක නම් වෙයි; තුණඟ වේ, (තුන්අවයවයක් රූපණය කළහොත්) ත්‍ර්‍යඞ්ගරූපක නම් වේ; සිදුවූ රූපකින්, සිද්ධවූ රූපකයෙන්; යළ, නැවත; පලවූ රූපක, ව්‍යක්තවූ රූපකයද, මෙසේ, මෙ පරිද්දෙනි. **ද්ව්‍යඞ්ගාදිරූපක ලක්‍ෂණයි.**

> **142.** සිනා සුදු කුසුමු—දුල සසල නෙත් බිඟු තී,
> වුවනත වියත කුසුම්—බිඟු සියොවින් යුත් කියත්.

**142.** සිනා සුදු කුසුමුදුල, ස්මිත නමැති ධවලකුසුමයෙන් උජ්වලි තවූ; සසල නෙත්, චචලවූ නෙත්‍ර නමැති, බිඟු, භෘඞ්ගයන් ඇති; තී වුවනත, තිගේ වක්ත්‍රයයි; වියත, කියත්හොත්; කුසුම් බිඟු, කුසුම හා භෘඞ්ගයන්ගෙන්; සියොවින්, යුක්තවීමෙන්; යුත් කියත්, මේ යුක්ත (රූපක) යයි කියත්. **යුක්තරූපකයි.**

> **143.** කොමල සිනා සිසි—රස් සිනිදු නෙතුපුලුවත්,
> වියතුපුල් සිසිරස් හා—නොයුතින් මෙ අයුතු නම්.

**143.** කොමල සිනා, කොමලස්මිත නමැති; සිසිරස්, චන්ද්‍රරශ්මි ඇති; සිනිදු නෙත්, ස්නිග්ධවූ නෙත්‍ර නමැති; උපුල්, උත්පල ඇති; වුවන්, වක්ත්‍රයයි; වියත්, කියත්හොත්; උපුල්, උත්පලයන්, සිසිරස් හා, චන්ද්‍රරශ්මි හා; නොයුතින්, අයුක්ත හෙයින්; මෙ අයුතු නම්, මේ අයුක්තරූපක නම් වේ. **අයුක්තරූපකයි.**

> **144.** බුමු බැමලිය සැව්—මදරත් කොපුල් මල්නී,
> වුවන් සිසිමඬලෙන් තී—දිනත පියල් දිය සියල්.

**144.** බුමු බැමලිය, භ්‍රාන්තවූ භෲලතා නමැති; සැව්, චාප ඇති;

මදරත්, මන්දරකාවූ, කොපුල්, කපොල ඇති; ති වුවන්, තිගේ වදන නමැති; සිසිමඬලෙන්, චන්ද්‍රමණ්ඩලයෙන්; මල්හි, පුෂ්පශරතෙම; සියල් දිය දිනන, සකලජගත් ජයගණුන්; පියල්, ප්‍රබලයි. මෙහි—සමහර අවයවයන් රූපණය කොට, සමහරක් රූපණය නොකළ හෙයින් හා අවයවී රූපණයකළ හෙයින්ද, විෂමරූපක නම්. **විෂම රූපකයි.**

145. මුදුන් ලග නුබගඟ—දල වැරැලි පියුම්නැබ,
සරණත දිත බියෙන් මුත්—සුර සොම්නස්දද දෙනේ.

145. මුදුන් ලඟ, (තමාගේ) ශිරස්හි ලඟනවූ; නුබගඟ දල, ආකාශ ගඞ්ගාජල නමැති, වැරැලි, වස්ත්‍ර ඇති; දිත බියෙන් මුත්, අසුරභයින් මුක්තවූ; සුර, දෙවියන්ගේ; සොම්නස් දද, සන්තොෂධවජයක්වූ; පියුම්නැබ, පද්මනාභිහුගේ හෙවත් විෂ්ණුහුගේ; සරණත, චරණය; දෙනේ, ජයගණී. මෙහි–විෂ්ණුහුගේ පාදයතෙම තමාකෙරෙහි නුතු ආකාශගඞ්ගාජල නමැති වස්ත්‍ර ඇති දෙවියන්ගේ උත්සවධවජයෙ කැයි සවිශෙෂණව කී හෙයින්, සවිශෙෂණරූපක නම් වේ. **සවිශෙෂණරූපකයි.**

146 නොමුහුලූකෙරෙ පියුම්-ඉඵ නොදබෙමෙ නුබෙ වුවන්,
සිසි ති වැටේ මෙ තමා—මරණට යත් විරුදු නම්.

146. ති වුවන් සිසි, තිගේ වක්ත්‍රචන්ද්‍රතෙම; පියුම්ඉඵ පද්මවනය; නොමුහුලු කෙරෙ, මුකුලිත නොකරන්නේය, නුබෙ, නභස්හිද; නොදබෙමෙ, භ්‍රමණයද නොකරන්නේය; මෙ තමා මරණට, මේ මාගේ මරණයට; වැටේ යත්, වැටෙන්නේය හෙවත් හෙතුවන්නේ යයි කියත්හොත්; විරුදු නම්, විරුඬ නම් වේ. මේ චන්ද්‍රයා විසින් කළමනා ක්‍රියා නොකොට, අන්‍ය ක්‍රියාවක් කරණ හෙයින්, විරුඬ රූපක නම්. **විරුඬරූපකයි.**

147. ගැඹිරිනි තො දලනිදු—සරින් මෙර තෙදින් හිරු,
කැමතියතද, බැව්නුදු—පිළි කප්තුරු මුලුදියේ.

147. තො, තෝ වනාහි; ගැඹිරිනි, ගම්භීරත්වයෙන්; දලනිදු, සාගරයෙහි; සරින්, සාරත්වයෙන්; මෙර, මෙරුයෙහි; තෙදින්, තෙජසින්; හිරු, සූර්‍ය්‍යයෙහි; පිළි, නැවත; මුලුදියේ, සමස්තලොකයෙහි; කැමතියතද, බැව්නුදු, අභිෂ්ටාර්ථදායක බැවින්ද; කප්තුරු, කල්පද්‍රුමයෙහිය. **හෙතුරූපකයි.**

148. ති වුවනත තඹුරු—මේ රජහස් බජත් වත්,
සිරිතුදුල ලකළ මුහුලු—සියහ දියෙහි වොරජනේ.

148. රජහස්, රාජොත්තමයන් නොහොත් රාජහංසයන්; බජත් වත්, භජනයකරන්නට සුදුසුවූ; ලකළ, අලඞ්කෘතවූ; මුහුලුසිරිතුදුල, ධම්මිල්ලශ්‍රීන් උජ්වලිතවූ (නොහොත්) අලඞ්කෘතවූ මුකුලිතශ්‍රීන්

උජ්වලවූ; මේ තී, මේ තීගේ; වුවනත තඹුරු, මුඛනමැති තාමරසය තෙම; සියහ, සතතයෙන්, දියෙහි, ජගත්හි හෝ ජලයෙහි; මොරජනේ, විරාජමානවන්නේය. **ශ්ලිෂ්ටරූපකයි.**

149. මෙදෙන් රත්පැහැ පත්—මෙ ති වුවන් සුපුන්සඳ,
සඳකැලුමන් මැද ලද—උදයගෙහි සඳ බදු වී.

149. මෙදෙන්, මදයෙන්; රත්පැහැ පත්, රක්තප්‍රභාප්‍රාප්තවූ; තී, තීගේ; මෙ වුවන් සුපුන්සඳ, මේ වක්ත්‍ර නමැති සම්පූර්ණ චන්ද්‍රතෙම; සඳකැලුමන් මැද ලද, සන්ධ්‍යාකාන්ති මධ්‍යයෙහි ලද්දාවූ; උදයගෙහි, උදයපර්වතාග්‍රයෙහි; සඳ බදු වී, චන්ද්‍රයා වැනි වී. **උපමාරූපකයි.**

150. උළිඳු සුරනට වී—තමහට ති වුවන් සඳ,
ගේ නොපිරුණේ මද වේ—සියහ සුපුන්විලස් මේ.

150. උළිඳු, චන්ද්‍රතෙම; සුරනට වී, දෙවතාවන්ට විය; ති වුවන් සඳ, තීගේ මුඛචන්ද්‍රතෙම; තමහට වී, අපහට විය, ගේ, ඒ චන්ද්‍රතෙම; නොපිරුණේ මදවේ, (කලෙක්හි) අසම්පූර්ණමද වෙයි; මේ, (මේ තීගේ මුඛචන්ද්‍ර) තෙම; සියහ, සතතයෙන්; සුපුන් විලස්, සම්පූර්ණ විලාස ඇත්තේය. මෙහි—ආදි සාම්‍යකොට තබා පසුව වෙනසක් කී හෙයින් ව්‍යතිරේක රූපක නම් වේ. **ව්‍යතිරේක රූපකයි.**

151. පැණෙමිනනුන් මෙසේ—තවනා කලදහම් යුත්,
වුවනත සඳට ති දූත්—පියබඳ නැත උළිඳුබැව්.

151. පියබඳ, ප්‍රියදෙහ ඇත්තිය; පැණෙමින්, දෘශ්‍යමාන වෙමින්; මෙසේ, මේ ආකාරයෙන්; අනුන්, අන්‍යයන්; තවනා කලදහම් යුත්, තාපනය කරණ බලස්වභාව ඇති; ති වුවනත සඳට, තීගේ වදනචන්ද්‍රයාට; දූත් උළිඳුබැව් නැත, දූත් උඩුරාජභාවය නැත හෙවත් චන්ද්‍රත්වය නැත. මෙහි—චන්ද්‍රයාකෙරෙහි අවිද්‍යමානවූ අනුන් තවන ගුණය මුඛචන්ද්‍රයාට ඇතිහෙයින්, චන්ද්‍රත්වය නවතනලද්දනුයි, ආක්ෂෙප රූපක නම් වේ. **ආක්ෂෙපරූපකයි.**

152 ති වුවනත් සඳද—තවා මෙ දරුණුව තමා,
තමා කළ පව්නෙව්යත්—සමදත්රූපක වියත්.

152. ති වුවනත් සඳද, තීගේ මුඛචන්ද්‍රයාද; දරුණුව, දාරුණ්‍ය ගුණෝපෙතව; තමා තවා, මා තවයි; ඒ, ඒ වනාහි; තමා කළ පවින් වියත්, තමා කළාවූ පාපකර්මයෙන් වෙයයි කියත්; .මෙ සමදත්රූපක වියත්, මේ සමාධානරූපකයයි කියත්. මෙහි—මුඛචන්ද්‍රයා කරණ තාපය තමාගේ කර්මබලයෙන්ම වීයයි ගිවිස ඉවසූ හෙයින්, සමාධාන රූපක නමි. **සමාධානරූපකයි.**

153. වුවන් පිඹුම් පළ—රහෙහි ති බැමලිය නිළි,
ලීලා නැටුම් පෑ නිති—මන කාං නොගන්ති සියල්.

153. තී, තීගේ; බැමලිය නිළි, භ්‍රෑලතා නමැති නාටිකාතොමෝ; වුවන් පිඹුම්, මුඛපද්ම නමැති; පළරහෙහි, ව්‍යක්තරඞ්ගයෙහි; නිති,

නිරන්තරයෙන්; ලීලා නැටුම් පැ, ලීලානෘත්‍ය දක්වා; සා, සාගේ, සියල් මන නොගත්ති, සජීවිතත පැහැරගනාගණීද. මෙහි—මුඛය පද්මය කොටලා නැවත රඞ්ගසවයෙන් රූපණයකල හෙයින්ද; භෲ ලතාව කොටලා නැවත නත්තකී කොට රූපණයකල හෙයින්ද, රූපකරූපක නම්. **රූපකරූපකයි.**

**154**. මෙ වූවත් පියුම් පිළි—නො නී නුවන් බමරයුග,
කෙසුරුමය නො දසන්රස්—පියවුරු නො නී රත්හස්.

**154.** මෙ නී වුවත් නො, මේ නීගේ වදනය නොවෙයි; පියුම්, පද්මයෙකි; පිළි, නැවත; මෙ නී නුවන් නො, මේ නීගේ නෙත්‍ර (වය) නොවෙයි; බමරයුග, භ්‍රමරයුගමයෙකි; මෙ නී දසන්රස් නො, මේ නීගේ දන්තරශ්මිය නොවෙයි; කෙසුරුමය, කෙශරමැයි; මෙ නී පියවුරු නො, මේ නීගේ පයොධර නොවෙයි; රත්හස්, සුවර්ණහංස යෝයි. මෙහි—ඇති තත්වය වළකා අන්‍යපදාර්ථයෙහිම රූපණයකල හෙයින්, තත්වාපහනවරූපක නම්. **තත්වාපහනව රූපකයි.**

**155.** උවම් රූපක දෙකැ—කරනත් නැත් මුලුවිකප්,
සෙසුහුදු මෙ මගිනි වියත්—කිවිනනුමත් කරත් පුත්.

**155.** උවම් රූපක දෙකැ, උපමාලඞකාර රූපකාලඞකාර දෙක්හි; මුලුවිකප් කරත්, සමස්තවිකල්පනය කරත්හොත්; අත් නැත්, අන්‍ය යෙක් නැත (හෙවත් සියලුභෙදය කියත්හොත් පය්‍යීනත නැත); සෙසුහුදු, (මෙසින්) අවශිෂ්ටවූ (තොකි) උපමා රූපකද; මෙ මගිනි වියත්, මේ මාර්ගයෙන් කියත්; කිවින්, (ව්‍යක්ත) කවින් විසින්; අනුමත් කරත් පත්, අනුමතකරත් සුදුසුයි.

රූපකාලඞකාර නිමි.

---

**156.** දීපක නම් වෙ දෑ—කිරිය ගුණ වත් දක්වා,
සිටි කව මුලුතෙපලනට—වහල් වදනෙක්හි මෙසේ.

**156.** දෑ, ජාතිය; කිරිය, ක්‍රියාය; ගුණ, ගුණය; වත්, ද්‍රව්‍යය (යන මේ); දක්වා, පැ; කව එක්හි සිටි, පද්‍යයෙහි (ආදි, මධ්‍ය, අන්ත යන මෙසින් යම්) එක් ස්ථානයෙක්හි සිටියාවූ; මුලුතෙපලනට වහල්, සමස්ත ශබ්දයන්ට උපකාරවූ; වදන්, වචනය; දීපක නම් වෙ, දීපකාලඞකාර නම් වේ; මෙසේ, (ඒ) මෙපරිද්දෙනි.

**157.** දකුණු මරු තුරුහිස්—සලා හරි පරණලා,
වැටේ නවපියන් යළ—මන වතළ මන් බිඳුමට.

**157.** දකුණු මරු, දක්ෂිණ මාරුතයතෙම; තුරුහිස් සලා, වෘක්ෂ යිෂියන් චලිතකොට; පරණලා හරී, පුරාණපණීයන් හරණේය; යළ, නැවත; නවපියන්, අභිනව ප්‍රජාවත්ගේ; මන වතළ, සිත්හි වැහැරුණාවූ; මන් බිඳුමට, මානයාගේ භඞ්ගයට; වැටේ, පවත්නේය.

මෙහි—දක්‍ෂිණමාරුතය ජතිව කව ආදියෙහි සිටගෙණ, උභයවාක්‍ය යටම උපකාරවූ හෙයින්, ජාත්‍යාදි දීපක නම වෙයි. ජාත්‍යාදි දීපකයි.

158. සෙරෙත් සිවුසයුරු—හිමිනැතුළු සක්වලෙහි,
ගජරජනු තා දුබුදු කොඳ—වන සුදු යසපබඳහුදු.

158. සිවුසයුරු හිමින් ඇතුළු, චතුස්සාගර සීමායෙන් ඇතුළත්හි; තා ගජරජනු, තාගේ ගජරාජයෝ; සෙරෙත්, සඤ්චාරණය කෙරෙත්; දුබුදු කොඳවන සුදු, ප්‍රබුඬවූ කුඤ්ඤවනයක් සේ ශුභ්‍රවූ; යසපබඳහුදු, (තාගේ) යශස්ප්‍රබන්ධයෝද; සක්වලෙහි, චක්‍රවාටයෙහි; (සෙරෙත්, සඤ්චාරණය කෙරෙත්.) මෙහි—"සෙරෙත්" යන ක්‍රියාව කව ආදියෙහි සිටගෙණ උභයවාක්‍යයටම උපකාරිවූ හෙයින් ක්‍රියාදි දීපක නම් වේ. ක්‍රියාදි දීපකයි.

159. සුනිල්පැහැ වුනු නිති—දිගුනු බදපවුසමෙයින්,
පොලොනුදු සුසිනිදු ලද—නවසදලරුස්නි සියල්.

159. දිගුනු, දික්නු; නිති, නිරන්තරයෙන්; බදපවුසමෙයින්, බඬවූ ප්‍රාවෘට් මෙඝය කරණකොටගෙණ; සුනිල්පැහැ වුනු, සුනීලප්‍රභා වූහ; සියල් පොළොනුදු, සකල පෘථිවිහුද; සුසිනිදු, සුස්නිග්ධවූ; ලද, තරුණවූ; නවසදලරුස්නි, අභිනව ශාඞ්වලරාශියෙන් හෙවත් අලුත් තණ රැසින්, (සුනිල්පැහැ වුනු, සුළුවූනීලවූ ප්‍රභා ඇතිවූහ.) මෙහි—"සුනිල් පැහැ" යන ගුණය කව ආදියෙහි සිටගෙණ, උභයවාක්‍යයටම උප කාරි වූ හෙයින්, ගුණාදි දීපක නම් වේ. ගුණාදි දීපකයි.

160. නරණ විසින් පළ—වික්මෙන් යුතසුරසියන්,
සිරිසර කවර නොපැලූ—සුරනිදුනු නො කවර පත්.

160. පළ වික්මෙන් යුත්, ව්‍යක්තවූ ත්‍රිපදවික්‍රමයෙන් යුක්තවූ; නරණ විසින්, නාරායණයා විසින්; අසුරසියන්, අසුරශතයන්ගේ; කවර සිරිසර, කවර නම් ශ්‍රීසාරයෙක්; නොපැලූ, නොපලවනලදද; සුරන්, දෙවතාවන්ට; කවර ඉදුනු නොපත්, කිනම් සෘඬිකෙනෙක් නොපමුණුවනලදද හෙවත් කවර සමෘඬියක් නොකරණලදද. මෙහි "නාරායණ" යන ද්‍රව්‍යය කව ආදියෙහි සිටගෙණ, උභයවාක්‍යයටම උපකාරිවූ හෙයින්, ද්‍රව්‍යාදි දීපක නම්. ද්‍රව්‍යාදි දීපකයි.

161. මෙකී හැමම පෙර—දීපකය මින් මෙ සියල්,
වදනුන් මැදවසන්හිදු - පිළි දක්වම් හෙ මෙසේ.

161. මෙකී හැමම, යථොක්තවූ කවි සතරම; පෙරදීපකය, පූර්වදීපකයි; මින්, මෙපරිද්දෙන්; මෙ සියල් වදනුන්, මෙ සියලු (ජාති, ක්‍රියා, ගුණ, ද්‍රව්‍ය වාචිවූ) වචනයන්; මැදවසන්හිදු, මධ්‍යවසානයෙහිද වෙයි; පිළි, නැවත; හෙ මෙසේ දක්වම්, ඒ මේ ආකාරයෙන් දක්වමි.

162. නටත් ගයත් කෙකා—රැවින් බෙසද මුදුනේ,
සිකිනිඳුහු බඳිති නුවන්-ගෙනෙ සොම්නසැස්දරගැබි.

162. සිකිනිඳුහු, මයුරරාජයෝ; බෙසද මුදුනේ, පළිත වෙබලා ශිඛරයෙහි; නටත්, නෘත්‍යකෙරෙත්; කෙකා රැවින්, කෙකා රාවයෙන්; ගයත්, ගායනා කෙරෙත්; සොම්නසැස්දරගැබි, සන්තොෂාශ්‍රුධාරා ගර්භකොට ඇති හෙවත් සතුටුකඳුලු සිලියෙන; නුවන්, නෙත්‍රයන්; ගෙනෙ බඳිති, මෙඝයෙහි බඳිති හෙවත් මෙඝය බලත්. මෙහි—සිකිනිඳුහු යන ජාතිවචනය කව මධ්‍යයෙහි සිටගෙණ තුන්වාක්‍යයටම උපකාරිවූ හෙයින්, ජාතිමධ්‍ය දීපක නම්. **ජාතිමධ්‍ය දීපකයි.**

163. මඳසුවඳැති සිහිල්—නල කර වෙ සඳරැස් සමු,
හුතැස් පිළි සඳනලෙවුන්—ගන සත්වැසි වියෝනට.

163. වියෝනට, වියොගීන්ට; මඳ, මඳවූ; සුවඳැති, සුගන්ධවත්වූ; සිහිල්, සීතලවූ; නල, මාරුතය; කර වෙ, ක්ෂාරයක් වන්නේය; සඳරැස්, චන්ද්‍රරශ්මිය; සමු, සම්මුඛවූ; හුතැස්, වහ්නියෙක් වන්නේය; පිළි, නැවත; සඳනලෙවුන්, චන්දනාලෙපය; ගන සත්වැසි, ඝනවූ ශස්ත්‍රවර්ෂා වේ. මෙහි—"වෙ" යන ක්‍රියාව කව මධ්‍යයෙහි සිටගෙණ තුන්වාක්‍යයටම උපකාරිවූ හෙයින් ක්‍රියාමධ්‍ය දීපක නම්. **ක්‍රියාමධ්‍ය දීපකයි.**

164. දල දලදරිනුතුළ—විමන් සිකි නළන් කැල,
සල සිය විදුකිඳුහුඳු—බල කුසුම්විය මෙ සියල්

164. දලදරින් උතුළ, ජලධාරාවෙන් හෙවත් මෙඝයෙන් අතිරික්තවූ; දල, ජලයද; විමන් සිකි නළන් කැල, ගෘහමයූර නාටකයන්ගේ සමූහයද; සල, චචලවූ; සිය විදුකිඳුහුඳු, ශතවිද්‍යුත්කලාපයෝද (යන); මෙ සියල්, මේ සියල්ල; කුසුම්අවිය බල, කුසුමායුධයාගේ සෙනඟයි. **ජාත්‍යන්ත දීපකයි.**

165. නි සවණ සවණිඳු—වර සැර සැව් මුවරදද.
තමා මන මරුහිඳු—සමකල්හි තුන් මෙ කෙළේ.

165. නි සවණ, නීගේ කර්ණයෙහි; සවණිඳුවර, කර්ණෙන්ද්‍රාත්පලයද; මුවරදද, මකරධවජයාගේ හෙවත් අනඞ්ගයාගේ; සැව්, චාපයෙහි; සැර, ශරයද; තමා මරුහි, මාගේ මරණයෙහි; මනඳු, සිතද (යන); මෙ තුන්, මේ තුණ; සමකල්හි කෙළේ, එකවට කරණලදී. **ක්‍රියාන්තදීපකයි.** මේ දෙක්හි-"බල" යන ජාතිය හා "කෙළේ" යන ක්‍රියාව හා දෙක අන්තපාදයන්හි සිට තුන්වාක්‍යයටම උපකාරි වී.

166. මැද ගුණවත් වසනැ——එද වත් කියත් පත් මේ,
මෙගින් සැකෙව්න් උසුරු—අන් වදනුඳු පවුත් යුත්.

166. මැද, මධ්‍යයෙහි; ගුණ වත්, ගුණ හා ද්‍රව්‍යද; අවසනැ, අවසානයෙහිද; එද, ඒ ගුණ ද්‍රව්‍යද (යන); මේ, මෙය; කියත්, කථනය කරන්නට; පත්වත්, ප්‍රාප්ත වුවහොත්; මෙ ගින්, මේ අකාරයෙන්;

සැකෙවින් උසුරු, සඞ්ක්‍ෂෙපයෙන් කථිතවූ (සූක්‍ෂ්මවූ); අන් වදනුදු, අන්‍ය වචනයන්ද, පවුත් යුත්, [මෙසේම] පාඨට යුක්තයි.

මෙතැන්හි මුල දණ්ඩාලඞ්කාරයෙහි නොදක්වූ—ගුණමධ්‍ය දීපක, ද්‍රව්‍යමධ්‍ය දීපක, ගුණාන්ත දීපක, ද්‍රව්‍යාන්ත දීපක යන මොහු මෙ තැන අවශ්‍යයෙන්ම පැවමනා වීනම්, මෙසේම, අනික් තැනෙකත් සඞ්ක්‍ෂෙපයෙන් දක්වූ දෙයෙහි සූක්‍ෂ්මයකුදු විස්තරකොට කිවමැනව, එතකුදු වුවත් එසේ නොකියම්හ යනු භාවයි.

167. පෙරඩමස සිසිහට—වැඩුමට හෙද කඳප්හට,
කඳපුදු රමනට හෙද—දහර මනදෙළ කෙළියට..

**167.** පෙරඩමස, පූර්වාභිමාසයතෙම් හෙවත් පෙර දෙපෝය, සිසිහට වැඩුමට, චන්ද්‍රයාහට වෘද්ධිය පිණිස වන්නේය, හෙද, ඒ චන්ද්‍රයාද; කඳප්හට, කන්දර්පයාට වැඩීමපිණිස වන්නේය; කඳපුදු, කන්දර්පයාද; රමනට, රාගචිත්තයාගේ වැඩීම පිණිස වන්නේය, හෙද, ඒ රාග චිත්තයද; දහර, තරුණයන්ගේ; මනදෙළ කෙළියට, මනොරථ ක්‍රීඩාව වැඩීම පිණිස වන්නේය. **මාලාදීපකයි.**

168. විදුළු පියගඳ තුඟු—තමල්ලිය නිල් නෙත්කල්,
බෙමෙත් දළදරහු නුබේ—මිහිහි මදමත් ඇත්හුදු.

**168.** විදුළු පියගඳ, විද්‍යුත් ශ්‍රීවූ ප්‍රියඞ්ගු ඇති; තුඟු, උස්වූ; තමල් ලිය නිල්, තමාලලතා සේ නිල්වූ; නෙත්කල්, නෙත්‍රක්‍රාන්තවූ; දළ දරහු, මෙඝයෝ; නුබේ, නභස්හි; බෙමෙත්, භ්‍රමණයකෙරෙත්; මද මත් ඇත්හුදු, මදයෙන් මත් හස්තීහුද; මිහිහි, පෘථිවියෙහි; (බෙමෙත්, භ්‍රමණය කෙරෙත්). මෙහි—ගර්ජනත්වාදි ගුණයන් මෙඝ හස්ති දෙකට සමහෙයින්, මේ ශ්ලිෂ්ටදීපක නම්. **ශ්ලිෂ්ට දීපකයි.**

169. කඳප්හු දප් වඩත්—බද දලදරහු රුසිරු,
කෙරෙත් තුනු ගිම්හු හමල—පවනසිනුතුළ තෝබිදු.

**169.** රුසිරු, මනොඥවූ; බද දලදරහු, බද්ධවූ මෙඝයෝ; කඳප්හු දප් වඩත්, කන්දර්පයාගේ දර්ප වඩත්නාහ; හමල පවනසින්, හැමූ පව නින්; උතුළ තෝබිදු, උද්ධූතවූ ජලකණිකාවෝ; ගිම්හු දප්, ග්‍රීෂ්මයාගේ දර්පය; තුනුකෙරෙත්, තුනීකෙරෙත්. මෙහි—වඩන ක්‍රියාව හා තුනී කරණ ක්‍රියාව හා දෙකින් දලදරහු දප් යන්න හා ගිම්හු දප් යන්න හා දෙකින් යුක්තවන්නේ විරුද්ධ ක්‍රියාහුයි, විරුද්ධාර්ථ දීපක නම් වේ. **විරුද්ධාර්ථ දීපකයි.**

170. හරිත් දිගුත් විතර—ගණිත් තරුවැලද යල,
අදිත් පණුන් මෙ තමා—මහමේහු මෙ වැජඹෙනා.

**170.** වැජඹෙනා, විජෘම්භනය කරන්නාවූ; මෙ මහමෙහු, මේ මහාමෙඝයෝ; දිගුත් විතර හරිත්, (අට) දිගුන්ගේ විස්තරය හන්නාහ; යල, නැවත; තරුවැලද, තාරකාවලියද; ගණිත්, ග්‍රහණය කරත්නාහ; මෙ තමා පණුන්, මේ මාගේ ප්‍රාණයන්; අදිත්, ඇදු

නය කරන්නාහුයි හෙවත් ගන්නාහුයි. මෙහි—"හරිත්, ගණිත්, අදිත්" යයි එක ගැන්මටම කිහෙයින්, එකාර්ථ දීපක නම්. **එකාර්ථ දීපකයි.**

**171.** මලින් සෙලෙස්නෙන්—විරුදතිනෙකතින් මෙසේ,
සෙසුහුදු මෙම නියම්නෙන්—විකපත් පත් කිවිදනා.

**171.** මලින්, මාලායෙන්ද; සෙලෙස්නෙන්, ශ්ලෙෂයෙන්ද; විරු දතින්, විරුද්ධාර්ථයෙන්ද; එකතින්, එකාර්ථයෙන්ද (යුක්තවූ දීපක); මෙසේ, මෙකී අකාරයෙනි; සෙසුහුදු, අවශිෂ්ටවූ දීපකයන්ද; මෙම නියම්ඵනන්, මේ ක්‍රමයෙන්, විකපත්, විකල්පනය කරත් හෙවත් භෙද කියත්; කිවිදනා පත්, කවිජනයාහට ප්‍රාප්තයි.

දීපකාලඞ්කාර නිමි.

---

**172.** පිළි පැවතුම් නමැත්—තුණෙක් අරුත්නිදු පෙදෙන්.
එදෙක්නිදු පිළි පවත්—කැර වත්නෙම් හෙ මෙසේ.

**172.** පිළි, නැවත; පැවතුම් නම්, ප්‍රවෘත්තිනම්වූ අලඞ්කාරයෙක්ද; ඇත්, ඇත; අරුත්නිදු, අර්ථයෙන්ද; පෙදෙන්, පදයෙන්ද; එදෙක් නිදු, ඒ අර්ථ පද දෙකින්දුයි; පිළි, නැවත; පවත්, ප්‍රවෘත්තිතොමෝ; තුණෙක්, තුණෙක් වන්නීය; කැර වත්නෙම්, (එහි ස්වරූපය) කොට ප්‍රකාශකෙරෙම්; හෙ මෙසේ, ඒ මෙසේයි.

**173.** පුබුදි කොලඹිළු පිපෙ—කඳුළු මිනිමුස්සි මුහුළු,
විහිදි දුනුකෙහි කැකුළු—මිනිදූදිරි හෝතුරු පෙල.

**173.** කොලඹිළු, කදම්බවනය; පුබුදි, ප්‍රබුද්ධ වෙයි; කඳුලු පිපෙ, කඳැලි පුෂ්පිත වන්නේය; මුහුලු මිනිමුස්සි, වකුලවෘක්ෂ මනිමොචනය වන්නේය; දුනුකෙහි, රාජකෙතකියෙහි; කැකුළු විහිදි, කුඩ්මල විකසිත වන්නේය; හෝතුරු පෙල, අශොකවෘක්ෂ පඞ්ක්තිය; මිනිදූදිරි, මනිජජ්ජර* වන්නේය. මෙහි—පදයන්ගේ වෙන්බව මුත්, එක් ප්‍රබුද්ධාර්ථයම පස්තැනෙක පෙණුනු හෙයින් අර්ථාවෘත්ති නම් වි. **අර්ථාවෘත්තියි.**

**174.** දෙනෙ වසත් සහමල්—පලු ලිය තුරින් සසිරි,
දෙනෙ මුවර දෙදෙ සියල්—ලියසැව්හි මල්හීයෙන්.

**174.** සහමල් පලු, පුෂ්පඵලලම සහිතවූ; ලියතුරින්, ලතාද්‍රැමයෙන්; සසිරි, සශ්‍රීකවූ; වසත්, වසන්තකාලයතෙම; දෙනෙ, ජනිත වන්නේය; මුවරදෙදෙ, මකරධ්වජතෙම; ලියසැව්හි, ලතාචාපයෙහි; මල්හියෙන්, පුෂ්පශරයෙන්; සියල්, සමස්ත (ලොකය); දෙනෙ, ජයගන්නේය. මෙහි—වෙන වෙන අර්ථවත්වූ "දෙනෙ" යන්න දෙපදයෙහිම පෙණුන හෙයින් පදාවෘත්ති නම්. **පදාවෘත්තියි.**

---

* ජජ්ජරිත—සමහර.

175. දනා සියල් හිමි—වෙසේ දූන් ඇතොරන් හා,
වෙසේ දෙව්සරන් හා—පිළි රුපුවග න සග පත්.

**175.** හිමි, ස්වාමිතෙම; සියල් දනා, සියල්ලන් ජයගෙණ; දූන්, මෙකල්හි; ඇතොරන් හා, අන්තඃපුරවාසීන් සමග; වෙසේ, වාසය කරන්නේය; පිළි, නැවත; න රුපුවග, තාගේ ශත්‍රුවර්ගතෙමේ; සග පත්, ශ්වර්ගප්‍රාප්තවූයේ; දෙව්සරන් හා, දිව්‍යාඞ්ගනාවන් සමග; වෙසේ, වාසයකෙරේ. මෙහි—එකාර්‍ථවූ "වෙසේ" යන්න පෙරළා දුටුහෙයින් උභයාවෘත්ති නම්. **උභයාවෘත්තිසි.**

ආවෘත්ත්‍යලඞ්කාර නිමි.

---

176. අකෙව් නම් පිළිසෙව්—ගේ කල්විසින් තුන් සේ.
වැළකුම් වතුන් හේතිදු—හෙම වේ අනත මේ ගින්.

**176.** අකෙව් නම්, ආක්‍ෂෙප නම්; පිළිසෙව්, ප්‍රතිෂෙධය හෙවත් වැළකීමයි; හේ, ඒ (ආක්‍ෂෙපය) තෙම; කල්විසින්, කාලවශයෙන්; තුන් සේ, (භූත, භවිෂ්‍යත්, වර්‍තමාන යන) තුන්ප්‍රකාර වන්නේය; වැළකුම් වතුන්, වැළකියයුතු වස්තූන්ගේ; හේතිදු, හෙතුවෙන්ද; හෙම, ඒ (ආක්‍ෂෙපය) ම; මේ ගින්, මෙපරිද්දෙන්; අනත වේ, අනන්ත වේ.

177. පස්කුසුම් සෙරෙන්—දිනී මුවරදෙදෙ සියල්,
ඉතිදුහොත් නොහැදහුම්—වත් ගේ විසිතුරු වත්.

**177.** මුවරදෙදෙ, මකරධ්වජයා; පස්කුසුම් සෙරෙන්, පඤ්චකුසුම ශරයෙන්; සියල් දිනී, සකලලොකය ජයගත්තේය; ඉතිදුහොත්, මෙසේද වත්; නොහැදහුම් වත්, අසම්භාවනාවට යුක්තය නොහොත් එසේ නොවෙත්; වත්හේ, වස්තු ශක්තිය; විසිතුරු, විචිත්‍රයි. මෙහි අනඞ්ගයා මල්හි පසකින් මුලුලෝ දිනීය යනු නොහැදහිය හැක්කේද, වස්තූන්ගේ ශක්තිය අචින්ත්‍ය හෙයින්, නොවෙතියි නැතැයි තමාට උපන් අසම්භාවනාව දුරුකළ හෙයින් භූතවූ ශඞ්කාවගේ ආක්‍ෂෙපයනුයි භූතකාලාක්‍ෂෙප නම් වේ. **භූතකාලාක්‍ෂෙපයි.**

178. කුමක් ගේ කෙරෙහි—සවණ්දුවර සවන්හී,
මෙ කම්හි නි දිගුනෙත්—නොපමණ විකුම් හැහව්.

**178.** කුමක් හේ, කවර කාරණයෙකින්; සවණ්දුවර, කර්‍ණොත්පලය; සවන්හි කෙරෙහි, කර්‍ණයෙහි කෙරෙහිද හෙවත් කණ තබයිද; නි දිගුනෙත්, තිගේ දිඝීවූ නෙත්‍රය; මෙ කම්හි, මේ ක්‍රියායෙහි හෙවත් කණ හෙබවීමෙහි; නොපමණ විකුම්, අප්‍රමාණ වික්‍රමයන්; හැහව්, දක්වී. කර්‍ණයෙහි කණුපුල් කුමට තබයිද; කණ සරහන්නට තිගේ දික්ඇස්ම පමණවේදැයි කර්‍ණොත්පල තබන තැනැත්තිය වැළකූ හෙයින් වර්‍තමානාක්‍ෂෙප නම්. **වර්‍තමානාක්‍ෂෙපයි.**

179. අත් ලවනත ලගත්—ලාරස රත් නෙත් දකුත්,
තෝ නොලබා තමා හිමි—හදහා මා මේ වදත්.

179. හිමි, ස්වාමිය; අත් ලවනත, අන්‍යඞ්ගනාවන්ගේ අධරයට; ලගත්, ලගත්හොත්; ලාරස රත්, (එහි) ලාක්‍ෂාරසයෙන් රක්තාවූ; නෙත්, නෙත්‍රයෙන්, තමා දකුත්, තමා දක්නට; තෝ නොලබා, තෝ නොලබන්නෙහිය; මා මේ වදත්, මාගේ මේ වචනය; හදහා, ගිවිසූ. මෙහි—අන්‍ය ස්ත්‍රියකගේ අධරයෙන් තැවරුණු ලාක්‍ෂාරස යෙන් රත් ඇසින්, තෝ මා දක්ක නොහෙන්නෙහිය කියා, මතු අපරාධයක් නොවුව මැනවැයි ආදිම ස්වාමියා වැළකූ හෙයින්, අනාගතාක්‍ෂෙප නම් වේ. අනාගතාක්‍ෂෙපයි.

180. ඉකුත් කල් විසා—පෙර කියෙ වත්මන් කල්,
පිළි කියෙ අනාවිසා—කල්කෙළෙ යළ කියේ.

180. පෙර කියෙ, පළමු කියේ; ඉකුත් කල් විසා අතීතකාල (විෂයවූ ආක්‍ෂෙප) යයි; පිළි කියෙ, දෙවැනිව කියේ; වත්මන් කල්, වර්තමාන කාල (විෂයවූ ආක්‍ෂෙප) යයි; යළ කියෙ, නැවත (තුන්වැනිව) කියේ; අනාවිසාකල් කෙළෙ, අනාගතකාල විෂයකරණලද්දේයි.

181. නි සිය‍ලඟ වතළ—මෙ කොමලබැව් නොසැබැවී,
ඉදි හෙ සැබවෙක් වීනම්—කිම රදවා තමා හිද.

181. නි සියලඟ, නිගේ සකලශරීරයෙහි; වතළ, ව්‍යාප්තවූ; මෙ කොමලබැව්, මේ කොමලත්වය; නොසැබැවී, සත්‍ය නොවේ; ඉදි, ඉදින්; හෙ, ඒ කොමලත්වය; සැබවෙක් වීනම්, සත්‍යයෙක් වීනම්; තමා හිද, මාගේ හෘදය; කිම රදවා, කුමට රිදවන්නේද. මෙහි—ශරීරමාර්දවය රූජරූපකවූ ක්‍රියාවෙන් වැළකූ හෙයින්, ධර්මාක්‍ෂෙප නම්. ධර්මාක්‍ෂෙපයි.

182. පියබඳ හො මෙ නොවේ—කෙසේ මෙ අතුරු දුනේ,
පැනේ මතු පැහැපබද—පැහැ ඇසිර ඇස්හි නොහේ.

182. මෙ පියබඳ හො, මේ රූපකාන්තාව දෝහෝ; නොවේ, නොවේදෝහෝයි; මෙ අතුරු, මේ අන්තරය; කෙසේ දුනේ, කවරලෙස හැඟේද; පැහැපබඳ මතු, ප්‍රභාප්‍රබන්ධ මාත්‍රයක්; පැණේ, පෙණෙන්නේය; පැහැ ඇසිර, ප්‍රභාවට ආශ්‍රය (රූපය) වනාහි; ඇස්හි නොහේ, නෙත්‍රයෙහි නොහෙන්නේය. මෙහි—ප්‍රභාව පෙණෙන හෙයින්ද, ආශ්‍රයවූ රූපය නොපෙණෙන හෙයින්ද, කාන්තාව බවත් නොවන බවත් නොහැඟෙයි කී හෙයින්, අවයවීහුගේ නැවතීමනුයි, ධර්මාක්‍ෂෙප නම් වේ. ධර්මාක්‍ෂෙපයි.

183. දෙනෙත් රත්පැහැ ගත්—නොමසන්හුන් ලවන් නි,
බුමුත් රැළි බැමද යළි—වණ දොස් නැත් බිය තමා.

183. නි, නිගේ; දෙනෙත්, උභයනෙත්‍රය; රත්පැහැ ගත්, රක්ත ප්‍රභාව ගත; ලවන්, අධරයද; නොමසන්හුන්, අශාන්තය හෙවත්

වෙව්ලන්නේය; සළු, නැවත; බැමද, හැද; රැලි බුමුත්, රැල්ලෙහි භ්‍රමණය කරන්නීය; දෙස් වණ, දෝෂවියුක්තවූ; තමා, මාගේ, බිය නැත්, භයක් නැත. මෙහි—කොපාවස්ථාව කියා, කාරණවූ භය වැළකූ හෙයින්, කාරණාක්ෂෙප නම්. **කාරණාක්ෂෙපයි.**

184. හත්නි හත් වැද ගත—කල් දුරුවී තමා කල්,
ලියතුරුහු පුල්හු සියල්-පිළි නොමෙලෙම් කුම් කෙරෙම්.

184. ගතකල්, මේඝකාලයතෙම; හත්නි වැදගත්, හාත්පසින් සිහාරගත; තමා කල්, තමාගේ වල්ලභතෙම; දුරුවී, දූරයෙහිය; සියල් ලියතුරුහු, සකලලතාවෘක්ෂයෝ; පුල්හු, ප්‍රබුඬවූහ; පිළි, නැවත; නොමෙලෙම්, නොමලෙම්; කුම් කෙරෙම්, කුමක් කෙරෙම්ද. මෙහි—මරණට කාරණ දක්වා, කාර්‍ය්‍යවූ මරණය නැවතූ හෙයින්, කාර්‍ය්‍යාක්ෂෙප නම්. **කාර්‍ය්‍යාක්ෂෙපයි.**

185. නොතැවිලියට වැටේ—සෙරෙන් මෙ මට තා ගමන්,
යාවුතුය තා යත්හොත්-සැක මෙහි නොමකරත් පත්.

185. තා ගමන්, තාගේ ගමන; මෙ මට, මේ මාහට; සෙරෙන, චිරකාලයකට; තැවිලියට නොවැටේ, සන්තාපය පිණිස නොවන්නේය; තා යත්හොත්, තා යන්නෙහිනම්; යායුතුය, යායුත්තේය; මෙහි, මෙහිලා; සැක නොමකරත් පත්, ශංකා නොකටයුතුයි. මෙහි තාවිසින් තොරකරණලද මා මියන හෙයින් තාගේ ගමන මට බොහෝ කලක් සන්තාපය නොකෙරෙයි, එයට සැක නොකරව; තෝ යෙහිනම් යානුයි අනුඥාමුඛයෙන්ම නැවතූ හෙයින් අනුඥාක්ෂෙප නම්. **අනුඥාක්ෂෙපයි.**

186. යනෙම් වී පල තම—විසිනද වී මේ වදන්,
නොයනුහුදු මේ තා දූන්—තමහට කිමැත් මදපෙම්.

186. අද, අද දවස්; තම විසින්, තාම විසින්; යනෙම් වී, යෙමියි කියා; මේ වදන් පලවී, මේ වචනය ව්‍යක්තවිය; මදපෙම්, මන්දප්‍රෙමවූ; නොයනුහුදු, නොයන්නාවූද; මේ තා, මේ තාවිසින්; දූන්, මෙකල්හි; තමහට කිමැත්, මට කුමන ප්‍රයොජනයෙක් ඇද්ද. මෙහි—යෙමියිකියා සිටිනා සෙනහමඳ තා නොගියත් මට කුමන ප්‍රයොජනයෙක්දැයි රොෂයෙන් ගමන නැවතූ හෙයින්, රොෂාක්ෂෙප නම්. **රොෂාක්ෂෙපයි.**

187. ය යත්හොත් මහබා—තට හිය වේවා මග,
මෙමා එහි දූ වේවා—ගියෙනම් හිමි තෙනක් යම්.

187. මහබා, මහාභාග්‍යවන්තය; යත්හොත් යා, යෙයිනම් යා; තට මග හියවේවා, තට මාර්ගය හිතවේවා; හිමි, ස්වාමිතෙම; යම් තෙනක්, යම් ස්ථානයකට; ගියෙනම්, ගියේවීනම්; එහි, ඒ දෙශයෙහි; මෙමා දූ වේවා, මේ මාගේ ජන්ම වේවා. මෙසේ ආශීර්වාදමුඛයෙන් ගමන නැවතූ හෙයින්, ආශීර්වචනාක්ෂෙප නම්. **ආශීර්වචනාක්ෂෙපයි.**

188. න රුස්වන රුස්නෙම්—නො යැවි යත් පැසැසියෙම්,
පලවේ නොයැවී තමා—වදනුදු කුමක් ම කෙරෙම්.

**188.** න රුස්වන රුස්නෙම්, තට ප්‍රියයක් කැමැත්තෙම්; නො යැවී යත්, තෝ යයි කියත්; පැසැසියෙම්, කැමැත්තෙම්; තමා වදනුදු, තමාගේ වචනයද; නොයැවී පලවේ, නොයයි කියා සඵල වන්නේය; ම කුමක් කෙරෙම්, මම් කුමක් කෙරෙම්ද. මෙහි—යයි කියන්නා කැමැත්තක් ඇතත් නොයයි යන බස පිටත්වන හෙයින්ද, යත්න යෙන් කියා නැවතූ හෙයින්ද, යත්නාක්ෂෙප නම්. **යත්නාක්ෂෙපයි.**

189. අඳසුනෙ අඳනලද—පියබඳ සෙහෙම් න වියෝ,
යමැඳිය නෙත්හි තමා—නහමාද නො කුසුම්සර.

**189.** තමා නෙත්හි, තමාගේ නෙත්‍රයෙහි; යම් ඇඳිය, යම් අඤ්ජනයක් ඇඳියහොත්; කුසුම්සර, අනඞ්ගයා; නොනහමාද, නොදකිද, එ අඳසුන් අඳන ලද, ඒ අදෘශ්‍යාඤ්ජනය ලදහොත්. පියබඳ, ප්‍රියදෙහිය; න වියෝ, තාගේ වියොගය; සෙහෙම්, ඉවසමි. මෙහි—නොලැබෙන අදෘශ්‍යාඤ්ජනය කියාලා, ගම්න උපායෙන් වැළකූ හෙයින්, උපායාක්ෂෙප නමි. **උපායාක්ෂෙපයි.**

190. දම් දූහැම්ය කරුණු—පල ගමනට අනුදැනුම්,
රොසාසී තැත් උවෙනිදු—කරනත් විකප් මේ මග.

**190.** දම්, (යට දැක්වූ) ධර්මාක්ෂෙපය; දූහැම්ය, ධර්ම්‍යාක්ෂෙපය; කරුණු, කාරණාක්ෂෙපය, පල, ඵලාක්ෂෙපය හෙවත් කාර්‍ය්‍යාක්ෂෙපය; ගමනට, ප්‍රයාණප්‍රතිෂෙධ වූ; අනුදැනුම්, අනුඥාක්ෂෙපය; රොස්, රොෂාක්ෂෙපය; ආසී, ආශීර්වචනාක්ෂෙපය; තැත්, යත්නාක්ෂෙපය; උවෙනිදු, උපායාක්ෂෙපය යන මෙකී ලක්ෂණයෙන්ද; අන් විකප් කරත්, අන්‍ය විකල්පනයක් කරත්හොත් හෙවත් සෙසු නොකී පරවශාක්ෂෙපාදිවූ අක්ෂෙපභෙදයක් කරත්හොත්; මේ මග, මේ මාර්ගයි.

ආක්ෂෙපාලඞ්කාර නිමි.

---

191. අතතුරුනැසුම්නමෙ—ලවා යම් වතෙසාහත්,
පොහොසත් වතුන් දක්වා—කියත මේ අටසේ වේ.

**191.** යම් වත් එලවා, යම් වස්තුවක් ප්‍රස්තුත කොටලා; එ සාහත්, ඒ සාධනය කරණු පිණිස, පොහොසත් වතුන්, සමර්ථවූ වස්තූන්; දක්වා කියත්, පෙන්වා කියත්හොත්; අතතුරුනැසුම් නම, අර්ථාන්තරන්‍යාස නම් වෙයි; මේ අටසේ වේ, (ඒ) මේ අෂ්ටප්‍රකාර වේ.

192. දිය පතළේ වෙසෙස්—පිහිටි සෙලෙසත් සවිරුදු,
අපුත්කරු පුතත්මෙක්—පිළි පුත්නොපුත් මෙයිනත්.

**192.** දිය පතළේ, ජගද්ව්‍යාපනය හෙවත් විශ්වව්‍යාපිය; වෙසෙස් පිහිටි, විශෙෂස්ථය; සෙලෙසත්, ශ්ලෙෂාර්ථය; සවිරුදු, සවිරොධය;

අයුත්කර, අයුක්තකාරිය; යුත් අත්මෙක්, යුක්තාත්මකය; පිළි, නැවත; යුත්නොයුත්, යුක්තායුක්තය, මෙසින් අන්, මේ යුක්තායුක්තයෙන් අන්‍යවූ අයුක්ත යුක්තයයි (යන මේ අෂ්ට ප්‍රකාරයෙන් වේ).

193. සිරිමත් ලෝදෙනෙත්—වැනි මේ හිරු සඳහුදු,
බල හත්ගිරි යෙත් කවර—වළකන්නෙ නස්න දහම්.

193. ලෝදෙනෙත් වැනි, ලෝකයට උභයනෙත්‍රාකාරවූ; සිරිමත්, ශ්‍රීමත්වූ; මේ හිරු සඳහුදු, මේ සූර්ය්‍යචන්ද්‍රයෝද; හත්ගිරි යෙත්, අස්ත පර්වතප්‍රාප්ත වන්නාහ; (ඒ එසේමැයි;) නස්න දහම්, නශ්වරවූ ධර්මය; වළකන්නේ, වළක්වන්නේ; කවර, කවරෙක්ද; බල, නිරීක්ෂණය කර. මෙහි—සූර්ය්‍ය චන්ද්‍රයන් අස්තයට යන බව කියා, ඒ සාධනය පිණිස සියලු ධර්මයන් නස්නා බැව් කී හෙයින්, විශ්වව්‍යාපි නම් වේ. **විශ්වව්‍යාපියි.**

194. හරිත් දලදරනු—ලෙව්හි තැවිලි සියල්නට,
මහතුන් ලද්ත්බැව් නම්—පරදුක් දුරුකරන්නට.

194. දලදරනු, මෙඝයෝ; ලෙව්හි, ලෝකයෙහි; සියල්නට, සියල් ලන්ට; තැවිලි හරිත්, සන්තාපය දුරු කරත්; (ඒ එසේමැයි;) මහතුන් ලදත්බැව් නම්, මහෝත්තමයන් ලත් ආත්මභාවය නම්; පරදුක්, පර දුඃඛය; දුරු කරන්නට, දූරීකරණයටයි. මෙහි—මහෝත්තමයන්ගේම ගුණය කී හෙයින්, විශෙෂස්ථ නම්. **විශෙෂස්ථයි.**

195. සනහම්නි ලෝ නැඟි—සියල් සුපුන් සරසඳ,
විමලත්මෝ අමාදෑ—සනහත්නු ලෝවැස්සන්.

195. සුපුන් සරසඳ, සම්පූර්ණ ශරච්චන්ද්‍රතෙම; සියල් ලෝ සන හමින්, සකල ලෝකය සන්තර්පණය කෙරෙමින්; නැඟි, නැංගේය; (ඒ එසේමැයි;) අමාදෑ, අමෘතරශ්මි දායකවූ නොහොත් අමෘත නිර්වාණ දායකවූ; විමලත්මෝ, නිෂ්කලඞ්ක ශරීර ඇත්තෝ නොහොත් රාගාදි මලරහිත නිර්මලචිත්ත ඇත්තෝ; ලෝවැස්සන්, ලෝකවාසීන්; සන හත්නු, සන්තර්පණය කරන්නෝවද. **ශ්ලෙෂාර්ථයි.**

196. වස නම්වද රසව—වලදනෙ දිය මුළුදියේ,.
අමඅත්මෝ සදොස්වද—පරවැඩ කෙරෙත්නු මහත්.

196. දිය, ජලයතෙම; වස නම්වද, විස යන නම් ඇතිවද; මුළු දියේ, සමස්ත ජගත්හි; රසව වලදනෙ, රසභූතව පවත්නේය නො හොත් අනුභවකරන්නේය; (ඒ එසේමැයි) අමඅත්මෝ, ජලාත්මක යෝ නොහොත් අමෘතාත්මකයෝ; සදොස්වද සදොෂවද (සිට); මහත් පරවැඩ කෙරෙත්නු, මහත්වූ පරාභිවෘද්ධි කරන්නෝ වෙද්ද. **සවිරොධයි.**

197. මී කිමෙන් මියුරු—ගෙලෙළනෙලඹද බමරරැව්,
නොකන්කලු සියල්ලෙත්—වියොවුන් පව් තුබූ සේ.

197. මී කිමෙන්, මධුපානයෙන්; මියුරු, මධුරවූ; ගෙලෙන්, කණ්ඨ

යෙන්; එලඹිද, නිශීතවද; බමරරැව්, භෘඞ්ගරාවිතෙම; තොසන්සලු, කර්ණයට කාන්ත නොවෙයි; (ඒ එසේමැයි) වියොවුන් පව්, වියොගීන් ගේ පාපය; සියල්ලෙන්, සර්වාකාරයෙන්; තුබූ සේ, තුබූ පරිදියි. මෙහි මධුරස්වරය කර්ණයට අමධුර නියාව කී හෙයින්, අයුක්තකාරී නම්. **අයුක්තකාරියි.**

198. දවානු අඟ මේ—තමා කමල්දල යහන්,
යෙදේනො දහනෙක්රූ—දවන පියවී වන්නේ.

198. මේ කමල්දල යහන්, මේ පද්මපත්‍ර ශයනයතෙම; තමා අඟ, මාගේ ශරීරය; දවානු, දහනයකරයි; දහනෙක්රූ, දහනය හා එකරූපය දෙයි නොහොත් වර්ණය හා සමාන වර්ණ දේය; දවන පියවී වන්නේ, දහනප්‍රකෘති වන්නේ; යෙදේනො, යුක්තනොවේද. මෙහි ගිනි සේ රත්පියුම් පෙති ඇතිරිය දවනබව සුදුසු හෙයින් යුක්තාත්ම නම්. **යුක්තාත්මයි.**

199. පෙළාවා රිසි සේ—සඳ වසතිඳු මා කෙසේ,
පෙළා මිලිනත්මන් කම්—නොයුතු සුවඳ විසුදුනට.

199. සඳ, චන්ද්‍රතෙම; රිසි සේ පෙළාවා, සිත් සේ පීඩාකෙරේවා; වසතිඳු, වසන්තරාජතෙම; මා කෙසේ පෙළා, මා කුමට පෙළන්නේද; මිලිනත්මන්, මලිනාත්මයන්ගේ; කම්, කටයුත්ත හෙවත් ක්‍රියාව; සුවඳවිසුදුනට, සුගන්ධිශුබයන්ට; නොයුතු, අයුක්තයි. මෙහි—පෙළීම මලිනචන්ද්‍රයාට සුදුසු හෙයින්ද, සුගන්ධිවූ වසන්තයාට නුසුදුසු හෙයින්ද, යුක්තායුක්ත නම්. **යුක්තායුක්තයි.**

200. කුමුදිළු පවං තවා—තවා පියුම්ළු නො කෙසේ,
සිසිගැතියන් කුරිරුවත්-රිවිගැතියො වෙද්ද මොලොක්.

200. කුමුදිළු පවා, කුමුදුවනය පවා; තවා, තවන්නේය; පියුම්ළු, පද්මවනය; කෙසේ නොතවා, කවර පරිද්දෙකින් නොතවන්නේද; සිසිගැතියන්, චන්ද්‍රයත්නයන්; කුරිරුවත්, ක්‍රූරවත්ම; රිවිගැතියො, සූර්යයත්නයෝ; මොලොක්වෙද්ද, මෘදුවන්නාහුද. **අයුක්තයුක්තයි.**

අර්ථාන්තරන්‍යාස නිමි.

---

201. බසින් ආනම් හෝ—සමබැව් හැඟිනිනම් හෝ,
දෙවතුන් අතුරු දක්වත්—වැතිරෙක නම් හෙ මෙසේ.

201. සමබැව්, සමත්වය; බසින් ආනම් හෝ, ශබ්දයෙන්ම පැමිණියේනම් වේවයි; හැඟිනිනම් හෝ, ස්වභාවයෙන් ප්‍රතීතවීනම් වේවයි; දෙවතුන්, (උපමා උපමෙය යන) උභයවස්තූන්ගේ; අතුරු දක්වත්, අන්තරය කියත්හොත් හෙවත් වෙනස කියත්හොත්; වැතිරෙක නම්, ව්‍යතිරෙක නම් වන්නේය; හෙ මෙසේ, ඒ මෙසේයි.

202. මුහුදු සෙමේ නො දිරිය—මහඅත්ම ගැඹර ගුණෙන්,
අතුරු වත් නරපවර—පිවිතුරු තා මෙ තුනුසිරින්.

202. දිරිය, ධෛර්‍ය්‍යයෙන්ද; මහඅත්ම, මහාත්මභාවයෙන්ද; ගැඹර ගුණෙන්, ගම්භීර ගුණයෙන්ද; නො මුහුදු සෙමෙ, තෝ සමුද්‍රය සමාන යෙහිය; නරපවර, නරප්‍රවරය; අතුරු වත්, අන්තරයක් වේනම්, පිවිතුරු, පවිත්‍රවූ; තා මෙ තුනුසිරින්, තාගේ මේ ශරීරශ්‍රියෙනි. මෙහි—ධෛර්‍ය්‍යාදි ගුණයෙන් සාගරය හා රජහු සදෘශකොටලා, රජහුගේ ශරිරයෙන් වෙනස කී හෙයින්, ඒකව්‍යතිරෙක නම් වේ. **ඒකව්‍යතිරෙකයි.**

203. නුබුත් හිමු ගැඹුරුය—යළ තොද මහමුහුදුදු,
හෙ අදනවතුරු සුරස්—පිළි නො කසුන්පැහැ සිරිරු.

203. තොද මහමුහුදුදු, තෝද මහාසමුද්‍රයද; නුබුත් හිමු, අභින්න සීමා ඇත්තාව හෙවත් ආචාරය හා වෙරළ නොඉක්මුණුව; යළ, නැවත; ගැඹුරුය, ගම්භීරය; (එතකුදු වුවත්) හේ, ඒ සමුද්‍රයතෙම; අදන වතුරු සුරස්, අඤ්ජනප්‍රවාහ සදෘශය; නො පිළි, තෝ වනාහි; කසුන්පැහැ සිරිරු, කාඤ්චනප්‍රභාවූ ශරිර ඇත්තෙහිය. මෙහි—කෘෂ්ණ වර්ණයෙන් හා සුවර්ණවර්ණයෙන් දෙන්නාගේ වෙනස කීහෙයින්, උභය ව්‍යතිරෙක නම්. **උභයව්‍යතිරෙකයි.**

204. දලනිදු නො මහසත්—තෙද යුතු පවති මුළුකල්,
නො පන නස්නේ මේ—සරස් හෙ තෝ මහකුළුණු.

204. දලනිදු, ජලනිධිසද; නො, තෝද; මහසත්, (මහත්වූ මකරාදි සත්වයන් ඇති බැවින් හා, මහත්වූ ඍද්ධි ඇති බැවින්) මහාසත්වයන; තෙද යුතු, (රත්නාලෝකාදිය ඇති බැවින් හා, තෙජස් ඇති හෙයින්) තෙජොයුක්තයන; නො, (නරෙන්ද්‍රය) තෝ; මුළුකල් පවති, සමස්තකාල යෙහි පවත්නේය; පන, නැවත; හේ නස්නේ, ඒ සාගරය නශ්වරය; සරස්, ජලරාශිය නොහොත් විෂරාශිය; මේ නො, මේ තෝ වනාහි; මහ කුළුණු, මහාකරුණායෙහිය. මෙහි—"මහසත්, තෙදයුතු" යනාදි කීහෙයින්, ශ්ලෙෂ ව්‍යතිරෙක නම්. **ශ්ලෙෂ ව්‍යතිරෙකයි.**

205. දරණුදු වූ දෙරණ—ගිරි සපුරු දිවිනි සියෝ,
බුජගිසුරුබැවිනුරිදු—නරනිඳු තට යටත්වේ.

205. ගිරි, (සප්තකුල) පර්වතය; සපුරු (චතුස්) සාගරය; දිවිනි, (චතුර් මහා) ද්වීපය යන මෙයින්; සියෝ, යුක්තාවූ; දෙරණ, ධරණිය; දරුණුදු වූ, දරන්නාවූ; උරිඳු, උරගෙන්ද්‍රතෙම; බුජඟ, නාගයන්ට නොහොත් භූතීයන්ට; ඉසුරු බැවින්, ඊශ්වරභාවයෙන්; නරනිඳු, නරෙන්ද්‍රය; තට යටත්වේ, තට අධස්තාත් වන්නේය. මෙහි—පෘථිවි ධරණය සමවූවත් අනන්තයා නාගනායක හෙයින්ද, රජහු භූති නායකනොවනහෙයින්ද, භුජඞ්ගනායකත්වය දෙදෙනාට සමනොවන බැවින්, හෙතුව්‍යතිරෙක නම්. **හෙතු ව්‍යතිරෙකයි.**

206. තහවුරුව සිටිනා—රුවනාරදූ දිරියසර,
මිලිනෙ මුහුදු ගුණමුහුදු—සමබැව් නොඑලඹේ තා

206. ගුණමුහුදු, ගුණසාගරය; තහවුරුව සිටිනා, ස්ථිරව පවත්නාවූ; රුවනාරදු, රත්නාකරදු වූ; දිරියසර, ධෛර්‍ය්‍යසාරවූ; මුහුදු, සමුද්‍රයතෙම; මිලිනෙ, කිලුටුවූයේ; තා සමබැව්, තා හා සමභාවයට; නොඑලඹේ, නොපැමිණේ. මෙහි—“මිලි” යන ව්‍යතිරෙකයෙන් සමුද්‍රය වළකන ලදී; සාගරය මලිනනම් දුර්ජේයවූද ලවණරසවූද ජලය ඇති හෙයිනි. ආක්ෂෙප ව්‍යතිරෙක නම්. **අක්ෂෙප ව්‍යතිරෙකයි.**

207. මෙසේ එකින් දෙකින්—සෙලෙස්නිදු හෙයිනකෙවින්,
වදනින් අ සුදුසුබැව්—පිළි මේ හැහෙතුවැනිබැව්.

207. එකින්, එකව්‍යතිරෙකයෙන්ද; දෙකින්, උභයව්‍යතිරෙකයෙන්ද; සෙලෙස්නිදු, ශ්ලෙෂ ව්‍යතිරෙකයෙන්ද; හෙයින්, හෙතු ව්‍යතිරෙකයෙන්ද; අකෙවින්, ආක්ෂෙප ව්‍යතිරෙකයෙන්දැයි; මෙසේ, මෙ පරිද්දෙන්; වදනින් අ සුදුසුබැව්, ශබ්දයෙන් ආවාවූ සාදෘශ්‍යය වේ; පිළි, නැවත; මේ, මේ මතු කියන්නේ; හැහෙතුවැනි බැව්, තෙමේම ප්‍රතීතවන්නාවූ සාදෘශ්‍යයයි. ප්‍රසිද්ධ සාදෘශ්‍යයෙන් ව්‍යතිරෙක කියනු ලැබෙයි සේයි. ශබ්දොපාත්ත සාදෘශ්‍යව්‍යතිරෙක නම්.

208. තී වුවන් කමලදූ—අතුරු කියත් මෙ දෙක්නි,
කමල් දෙලෙහි දනනුයේ—තිය ඇසිරැය තී වුවන්.

208. තී වුවන්, තීගේ වදනයද; කමලුදු, පද්මයද (යන); මෙ දෙක්හි, මේ දෙක්හි; අතුරු කියත්, වෙනස කියත්හොත්; කමල්, පද්මය; දෙලෙහි, ජලයෙහි; දනනුයේ, ජනිත වන්නේය; තී වුවන්, තීගේ වක්ත්‍රය; තිය ඇසිරැය, තිම ආශ්‍රයකරයි. මේ උත්පත්තිස්ථාන භෙද පමණෙකි. **භෙදමාත්‍ර ව්‍යතිරෙකයි.**

209. නොපත් බැමලේ හව්—මදරා නැත් මිනුල්නෙත්,
තුනුවඟ තී මෙ යුගනුවන්-සියලෙගුණෙන් වොරජනේ.

209. තුනුවඟ, තන්වඞ්ගිය; මියුල්නෙත්, මෘගනෙත්‍රයතෙම; බැම ලේ හව් නොපත්, භ්‍රැලෙඛා ලීලාවට අප්‍රාප්තය; මදරා නැත්, මන්‍ද රාගය නැත්තේය; තී මෙ යුගනුවන්, තීගේ මේ නෙත්‍රයුගමයතෙම; සියල් එගුණෙන්, ඒ භ්‍රැවිලාස මන්‍දරාග සඞ්ඛ්‍යාතවූ සියලු ගුණයෙන්; වොරජනේ, සොබනේය. මෙහි—මෘගනෙත්‍රයට මැයගේ නෙත්‍රය අධිකකරණලද හෙයින්, අධිකව්‍යතිරෙක නම්. **අධිකව්‍යතිරෙකයි.**

210. රුවනලුයෙන් සියල්—රිවිරස්නිදු නොනස්නා,
නුවනැඳිරි ගන්වනුවූ—යොවුන් තම යෝනේ දුනු.

210. සියල් රුවනලුයෙන්, සකල රත්නාලොකයෙන්ද; රිවිරස් නිදු, සූර්‍ය්‍ය රශ්මියෙන්ද; නොනස්නා, අවිනාශිතවූ; නුවනැඳිරි ගන් වනුවූ, නෙත්‍රාන්ධකාරය ගන්වන්නාවූ හෙවත් ඇස් පෙණීයනො

දෙන්නාවූ, සොවුන්, යෞවන ජනයන්ගේ; සෝනේ දුනු, යෞවන යෙහි ජනිතවූ, තම, අන්ධකාරයයි. මෙහි—ළදරුවන්ගේ යෞවනය නිසා වූ මේ අන්ධකාරය, ඒ හා සමවූ * අන්ධකාරජාතියෙන් ව්‍යතිරෙක කොට, ආලෝකයෙන් නොනස්නා බව කියනලදින්, සවජාති ව්‍යති රෙක නම්. **සවජාති ව්‍යතිරෙකයි.**

**211.** නි වුවන් පියුමුදු—පුබුදු සුවදදු කල්බද,
බුමු බමරදුන පියුම්—වුවන් නිය සසල නුවන්.

**211:** නි වුවන්, නිශේ චන්ද්‍රයද; පියුමුදු, පද්මයද; පුබුදු, ප්‍රබුඩයි; සුවදදු, සුගන්ධද වෙයි; කල්බද, කාන්තවූ දෙහඇත්තිය; පියුම්, පද්මය තෙම; බුමු බමරදුන, භ්‍රාන්තවූ භෘඞගයුගමයක් ඇත්තේය; නිය වුවන්, නිශේ චන්ද්‍රය; සසල නුවන්, චචලවූ නෙත්‍රයුගමයක් දැත් තේය. මෙහි—භෙදය සාම්‍යයෙන්ම කරණලදනුයි; සාදෘශ්‍ය ව්‍යති රෙක නම්. **සාදෘශ්‍ය ව්‍යතිරෙකයි.**

**212.** සද අඹර පස්කැන්—සිරිහස් දල පලදනේ,
සහතර තරුවැල ගුවන්—පුබුදු කුමුදු සිලිල් විල්.

**212.** සද, චන්ද්‍රතෙම; අඹර පස්කැන්, ආකාශයට කුණ්ඩලාභර ණය; සිරහස්, ශ්‍රීහංසතෙම; දල පලදනේ, ජලයට ආභරණය; ගුවන්, ආකාශය; සහතර, රශ්මි සහිතවූ; තරුවැල, තාරකාවලි ඇත්තේය; විල් සිලිල්, තටාක සලිලය; පුබුදු කුමුදු, ප්‍රබුඩ කෞමුදයන් ඇත් තේය. මෙහි—චන්ද්‍ර හංසයන්ගේද, තාරකා කුමුදයන්ගේද ධවල ගුණයෙන් සාදෘශ්‍යය ශබ්දයෙහි නොපෙණුනද ලොකප්‍රසිඞ හෙයින් හැඟේනුයි, ප්‍රතිත ව්‍යතිරෙක නම්. **ප්‍රතිත ව්‍යතිරෙකයි.**

**213.** හුදු තොරතුරින්—ඉතිරි—යෙන් සියදූතිදු යළු,
වදනින් අා සමසමහ—සමබැව්නි අන්නිදු වී.

**213.** හුදු තොරතුරින්, කෙවල භෙදයෙන්ද හෙවත් භෙදමාත්‍ර ව්‍යතිරෙකයෙන්ද; ඉතිරියෙන්, අධික ව්‍යතිරෙකයෙන්ද; යළු, නැවත; සියදූතිදු, සවජාති ව්‍යතිරෙකයෙන්ද; වදනින් අා, ශබ්දයෙන් ආවාවූ; සමසමහ, සාම්‍යයෙන් හෙවත් සාදෘශ්‍යව්‍යතිරෙකයෙන්ද; අන්නිදු, අන්‍යවූ ප්‍රසිඞියෙන් අා; සමබැව්නි, සාදෘශ්‍යයෙන්ද හෙවත් ප්‍රතිත ව්‍යති රෙකයෙන්ද; වී, (මේ යථොක්තවූ ව්‍යතිරෙක භෙදය) වූයේය.

ව්‍යතිරෙකාලඞකාර නිමි.

---

**214.** යළු දිය පතළ ගේ—අයල ගෙ බඟවූනෙත් හළු,
අනෙසිනි ගෝ වනුවා—විබඟවූන යෙත් ගෙ මෙසේ.

**214.** දිය පතළ, ජගත් ප්‍රසිඞවූ; ගේ, හෙතුව; හළු, දුරුකිරී

* මොහාන්ධකාරය—සමහර.

මෙන්ද; අයල ගේ බඟවුනෙන්, අනනතුක හෙතු විභාවිනාකිරීමෙන් (හෝ); අහෙසිති හෝ, අහෙතුවෙන් හෝ; වනුවා, වන දෙය; විබන්ධුන යෙත්, විභාවනාලඞ්කාරයයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි. මෙහි— යම් ඵලයකට ප්‍රසිඬ කාරණය හැර අමුතු කාරණයක් හෝ, නිෂ්කාර ණවූ බවක් හෝ කිවහොත්, විභාවනාලඞ්කාර නම් වෙයි සේයි.

**215.** නොබී මත් නිසර—ගෙණෙ නොහමට විමලඹර,
නොම පැහැයූ සියුම් තෝ—මනහර වී දිය සියල්.

**215.** නොබී මත්, අපිතව මත්වූ; නිසරගෙණෙ, හංසගණයා ඇති; නොහමට, නොහමදනාලද්‍රුව; විමල්, නිර්මලවූ; අඹර, ආකාශය ඇති; නොම පැහැයූ, අප්‍රභාසිතව හෙවත් ඔෟෂධාදීන් පහදවනු නොලද්‍රුව; සියුම්, සූක්ෂමවූ; තෝ, ජල ඇති; සියල් දිය, සකල ජගත්; මනහර වී, මනොහර වී. **අහෙතුක විභාවනායි.**

**216.** නොම ඇඳියද සුනිල්—නුවනත නොනැගුවද නි,
බැමලේ සුනත ලවනත—පිළි නොරඳතුදු රත් වී.

**216.** නි, නිගේ; නුවනත, නෙත්‍රය; නොම ඇඳියද, අනඤ්ජිතවූවද; සුනිල්, සුනීලය; බැමලේ, භ්‍රැලෙඛාව; නොනැඟුවද, උද්ගත නොක ළද; සුනත, සුනවූ නමනය; පිළි, නැවත; ලවනත, අධරය; නොරඳතුදු, රඤ්ජිත නොකළද; රත් වී, රක්ත වී; **අවිරුඬ විභාවනායි.**

**217.** න මේ වූවන් නිසග—සුවඳය පියව් රුසිරු,.
බඳ නිකරණ රුපුදු සඳ—වියත් මෙ පලව්බහවුන්.

**217.** න මේ වූවන්, නාගේ මේ මුඛය; නිසග සුවඳ, නිසර්ගසුග න්‍ධිය; බඳ, ශරීරය; පියව් රුසිරු, ප්‍රකෘති රුචිරය හෙවත් ස්වභාව යෙන් සිත්කලුය; සඳදු, චන්ද්‍රද; නිකරණ රුපු, අහෙතුක ශත්‍රැයයි; වියත්, කියත්හොත්; මේ, මේ අලඞ්කාරයතෙම; පලව්බහවුන්, ඵල විභාවනා නම්. **ස්වාභාවික ඵලවිභාවනායි.**

විභාවනාලඞ්කාර නිමි.

---

**218.** වතක් යම් කියටිවැ—එම වත් වැනි අන් වතක්,
පවසත් සකෙව්රුනෙන්—සමාසය යෙත් ගෙ මෙසේ.

**218.** යම් වතක් කියටිවැ, යම් වස්තුවක් කථනය කරණු කැමැ තිව; එමවත් වැනි අන් වතක්, ඒ වස්තුව හා සදෘශවූ අන්‍යවස්තුවක්; පවසත්, කියත්හොත්; සකෙව් රුනෙන්, සඞ්ක්‍ෂෙපස්වරූප බැවින්; සමාසය යෙත්, සමාසොක්තියයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි.

**219.** බොමින් මී රිසිසේ—බමර සුපුල් පියුම්හි,
පියගඳ නොපත් කල්හිදු—බල එලමේ නව මුහුලු.

**219.** බමර, භෘඞ්ගතෙම; සුපුල් පියුම්හි, ප්‍රබුඬ පද්මයෙහි; මී, මධුව; රිසි සේ බොමින්, සිත් සේ අනුභව කෙරෙමින්; නව මුහුලු,

අභිනව කුඩ්මලය; පියගඳ නොපත් කල්හිද, ප්‍රියඞගුය අප්‍රාප්ත කාලයෙහිද, ඵලශ්‍රී, උපසේවිත වන්නේය; බල, දකු.

220. වලඳ මන ඇතියා—සරතර කුමරිය කෙරේ,
හැඟේ බඳඅදහස් තුනි—මින් පුවිළහන අතුරේ.

220 මින්, මේ වචනයෙන්; තුනි, අනුගතවූ; පුවිළ, ප්‍රෞඪවූ; අඟන අතුරේ, අඞ්ගනාව කෙරෙහි; වලඳ මන ඇතියා, අනුගතව චිත්ත ඇති පුරුෂයා; සරතර, සුන්දරතරවූ; කුමරිය කෙරේ, කුමාරිකාව කෙරෙහි; බඳඅදහස්, බද්ධවූ අධ්‍යාශය; හැඟේ, (ඇසූ විඥන්ට) හැඟෙන්නේය. **සමාසොක්තියි.**

221. තුබුත් වෙසෙස්නෙක්—බුත් තුබුත් වෙසෙස්නෙක්,
තුවූවිරි වෙසෙසුනැත—පිළි මේ තුණට නිදසුන්.

221. තුබුත් වෙසෙස්නෙක්, අභින්නවිශෙෂණ නම්වූ එක් සමාසොක්තියෙක; බුත් තුබුත් වෙසෙස්නෙක්, භින්නාභින්න විශෙෂණ නම්වූ එක් සමාසොක්තියෙක; තුවූවිරි වෙසෙසුන් ඇත, අභූතවිශෙෂණ නම්වූ සමාසොක්තියෙක්ද ඇත; පිළි මේ, මේ වනාහි; තුණට නිදසුන්, (ඒ) තුණට නිදර්ශනයි.

222. මුලෙරුණ මහරු රුක්—මුලුකල් සියල් දුස්නා,
පලරැස්නි ගනසේ මේ—පිළි ලදිමද විදිබෙලෙන්.

222. මුලෙරුණ, මුල් බටුවාවූ; මුලුකල්, සියල්ලන්ට කාන්තවූ; පලරැස්නි, ඵලරාශියෙන්, සියල් පුස්නා, සියල්ලන් පොෂ්‍යය කරන්නාවූ; ගන සේ, ඝනච්ඡායා ඇති; මේ මහරු රුක්, මේ මහාභිවංශය; අද, දැන්; විදිබෙලෙන්, දෛව බලයෙන්; පිළිලදිමි, ප්‍රතිලබ්ධයෙමි; මෙහි—මහරු රුක් කියා විශෙෂ්‍යපදමාත්‍රයක් භින්නබව මුත්, පුරුෂයාත් මුල්බට හෙයින්ද, ජනප්‍රිය හෙයින්ද, තමාගේ විභවඵලයෙන් ජනපොෂණය කරණ හෙයින්ද, ඝනවූ ඡායා ඇති හෙයින්ද, විශෙෂණපද තාක් පුරුෂ වංශ දෙපක්‍ෂයටම සමනුයි, අභින්නවිශෙෂණ නමි. **අභින්නවිශෙෂණ සමාසොක්තියි.**

223 පල මල්නි සුලකළ—වතළ දදපෙළ බිඟුමුළු,
ගන සේ සතපන සියල්—තහවුරු තුරුසිර බෙජෙම්.

223. පල් මල්නි, ඵලපුෂ්පයෙන්; සුලකළ, සමලඞ්කෘතවූ; වතළ, ව්‍යාප්තවූ; දදපෙළ, පක්‍ෂිපඞ්ක්තිය හා, බිඟුමුළු, භෘඞ්ගසමූහ ඇති; ගන සේ, ඝනඡායා ඇති; සියල් සතපන, සියල්ලන් සන්තර්පිත කරන්නාවූ; තහවුරු, ස්ථිරවූ; තුරු, වෘක්‍ෂයක්හු; ඇසිරැ බෙජෙම්, ආශ්‍රය භජනයකෙරෙමි. මෙහි—“තුරු” යනු විශෙෂ්‍යය හා භින්නමාත්‍රයක් නොව “පලමල්නි සුලකළ” යන විශෙෂණය හා “වතළ දද පෙළ බිඟුමුළු” යන විශෙෂණය හා භින්න හෙයින්ද, “ගනසේ” යන්න හා “සතපන” යන්න හා “තහවුරු” යන්න හා පුරුෂ වංශ

දෙපක්‍ෂයටම සමවූ අභින්නවිශෙෂණ හෙයින්ද මේ භින්නාභින්නවිශෙෂණ සමාසොක්ති නම්. **භින්නාභින්නවිශෙෂණ සමාසොක්තියි.**

**224.** නැවැති බුජඟ සසඟ—නිසඟ මිපුරු රස සමඟ,
කලෙක්නි සල වියෝ හා—වියලේ මේ මහමුහුදු.

**224.** නැවැති, නිවෘත්තවූ; බුජඟ සසඟ, නාගයන්ගේ සංසර්ගී දෙහෝ නොහොත් ධූර්තයන්ගේ සංසර්ගී ඇති; නිසඟ මිපුරුරස සමඟ, නිසර්ගමධුර ජලයෙන් දෙහෝ නොහොත් ස්වභාව මධුර ගුණ රසයෙන් සමන්විතවූ; සල වියෝ, චාංචල්‍ය වියුක්තවූ හෙවත් අචපලවූ; මේ මහමුහුදු, මේ මහාසාගරයතෙම; කලෙක්නි, කාලයා කරණ කොටගෙණ; වියලේ, ශුෂ්කවන්නේය; හා, බෙදයි. මෙහි—එක් තරා මියන්නාවූ පුරුෂයක්හුගේ රූපය කියවීම සමාසොක්ති කොට, සමුද්‍රයෙහි අවිද්‍යමානවූ භුජඞ්ග සංසර්ගී නිවෘත්තියය, ස්වභාව මධුර රසභාවය, අචඤ්චලත්වය යන මෙහි විශෙෂණ කී හෙයින්, අභූතවිශෙෂණ නම්. **අභූතවිශෙෂණ සමාසොක්තියි.**

**225.** යහ හිමි ලබවිදුම්—නොබූත් වෙසෙස්නෙන් බූත්,
නොබූත් පැසුලු හැහෙ හෙයින්—කී මරණුබුවෙසෙස්නි

**225.** යහ හිමි, සුන්දරවූ ස්වාමිය; ලබවිදුම්, ලාභානුභවය; නොබූත් වෙසෙස්නෙන්, (පළමු කව කී) අභින්න විශෙෂණයෙන්ද; බූත් නොබූත් වෙසෙස්නෙන්, (දෙවන කව වූ) භින්නාභින්න විශෙෂණයෙන්ද; හැහෙ, ප්‍රකට වේ; පැසුලු කී අබුවෙසෙස්නි හෙයින්, පසුව කී අභූතවිශෙෂණ කවින්; මරණ, (එවැනි පුරුෂයක්හුගේ) මරණ; (හැහෙ, හැහෙන්නේය.)

සමාසොක්ත්‍යලඞ්කාර නිමි.

---

**226.** කියන පවසින් යම්—වෙසෙසක්හු ලෝ වැටමෙන්,
ගේ අතිසය කියුම් නම්—ලකරික්ම වේ මේ ගින්.

**226.** වෙසෙසක්හු, විශෙෂයක්හු; කියන පවසින්, කථනප්‍රවෘත්ත්‍යායෙන්; ලෝ වැටමෙන් ඉක්ම, ලොකප්‍රවෘත්තින් අතික්‍රාන්තව සිටියාවූ, යම්, යමෙක් ඇද්ද; ගේ, එතෙම; අතිසයකියුම් නම්, අතිශයොක්ති නම් වූ; ලකර වේ, අලඞ්කාරය වේ; මේ ගින්, මෙ පරිද්දෙනි.

**227.** අලුත් සඳුන් මලි—ගියමල්දම් බර වරල්,
අබිසරුවො සෙ දුහුල් හන්-සිසිරස්හි නොපෙනෙනුවෝ.

**227.** අලුත් සඳුන්, අභිනව චන්දන [කලකාලෙප] ඇති; මලිගිය මල්දම්, මාලතී මාලාදාමයෙන්; බර, භාරවූ; වරල්, ධම්මිල්ල ඇති; සෙ දුහුල් හන්, ශ්වෙතදුකූල පරිධානය කළාවූ; අබිසරුවො, අභිසාරිකාවෝ; සිසිරස්හි, චන්ද්‍ර රශ්මියෙහි; නොපෙනෙනුවෝ, නොදක්නාහුය. මෙහි—චන්ද්‍රරශ්මීහුගේ ආධික්‍යය ලොකසීමාතික්‍රාන්තව පැනේහුයි, **ලොකවෙලාවිලඞ්ඝිනී අතිශයොක්තියි.**

228. සැකින් තිරණින් මේ—ලකර වේ අන් සෙයිනුදු,
වදන වරු සුරැජරු—පිළිබන් ලැබ කියත් යුත්.

228. සැකින්, ශඞ්කායෙන්ද; තිරණින්, නිර්ණයෙන්ද; මේ ලකර වේ, මේ අතිශයාලඞ්කාරය වන්නේය; අන්සෙයිනුදු, මේ දෙකින් අන්‍යවූ (යසස් ආදි අනෙක) වස්තූන් විසිනුදු වන්නේය; වදන වරු, වදනුන්ට උත්තමවූ හෙවත් වාග්මීන්ට ශ්‍රෙෂ්ඨවූ; සුරැජරු, දෙවාචාර්‍ය්‍යයාගේ හෙවත් බෘහස්පතිහුගේ; පිළිබන් ලැබ, ප්‍රතිභානය ලදින් හෙවත් ඔහු වැනි බුද්ධිය ලදින්; කියත් යුත්, (මේ අතිශයාලඞ්කාරය නිශෙෂයෙන්) කියන්නට සුදුසුයි.

229. පියපුරු බර දුවන්—බර මැදෙහි නි කල්බද,
තුනු ඇත හෝ නැත හො වී-සැක නොවැළකේ මෙතමා.

229. කල්බද, කාන්තාදෙහිනිය; නි, නිගේ; පියපුරු බර, පයොධරභාරය හා; දුවන්බර මැදෙහි, ජඝනභාර මධ්‍යයෙහි (අතරෙහි); තුනු, (මධ්‍ය) ශරීරය; ඇත හෝ නැත හො වී, ඇද්දෝ නැද්දෝ හෝයි කියා; මෙ තමා සැක, මේ මාගේ ශඞ්කාව; නොවැළකේ, නොනවත්නේයි. මෙහි—මධ්‍යප්‍රදෙශයෙහි කෘශත්වය අතිශය සංශයෙන් හඟවනලදින්, **සංශයාතිශයොක්තියි.**

230. ඇත වී යත් සබද—තුනු මැද නි රුසිරුබද,
ඉදිනෙනැත කිමද මෙසේ—තනන තන සිටුමට වත්.

230. රුසිරුබද, රුචිරවූ දෙහ ඇත්තිය; නි තුනුමැද, නිගේ තනු මධ්‍යය හෙවත් සිහුවලත; ඇත වී යත් සබද, ඇතැයි කියත් සම්බන්ධයි; ඉදින් එ නැත, ඉදින් ඒ (මධ්‍යප්‍රදෙශය) නැතහොත්; මෙසේ, මේ අකාරයෙන්; තනන තන, චඤ්චලවන්නාවූ ස්තනයන්ගේ; සිටුමට වත්, සිටිමට කාරණා; කිමද, කිමෙක්ද. මෙහි—මධ්‍යප්‍රදෙශ ප්‍රකාශය නිශ්චයෙන් කියනලදින්, **නිශ්චයාතිශයොක්තියි.**

231. අහෝ අසකිය තා—යසරැස් මනත් යම් සේ.
මෙනෙත් මෙ තුන්ලෝකුස්—මිහිපල් විසල්නි තමා.

231. මිහිපල්, මහීපාලය; යම් සේ, යම් පරිද්දෙකින්; මනත් අසකිය, මනින්නට අසමර්ථවූ; තා යසරැස්, තාගේ යශොරාශිය; මෙනේ, මනින්නේද (එහෙයින්); මෙ තුන්ලෝකුස්, මේ ත්‍රෛලොක්‍ය කුක්ෂිය; තමා විසල්නි, තමාගේ විශාලත්වයෙන්; අහෝ, ආශ්චර්‍ය්‍යයයි. මෙහි—තාගේ යශොරාශිය අතිවිශාල හෙයින්, ප්‍රමාණ කට නොහැක්කාවූ ත්‍රෛලොක්‍ය කුක්ෂියද මනන්නේමයයි කීමෙන් යසස්හුගේ අතිශය කියනලදී. **යශොතිශයොක්තියි.**

අතිශයාලඞ්කාර නිමි.

232. සසේනි වත්හු හෝ—පැවතුම් අන්නු අන් සේ,
විකපත්හොතන්සෙසිනිදු-අයලසිත යෙත් හෙ මෙසේ

232 සසේනි වත්හු හෝ, සචෙතන වස්තුවක්හු හෝ; අන්නු, අන්‍යයක්හු හෝ හෙවත් අචෙතන වස්තුවක්හු හෝ; අන්සේ පැවතුම්, අන්‍යවූ ප්‍රකාරයෙකින් ප්‍රවෘත්තිය; අන්සෙසිනුදු, අන්‍ය ප්‍රකාරයෙකින්; විකපත් හොත්, කල්පනා කරත්හොත්; අයලසිත යෙත්, අගනතුක චින්තායයි කියති හෙවත් උත්ප්‍රෙක්‍ෂාලඞ්කාරයයි කියති; හෙ මෙසේ, ඒ මේ ආකාරයෙනි.

233. මැදුම් පත් රිවි තැවි—ලී පත් මතැත් විල් වන්,
රිවිහැනියෙනුපුරන්නව—රිසිනැසි කමල් හඟිනෙම්.

233. මැදුම් පත්, මධ්‍යාහ්නප්‍රාප්තවූ; රිවි, සූය්‍ය්‍යා කරණකොට ගෙණ; තැවිලී පත්, සන්තාපප්‍රාප්තවූ; මතැත්, මත්තහස්තිතෙම; විල් වන්, තටාකයට ප්‍රවිෂ්ටවිය; රිවිහැනියෙන්, සූය්‍ය්‍යපක්‍ෂ හෙයින්; කමල් උපුරන්නට, පද්මයන් උත්පාටනය කරන්නට; රිසිනැසි හඟිනෙම්, රුචියෙනැසි සිතන්නෙමි. මෙහි—ස්නානපානාදිය නිසා වන්නාවූ ඇතුගේ ජලගාහනය, ශත්‍රුපක්‍ෂොඩරණය පිණිසයයි කවීනු කල්පනාකළ හෙයින් උත්ප්‍රෙක්‍ෂා නම්. සචෙතනොත්ප්‍රෙක්‍ෂායි.

234. ම මේ දික් වැලකු—කණහගු අබරණ වී,
සවණ්දුවරුස් කැල්මෙන්—තිය ඇක්මෙයි සැකියෙම්.

234. ම දික් වැලකු, මාගේ දීඝීතාව වලකා සිටි; කණහගු, කණීණාන්තයට; මේ අබරණ වී, මේ ආභරණයයි; තිය සවණ්දුවර, තිගේ ශ්‍රවණෙන්දීවරයතෙම හෙවත් කණෙීාත්පලයතෙම; ඇස් කැල් මෙන්, නෙත්‍රකාන්තියෙන්; ඇක්මෙයි, ආක්‍රාන්ත වන්නේයයි; සැකියෙම්, ශඞ්කාකෙළෙමි. මෙහි—නෙත්‍රකාන්තියම තමාගේ දීඝීතාව වළකා සිටි කණීයට ආභරණවූ හෙයින්, අන් පරිද්දෙකින් සිටි නෙත්‍රකාන්තිය විසින් කණෙීණාත්පලය ආක්‍රමණයකරණලදැයි අන්පරිද්දෙකින් කවීනු උත්ප්‍රෙක්‍ෂා කෙළේ. අචෙතනොත්ප්‍රෙක්‍ෂායි.

235. හඟිම් සිතම් පිරික්—සම් විසිනෙම් සැකියෙම්,
මේ ඈ සදිනයලසිත්—විලිත්වේ එව් සදිනුදු.

235. හඟිම්, හඟිම් කියාද; සිතම්, සිතම් කියාද; පිරික්සම්, පිරික්සම් කියාද; විසිනෙම්, විසිනෙම් කියාද; සැකියෙම්, සැකියෙම් කියාද; මේ ඈ සදින්, මේ ආදිවූ ශබ්දයෙන්; අයලසිත් විලිත් වේ, උත්ප්‍රෙක්‍ෂාව ප්‍රකාශවන්නේය; එසව්දීනුදු, එව් යන ශබ්දයෙනුදු (ප්‍රකාශවන්නේය.)

236. ලිපා එව් අඟ තම—නුබෙනදනරුස් වැසි එව්,
වී බනලදර පලට—කළ මෙ වදනිනායලසිත්.

236. තම, අන්ධකාරයතෙම; අඟ ලිපා එව්, ශරීරය ලිම්පනයකෙරෙයි හඟිම් හෙවත් ගල්වයි සිතම්; නුබෙන්, ආකාශයෙන්, අඳනරුස්

අඤ්ජනරාශියෙක්; වැසි එව් වී, වැටෙසි හඟිමියි කියා; බහලඳර, ඝනා-න්ධකාරය; පලවකළ, ප්‍රකාශකළාවූ; මෙ වදනින්, මේ වචනයෙන්; අයලසිත්, උත්ප්‍රෙක්‍ෂාවයි.

237. කෙනෙක් මෙ උවම් වී—පමදිත් එව්සදින් නැත්,
කිරිය පෙදෙනුවම් විසු—වදනික්ම කී වියතුන්.

237. කිරිය පෙදෙන්, ක්‍රියාපදයෙන්; උවම් නැත් විසු, උපමා නැතැයි කියා; කී වියතුන් වදන් ඉක්ම, කීවාවූ ව්‍යක්තයන්ගේ වචන අතික්‍රාන්තව; කෙනෙක්, (සමහර) කෙනෙක්; එව්සදින්, එව් යන ශබ්දය කරණකොටගෙණ; මෙ, මේ යට කීවාවූ ලිම්පන වර්ණනය; උවම් වී, උපමායයි කියා; පමදිත්, භ්‍රාන්තවෙත්. මෙහි—අන්ධකාරය ශරීරලිම්පනයකරන්නාක් මැන්න; ආකාශය අඳුන්වැසි වස්නා මැන් නැයි උපමාකොට ගතහොත්, උපමා නම් උපමා උපමෙය වස්තූන් දෙදෙනෙක්හුගේ සමගුණ දක්වීමක් හෙයින්ද, එසේවූ සාදෘශ්‍යගුණයක් මෙහි නොපෙනෙන හෙයින්ද, උපමා නොවෙයි යනුද උත් ප්‍රෙක්‍ෂාමය යනුද දතයුතු.

උත්ප්‍රෙක්‍ෂාලඞ්කාර නිමි.

---

238. හෙ වදන බරණ පිළි—හේ කරු දන්වනුද වේ,
පැවතුම් නැවතුමුදු ඈ—නේ තියරුත් මෙ මේ ගින්.

238. හේ, හෙතු නම් අලඞ්කාරයතෙම; වදන බරණ, වචනයට ආභරණයෙකි; පිළි, නැවත; හෙ, ඒ වනාහි; කරු, කාරකද වෙයි; දන්වනුද වේ, ඥාපකද වෙයි; පැවතුම් නැවතුමුදුඈ, ප්‍රවෘත්ති නිවෘත්ති ආදිවූද; නේ තියරුත්, අනෙකාකාර ඇත්තාවූ; මෙ, මේහෙතුතෙම; මේ ගින්, මේ ප්‍රකාරයෙන් වේ.

239. ලද නව්ලොදුල සඳ—ලෙලදෙන පලුදල පහස්,
උපදවා සොම්නස් හව්—දනනට මෙ දකුණ පවන්.

239. නව ලොදුල, අභිනවව සඤ්ජාතවූ; සඳ, චන්දනයෙහි; ලෙල දෙන, ලෙලනය දෙන්නාවූ; පලු දල, පල්ලව පත්‍රයන්ගේ; පහස් ලද, ස්පර්ශය ලද්දාවූ; මෙ දකුණ පවන්, මේ දක්‍ෂිණ මාරුතයතෙම; හව් දනනට, සර්ව ජනයාහට; සොම්නස් උපදවා, සන්තොෂ ජනනය කරන්නේය. මෙහි—සන්තොෂයාගේ ජනනය වන කටයුත්ත කරන් නාවූ පවන ඒ සොම්නසට හෙතු හෙයින්, මේ භාවකාර්‍ය්‍යකාරක හෙතු නම් වේ. **භාවකාර්‍ය්‍යකාරක හෙතුයි.**

240. සඳුන්වනනලලං—මලගල් ගඟුලෙහි පහස්,
ලැබ අද ලැඟුනු මෙ සුලඟ—වියෝදනනව නැස්මට.

240. සඳුන් වනන්, චන්දන වනයන්; අලලා, කම්පිතකොට; මල ගල්ගඟුලෙහි, මලයපර්වත නිර්ඣරයෙහි; පහස් ලැබ, ස්පර්ශ ලදින්;

අද, අවුත්; ලැඟුනු, සමීපසථවූ, මෙ සුලඟ, මේ මාරුතය; විසෝදන නට, විරහ ජනයන්ට; නැස්මට, විනාශයටයි. මෙහි—විරහජනයාගේ විනාශයට කාරණ (හෙතු) වූයේ පවන හෙයින්, උන්ගේ අභාව කාර්‍ය්‍ය කොට ඇති කාරකහුයි, **අභාවකාර්‍ය්‍යකාරක හෙතුයි.**

මේ දෙක සොම්නස් හා වියොගීන්ගේ භාවාභාව දෙක උපදවන හෙයින් තමා විසින් ඉපදවිය යුතුවූ භාවාභාව දෙකට කාරකහුයි, **නිර්‍වර්‍ත්‍යකාරක හෙතුයි.** මෙහි—කාර්‍ය්‍ය නම්, නිර්‍වර්‍තිය; විකාර්‍ය්‍ය; ප්‍රාප්‍යයයි තුණෙක් වෙයි; එහි, "කටංකරොති දෙවදත්තඃ" යනාදිය අලුතු උපදවන හෙයින් නිර්‍වර්‍ති නම් වෙයි; "කාෂ්ඨං ලුනාති දෙවදත්තඃ" යනාදිය දර ආදිය විකාරයට පමුණුවන හෙයින් විකාර්‍ය්‍ය නම් වෙයි; "ගෘහම්ප්‍රවිශති දෙවදත්තඃ" යනාදිය චක්‍ෂුරාදි ඉන්ද්‍රිය යන් විසින් පැමිණිය යුතු බැවින් ප්‍රාප්‍ය නම් වෙයි දතයුතු.

**241.** සහමල් පලු කමල්—විල් වන පුල් පුන්නු සඳ,
වනත් නුවන් වස සියල්-කෙලෙ කම්රකුස් නොසරස්.

**241.** සහමල්පලු, පුෂ්ප පල්ලව සහිතවූ; වන, වනයද; පුල් කමල් විල්, ප්‍රබුද්ධවූ පද්ම සරස්ද, පුපුන් සඳ, සම්පූර්‍ණ චන්ද්‍රයාද (යන); සියල්, (මේ)සියල්ල; කම්රකුස්, කාමරාක්‍ෂසතෙම; නොසරස්, වහාම; වන නුවන්, විරහීන්ගේ නෙත්‍රයට, වසකෙලෙ, විෂයකෙළේය. මෙහි, ප්‍රියවූ වනතටාක චන්ද්‍රාදිය ස්වභාව ප්‍රියගුණ හැර විකාර්‍ය්‍යය කාමයාවිසින් පමුණුවනලදහුයි, විකාර්‍ය්‍යකාරකහෙතු නම්. **විකාර්‍ය්‍යකාරක හෙතුයි.**

**242.** මනට යොග කෙරෙම්යි—වී කල්නු තන්හි තුබූ,
කල වම්යක් බලා බුත්—බැම රත්නෙත් සල ලවන්.

**242.** මනට යොග කෙරෙම්යි වී, මානයට යොග්‍යකෙරෙම්යි කියා; කල්හු තන්හි, වල්ලභයාගේ ස්ථානයෙහි; තුබූ, වින්‍යාස කළාවූ; කල, කාන්තාව; බුත් බැම, භග්නවූ භ්‍රූ ඇති; රත්නෙත්, රක්තවූ නෙත්‍ර ඇති; සල ලවන්, චචලවූ අධර ඇති; වම්යක්, කාන්තාවක්තොමෝ; බලා, නිරීක්‍ෂණය කරන්නීය. මෙහි—අභිමානයෙහි අභ්‍යාසකරණ පිණිස යෙහෙලිය වල්ලභයා වැනි කොට තොමෝ කිපී බලන්නියයි කීමෙන් නෙත්‍රයෙන් පැමිණියයුතු හෙයින්, ප්‍රාප්‍යකාරකහෙතු නම්. **ප්‍රාප්‍යකාරක හෙතුයි.** මේ සතරකාරක හෙතුයි.

**243.** රිවි හත්පත් සිසිඳු—දිස්නෙ සියොත් නිවෙස් යෙත්,
වියත් මෙහින් සවස්කල්—දන්වත් මෙ වේ පෝසත්.

**243.** රිවි හත්පත්, සූර්‍ය්‍යයා අස්ත (පර්‍වත) ප්‍රාප්ත විය; සිසිදු දිස්නෙ, චන්ද්‍රයාද දෘශ්‍යමානය; සියොත්, පක්‍ෂීහු; නිවෙස් යෙත්, නිවාස ස්ථානට යෙතියි; වියත්, කියත්හොත්; මෙයින්, මේ වචනයන්ගෙන්; සවස්කල්, සායාහ්න කාලය; දන්වත්, හඟවත්හොත්; මෙ, මේ හෙතුවතෙම; පෝසත්, සමර්‍ථයි. මේ කාලය හඟවන කාරණ හෙයින්, කාලඥාපකහෙතු නම්. **කාලඥාපක හෙතුයි.**

214. නොහෑ සඳනලෙව්නි—සිහිලස සියලඟ හුණින්,
හැමෙහ සඳරැස් පහස්නිදු—වියොවග සමග ති සිත්.

244. සිහිලස,ශීතලවූ; සඳනලෙව්නි,චන්‍ද්‍රනාලෙපයෙන්ද; සඳරැස්, පහස්නිදු, චන්‍ද්‍රරශ්මි ස්පර්ශයෙන්ද; නොහෑ, අවිධ්‍යවූ; සියලඟ හුණින්, සර්වාඞ්ගයෙහි උෂ්මයෙන්ම; වියොවග සමග, කාමාශ්‍රයවූ; ති සිත්,තිගේ චිත්තය; හැමෙහ, ප්‍රකාශ වේ. ක්‍රියාඥාපක හෙතුයි.

245. නිපදනා කල් ලද—නවලොදුල යන්නෙන් දුටු,
සහමල් පලු මනට යොග—යනු විකරපැමිණෙන කම්.

245. ලද නවලොදුල යන්නෙන්, (යට කියනලද) "ලද නවලොදුල" යන කවින්; දුටු, දුටුයේ; නිපදනා කල්, නිර්වෘත්තිකාර්‍ය්‍ය නම් වෙසි; සහමල්පලු, සහමල්පලු යන කව හා; මනටයොග යනු, මනට යොග යන කව හා; විකරපැමිණෙන කම්, (යථාක්‍රමයෙන්) විකාර කාර්‍ය්‍ය හා ප්‍රාප්‍යකාර්‍ය්‍ය යන දෙකයි; (සහමල්පලු යනු විකාරකාර්‍ය්‍යය; මනටයොග යනු ප්‍රාප්‍යකාර්‍ය්‍යයයි සේයි).

246. පෙර නැති බැව් බහා—යනු නැති බැවොව්නොව්නුදු,
කෙරෙ නැති බැව් සවාරෙන්-පිළි නැතිබැව්දු ගේ වේ.

246. පෙර නැතිබැව්, පූර්වයෙහි නැතිබවය හෙවත් ප්‍රාගභාවය; බහා යනු නැතිබැව්, බාහ්‍යයට පැමිණි නැතිබවය හෙවත් පූර්වාවස්ථාවෙන් බාහ්‍යවූ අවස්ථාවකට නොපැමිණෙන හෙයින් සම්ප්‍රාප්තභාවය; ඔව්නොව්නුදු කෙරෙ නැති බැව්, ඒ ඒ වස්තූන් කෙරෙහි අවිද්‍යමාන බවය හෙවත් ඉතරෙතරාභාවයය; පිළි, නැවත; සවාරෙන් නැති බැව්දු, සර්වාකාරයෙන් නැති බවද හෙවත් අත්‍යන්තාභාවයදැයි යන; ගේ වේ, හෙතු වන්නේය.

247. නොසෙව්යෙනුදු විදුන්—පිළි නොසසගින් සජනන්,
නොව්සිකෙරෙනුදු ඉඳුරන්—වසන් දෙනේ මිනිස්නට.

247. විදුන් නොසෙව්යෙනුදු, විද්‍වාන්ගේ අසෙවනයෙන්ද; පිළි, නැවත; සජනන් නොසසගින්, සජ්ජනයන්ගේ අසංසර්ගයෙන්ද; ඉඳුරන් නොව්සිකෙරෙනුදු, ඉන්‍ද්‍රියයන්ගේ අවශීකරණයෙන්ද; මිනිස්නට, මනුෂ්‍යයන්ට; වසන් දෙනේ, ව්‍යසන උපදවන්නේය. මෙහි—විද්‍වත්සෙවන, සජ්ජනසංසර්ග, ඉන්‍ද්‍රියදමනාදිය නොකළ බව, පසුව වන විපත්තියට කාරණ හෙයින්, ප්‍රාගභාව නම් වේ. ප්‍රාගභාවකාරක හෙතුයි.

248. ගියෙ වියොවගහු කල්—පිළි මෙලෙ නවයොන විලස්,
මොහ වැනසි දිණු තණ—අද කෙළෙමෙනි ම මන තෙවෙ.

248. වියොවගහු කල්, අනඞ්ගයාගේ කාලය; ගියෙ, අතික්‍රාන්ත විය; පිළි, නැවත; නවයොන විලස්, අභිනවවූ යෞවන විලාසය; මෙලෙ, නැසිනි; මොහ වැනසී, මොහයද නැසිනි; තණ දිණුි,

තෘෂ්ණාව ජීර්ණීවිය; එනි, එහෙයින්; ම මන, මාගේ චිත්තය; අද, දැන්; තෙවෙ කෙළෙම්, තපස්හි කෙළෙමි. මෙහි—පූර්වකාලයෙහි ඇති කාමාදීන්ගේ මෙ තැන අභාවය තපශ්චිත්තයට හෙතුනුයි, සම්ප්‍රාප්‍යභාව කාරකහෙතු නම් වේ. **සම්ප්‍රාප්‍යාභාවකාරක හෙතුයි.**

249. වෙනේ මෙ නොගේ පිළි-මොහු ගහනු නො වරගනෝ,
මුවමුලු මෙ නො සියබිලිදු—මනනදනේ එනි තමා

249. මෙ වෙනේ, මේ වනයයි; නොගේ, ගෘහය නොවෙයි; පිළි, නැවත; මොහු ගහනු, මොව්හු ගඞ්ගාවෝය; නො වරගනෝ, වරාඞ්ගනාවෝ නොවෙති; මෙ මුවමුලු, මේ මෘගයූථය; නො සියබිලිදු, සිය දරුවෝ නොවෙත්; එනි, එහෙයින්; තමා මනනඳනේ, තමාගේ මනොනන්‍දනය කරන්නේය. මෙහි—ගෘහාදීන්ගේ අභාවය වනාදි භාවයෙන් චිත්තසන්තොෂයට කාරණ හෙයින්, ඉතරෙතරාභාව නම් වේ. **ඉතරෙතරාභාවකාරක හෙතුයි.**

250. අරිඳනනට නොමැත්—පැවතුම් නොමපිරික්සා,
එබැවිනි ඕනට සව්—සියහ සිරිසර වඩනේ.

250. අරිඳනනට, ආර්‍ය්‍යජනයන්ට; නොමපිරික්සා පැවතුම් නොමැත්, අපරීක්ෂිත ප්‍රවෘත්තිය අවිද්‍යමානමැයි; එබැවිනි, එසේ හෙයින්; ඕනට, ඒ උත්තමයන්ට; සියහ, සතතයෙන්; සව් සිරිසර, සර්ව ශ්‍රීසාරය; වඩනේ, වර්ධනය වන්නේය. **අත්‍යන්තාභාවකාරක හෙතුයි.**

251. උයන් සහපුරු පඟුරු—නො නොමිනිමුතු මත් බිඟු,
මගීවන අඹුවන් කැත්—සිලිලැඳිලිමෙ කළ වහල්.

251. මත්බිඟු, මත්තභෘඞ්ගයන් ඇති; උයන්, උද්‍යානයන්හි; සහපුරු, සහකාර වෘක්ෂද; පඟුරු, පඟුරු වෘක්ෂද; නො නොමිනිමුතු, ප්‍රබුද්ධනුවූයේ නොවෙයි; මගිවන අඹුවන් කැත්, පථිකයන්ගේ අඞ්ගනා සමූහය; සිලිලැඳිලිමෙ, සලිලාඤ්ජලියම; වහල් කළ, උපසථම්භ කළා. මෙහි—ප්‍රබුද්ධ උද්‍යාන වෘක්ෂයන් පථික ස්ත්‍රීන්ගේ මරණට කාරණ හෙයින්, අභාවකාර්‍ය්‍යකොට ඇති ආදියෙහි වෘක්ෂයන් අප්‍රබුද්ධ හෙයින් ප්‍රාග්භාවවූ කාරකහෙතු නම් වේ. **අභාවකාර්‍ය්‍ය ප්‍රාග්භාවකාරක හෙතුයි.**

252. පෙර නැතිබැවැ සතර—බේ වනට හේබැවෙකුදු,
වනට හේ බැවෙක් යළ—අබවට හෙයිදු මේ ගින්.

252. පෙර නැතිබැව් ඈ, ප්‍රාග්භාවාදිවූ; සතරබේ, චතුර්භේදවූ; වනට හේ බැවෙකුදු, වස්තුවට හෙතුභාවයද වන්නේය; යළ, නැවත; වනට, වස්තුයෙහි; හේබැවෙක්, හෙතුභාවයෙක්ද; අබවට හෙයිදු, අභාවයට හෙතුද; මේ ගින්, මෙම ක්‍රමයෙනි. මෙහි—උයන් සහපුරු යන කවින් දැක්වූ අභාවකාර්‍ය්‍ය ප්‍රාග්භාව හෙතුය, එසේම අභාවකාර්‍ය්‍යවූ සම්ප්‍රාප්‍යභාව හෙතුය, ඉතරෙතරාභාව හෙතුය, අත්‍යන්තාභාව

හෙතුය යන මේ තුණ හා ආදි කී ප්‍රාග්භාව හෙතුව හා සතරභෙදයක් ඇති, අභාවකාය්‍යී භාවහෙතුවෙන් මෙසේම භාව අභාව කාය්‍යීහෙතුත් දතයුතු.

253. දුරුපල එකෙක් පල—අනතුරු නිපදන අනෙක්,
පලසහද නම් එක් යල—පිළිවුත් නම් නොවුත් නම්.

253. දුරුපල එකෙක්, දූරඵල නම් එක් චිත්‍රහෙතුයෙක් ඇත; පල අනතුරු නිපදන, ඵලානන්තරයෙහි නිෂ්පන්න වන්නාවූ; අනෙක්, අතික් චිත්‍රහෙතුයෙකුදු ඇත; යළ, නැවත; පලසහද නම් එක්, ඵල සහජ නම්වූ එක් චිත්‍රහෙතුයෙකුදු ඇත; පිළිවුත් නම්, ප්‍රතියුක්ත නම් වූද, නොවුත් නම්, අයුක්ත නම් වූද (චිත්‍රහෙතු ඇත).

254. තැනෙක්හි එක් හිනු—යහදසනන් නුවන් හී,
සකිසඳ්නෙඩින් මෙ තමං—මන පහර එක්ලක් වී.

254. සකිසඳිනි, සඛිඤ්ඤාව; යහදසනන්, ප්‍රියදශීනීයවූ තිගේ; නුවන් හී, නෙත්‍ර ශරය; එක් තැනෙක්හි හිනු, (අනාවූ) එක් ස්ථානයෙක්හි පතිතවිය; එයින්, ඒ ශරයෙන්; මෙ තමා මන, මේ මාගේ චිත්තය; පහර එක්ලක් වී, ප්‍රහාරයට එකලක්‍ෂ්‍ය විය. මෙහි—දෘෂ්ටියෙන් බලන ඵලය දුර හෙයින් දූරඵල නම්. **දූරඵලචිත්‍රහෙතුයි.**

255. පැසුලු නැඟි මෙරජ—විහිද වැජඹි සුපුන්සඳ,
උතුලේ රා මහමුනුදු—පෙරමැ මිහුලැසන් සියල්.

255. මෙරජ විහිද, මරීචීන් විකීර්ණකොට; වැජඹි, විජෘම්භිතවූ; සුපුන්සඳ, සම්පූර්ණ චන්ද්‍රයා; පැසුලු නැඟි, පසුව උදාවිය; සියල් මිසුලැසන්, සකල මෘගාක්‍ෂීන්ගේ; රා මහමුහුදු, රාග මහාසාගරයතෙම; පෙරමැ, පූර්වයෙහිම; උතුලේ, අතිරික්ත විය හෙවත් වැඩිනි. මෙහි—තමා විසින් කටයුතුවූ රාගවෘද්ධියට පසුව චන්ද්‍රොදය වූ හෙයින් කාය්‍යීානන්තරඵල හෙතු නම්. **කාය්‍යීානන්තරඵල චිත්‍රහෙතුයි.**

256. පහළවේ විය නව—යොනන් තනන තෙනෙන් යුත්,
සියහ සියල් දන මෙනේ—සමන නරඟ වියරු හං.

256. නවයොනන්, නවයුවතීන්ගේ; තනන තෙනෙන් යුත්, තිනියෙන්නාවූ ස්තනයෙන් යුක්තවූ; විය, වයස් හෙවත් යෞවනය; සියහ, සතතයෙන්; සියල් දන මෙනේ, සකලජනයාගේ මනස්හි; නරඟ වියරු හා සමග, අනඞ්ගවිකාරය හා එක්ව; පහළවේ, පහළ වන්නේය. මෙහි—කාය්‍යීවූ ජනයාගේ අනඞ්ගවිකාරයට කාරණවූ ස්ත්‍රීන්ගේ යෞවනය ඒ කාය්‍යීය හා එක්වම උපන් හෙයින්, සහජඵල නම්. **සහජඵලචිත්‍රහෙතුයි.**

257. දෙරණී යුරනත්තල—නඹරිඑ මුහුලුකෙලෙ යුග,
සරණ නිය සඳරුස් නා—මිනිමුතු කොඳ කුමුදු සුදු.

257. මිනිමුතු, ප්‍රබුද්ධවූ; කොඳ කුමුදු, කුන්ද කෞමුදයන්සේ; සුදු,

ධවලවූ; තා, තාගේ; යුගපරණ, චරණවන්වයෙහි; නිය සඳරැස්, නඛ චන්ද්‍රරශ්මිතොමෝ; දෙරණීපුරන්, (ප්‍රතිපක්ෂ) ධරණීශ්වරයන්ගේ; අත් තල තඹරිළු, හස්තතල නමැති තාමරස වනය; මුහුලුකෙළෙ, මුකුලිත කෙළේ. මෙහි—නඛචන්ද්‍රරශ්මිය තමාට සුදුසු කාර්‍ය්‍යය කළ හෙයින්, යුක්තාකාර්‍ය්‍ය චිත්‍රහෙතු නම්. **යුක්තකාර්‍ය්‍ය චිත්‍රහෙතුයි.**

**258.** මිහිපලුනත්පිහුම්—ඉළු තා මේ සරණපැහැ,
නව රිවිරැස් කෙරෙ මුහුලු—අරද මහරද කවරසෙ.

**258.** මහරද, මහාරාජය; තා මේ සරණපැහැ, තාගේ මේ චරණ ප්‍රභා නමැති; නවරිවිරැස්, බාලාර්කරශ්මි රාශිය; මිහිපලුන්, මහීපාල යන්ගේ; අත්, හස්ත නමැති; පියුම්ඉළු, පද්මවනය; අරද, නිරන්තර යෙන්; කවරසෙ, කුමන පරිද්දෙකින්; මුහුලු කෙරෙ, මුකුලිත කෙරේද. මෙහි—පාදප්‍රභා නමැති සූර්‍ය්‍යරශ්මිය ප්‍රතිරාජයන්ගේ හස්තපද්මයන් මුකුලිත කරණ හෙයින් අයුක්තාකාර්‍ය්‍ය නම්. **අයුක්තකාර්‍ය්‍ය චිත්‍රහෙතුයි.**

හෙතුලඞ්කාර නිමි.

---

**259.** හැඟෙන්නෙන් ඉඟියෙන්—සියුම්ගුණෙන් සියුම් නම්,
ලව නම් ලෙසින් හැඟවූ—සබවස මෙ දෙක මේ ගින්.

**259.** ඉඟියෙන් හැඟෙන්නෙන්, ඉඞ්ගිතයෙන් දැනෙන්නෙන්; සියුම් ගුණෙන්, සූක්ෂ්ම ගුණය හෙතුකොටගෙණ; සියුම් නම්, සූක්ෂ්මාලඞ්කාර නම; ලෙසින් හැඟවූ, ලෙශයෙන් හඟවනලද්දාවූ; සබවස, සභ්‍යවාක්‍යය තෙම; ලව නම්, ලවාලඞ්කාර නම හෙවත් ලෙශාලඞ්කාර නම; මෙ දෙක, මේ සූක්ෂ්ම ලව දෙක; මේ ගින්, මේ මතුකියන ආකාරයෙනි.

**260.** කිකල්හි වේ හොයි—කියන කලුනු යහ පහස්,
නොපොහොසත් දත් අඟනක්-සවණිදුවර කළ මුහුලු.

**260.** යහපහස්, සුඛස්පර්ශීය; කිකල්හි වේ හොයි, කවර කලෙක්හි වේද්‍ය හෝයි; කියන, කියන්නට; කලුනු නොපොහොසත්, වල්ලභයා අසමර්ථවත්ම; දත් අඟනක්, (ඒ) දත්තාවූ අඞ්ගනාවක්; සවණිදුවර, කර්ණෝත්පලය; මුහුලුකළ, සඞ්කුචිත කළා. **ඉඞ්ගිතසූක්ෂ්මයි.**

**261.** සවස්හි වනුයෙන්—මුහුලුකළ සවණිදුවර,
පියුම්ළු එ කොමල මුහුලු—එසඳම නොවිසබඳ කෙළෙ.

**261.** පියුම්ළු, පද්මවනය; සවස්හි, සායාහ්න කාලයෙහි; මුහුලු වනු යෙන්, සඞ්කුචිතවන හෙයින්; එ කොමල, ඒ කොමලාවූ; මුහුලු කළ, මුකුලිත කළාවූ; සවණිදුවර, කර්ණෝත්පලය; එසඳම, එවේලෙහිම; නොවිසබඳ කෙළෙ, විශබන්ධන නොවූවහු කෙළේ.

262. වුනුවු නුවන් අ෴—න අතුරෙතුළ රා සිලුටු,
ලියගි ගදෙව්නි බිජ්—කවර මූව පුල් තඹරේ.

262. න අතුරෙ, නා කෙරෙහි; වුනුවු නුවන්, මෙහෙයූ දෘෂ්ටි ඇති හෙවත් පිහිටියාවූ ඇස් ඇති; අ෴, ඇයගේ; මූව පුල් තඹරේ, මුඛඵුල්ල තාමරසයෙහි, ලියගි ගදෙව්නි, ලියගිති ගාම්භීර්යයෙන්; කවර, කෙබඳු වූදෙ; උතුළ රා, අතිරක්ත රාගයෙන්; සිලුටු, ශලිෂ්ටස්වභාවයෙක්; බිජ්, හෙබි. ව්‍යවස්ථිත සූක්ෂ්මයි.

263. ලියගිනෙකල් මදක්—ඒ කල් කලහට තමා,
ඉස්නා බස් කල රහස්—කිවූ පියොදම්හි නුවන්.

263. එකල්, එසමයෙහි; කල, කාන්තාතොමෝ; ඒ කල්කලහට; ඒ කාන්තාවූ වල්ලභයාට, තමා ඉස්නා, තමා කැමැත්තාවූ; රහස්බස්, රහස්‍ය වචනය; නුවන් පියොදම්හි, නෙත්‍රයන් මෙහෙයමින්; ලියගින්, ලයාන්විත ගිතිකායෙන්; මඳක් කිව්, ස්වල්පයක් හැඟවූ.

264. හඟුත්හොත් දෙලෙහෙනි—අත්සමස වෙ සියුම් නම්,
මේ දෙක්හිම වියත් අත්—කරණු වියමුලුනො තමා.

264. හඟුත්හොත්, පරීක්ෂා කරත්හොත්; දෙලෙහෙනි, ද්‍රවිලත්ව යෙන්; අත්සමස, අන්‍යසමාසවූ හෙවත් ද්‍රවිල සමාසොක්තිය ගැසී කොට ඇත්තේ, සියුම්නම් වෙ, සූක්ෂ්ම නම් වේ; මේ දෙක්හිම, මේ සමාස සූක්ෂ්ම දෙක්හිම; වියත් අත්කරුණු, වෙනස කියා ව්‍යාඛ්‍යාන කිරීම; තමා වියමුලුනො, තමා පිළිබඳ වේද.

සූක්ෂ්මාලඞ්කාර නිමි.

---

265. ඇතොරනතුරේ කළ—සිතු යුතු ලොමුදෙහෙන් මා,
දනිති හෝ අන් හා වී—සිහිල් නෙලෙ යේ මෙවුයන්.

265. ඇතොරන් අතුරේ, අන්තඃපුර ස්ත්‍රීන් අතුරෙහි; කළ සිතු යුතු, බඩවූ චිත්ත ඇති; මා, මාගේ; ලොමුදෙහෙන්, රොමහර්ෂයෙන්; දනිති හෝ, දනිත්දෝ හෝයි; අන් හා වී, අනිකකුදු වී; මෙවුයන්, මේ උද්‍යානයෙහි; සිහිල් නෙලෙ යේ, සීතල මාරුතය පවත්නේය. මෙහි—පුරස්ත්‍රීන් කෙරෙහි අනුරාගයෙන් වූ රොමහර්ෂය, සීත පවන් ලෙශයෙන් හැඟවීම, ලෙශාලඞ්කාර නමි.

266. ලද යහදසුනුතුළ—සතුටුකඳුලැති මෙ වියූ,
අහෝ කුසුම්රෙදෙන් නෙත්—කැලඹිති පවතිනුදුහු.

266. යහදසුන් ලද, ප්‍රියදර්ශනය ලැබීමෙන්; උතුළ සතුටුකඳුලු ඇති, අතිරික්තවූ සන්තොෂ බාෂ්ප ඇත්තේ; මෙ වියූ, මෙසේ කීයේය; අහෝ, බෙදයෙකි; පවතින් උදුහු, මාරුතයෙන් උඩුතවූ; කුසුම් රෙ දෙන්, කුසුම රජසින්; නෙත් කැලඹිති, නෙත්‍රයන් ක්ෂුභිතවී. මෙහි—ප්‍රිය දර්ශනයෙන් වූ සන්තොෂ බාෂ්පය පුෂ්පරෙණු පීඩායෙන් වියසී හැඟවීම, ලෙශ නමි.

**267.** රහසෙක් ලෙසෙස්නි—වැණුම් කෙනෙක් ලව වියත්,
පිළිවෙළිනි මෙ විලිත්වූ—ගරහ වියතන්නු මෙසේ.

**267.** කෙනෙක්, සමහර කෙනෙක්; රහස, රහස්නි; එක් ලෙසෙක්නි වැණුම්, එක්තරා ලෙශයකින් වර්ණනාකිරීම; ලව වියත්, ලවාලඞ්කාරයයි කියත්; මෙ පිළිවෙළිනි, මේ පනතින්; විලිත්වූ, දක්වූයේ; ගරහ, ගර්හාවයයි; අන්නු මෙසේ වියත්, අන් ජනකෙනෙක් මෙසේ කියත්. මෙහි—නින්දාලෙශයෙන් කළ ස්තුතිද; ස්තුතිලෙශයෙන් කළ නින්දාද ලෙශ නම යතු භාවයි.

**268.** සිඃනී මෙ තමාහට—කිමෙක් දෙකුරුරස් විසින්,
නිපුණුවට අරිපුමේ—පුනු පියොවෙකැද්ද යමෙක්.

**268.** යමෙක්, යම් පුරුෂයෙක්; නිපුණුවට, නිර්දොෂවීමට, අරිපුමේ පුනු පියොවෙක් ඇද්ද, ආරාධනාවෙහි යොමුවූ ප්‍රවෘත්තියක් ඇත්තේද හෙවත් චාටුක්‍රියා දනිද්ද, එ කුරුරස් විසින්, ඒ ක්‍රූරයා විසින්; සිඃනී, යෙහෙලිය; මෙ තමාහට, මේ මට; කිමෙක්ද, කවර ප්‍රයොජනයෙක්ද. මෙහි—චාටුක්‍රියා දන්නිසි වල්ලභයාට නින්දාලෙශයෙන් ස්තුතිකළ හෙයින්, **ස්තුති ලවයි.**

**269.** කෙළිදළ තැත් වරා—රණවෙස්හි බදද යමෙක්,
නියට සුරිඳු කියහැකි—සබඳ දහර නිරිඳු බඳ.

**269.** යමෙක්, යම් රජෙක්; කෙළිදළ තැත් වරා, ක්‍රීඩායෙහි දෘඪ උත්සාහය හැර; රණවෙස්හි බදද, යුඩවෙශයෙහි බඩද හෙවත් යුඩයට සැරහුනේද; සුරිඳු බඳ, සුරෙන්ද්‍රයා බඳු දෙහ ඇති; හෙ දහර නිරිඳු, ඒ තරුණ නරෙන්ද්‍රතෙම; නියට සබඳ හැකි, නිට සම්බන්ධයට සුදුසුසි. මෙහි—රතික්‍රීඩායෙහි බඩවූ අධ්‍යාස ඇති රාජකුමාරිකාවට විවාහ ප්‍රාර්ථනාකරණ තරුණ රාජයාගේ යුඩාභිප්‍රාය බව කියනකල සඛිය විසින් ස්තුතිලෙශයෙන් නින්දාව කරණලද හෙයින්, **නින්දා ලවයි.**

ලෙශාලඞ්කාර නිමි.

---

**270.** පෙර කී වත් පමණ—පිළිවෙළිනී යළ කිවත්,
යෙදුමොවුනොවුන් හා වත්-පිළිවෙළ වෙ ගේ මේගින්

**270.** පෙර කී වත් පමණ, පූර්වොද්දිෂ්ට වස්තූන් ප්‍රමාණවූ; යළ කීමත්, පසුව නිර්දිෂ්ටයන්ගේ; පිළිවෙළිනි, පනතින්; ඔවුනොවුන් හා යෙදුම් වත්, අන්‍යොන්‍යයන් හා යෙදීම් වත්හොත්; හේ පිළිවෙළ වෙ, ඒ ක්‍රමාලඞ්කාර නම් වේ; මේ ගින්, මෙ පරිද්දෙනි.

**271.** සිනිඳු සිනා වූවත්—නුවන්පැහැ විල්කෙළියේ,
සරතැස් තෙනි කල්බඳ—කුමුදු කමලිඳුවර නී.

**271.** කල්බඳ, කාන්තාවූ දෙහ ඇත්තිය; විල් කෙළියේ, තඩාග ක්‍රීඩායෙහි; සරතැස් නි, ශ්‍රාන්තාවූ නියේ; සිනිදු, ස්නිග්ධවූ; සිනා

වුවත් භුවන් පැහැ, ස්මිතවන්ද්‍රනෙත්‍ර ප්‍රභාවන්; කුමුදු කමලින්‍දීවර, කෞමුද පද්ම නීලොත්පලයන් විසින්; තෙනි, විවාකෙළේ. මෙහි—අදි සී ස්මිතවන්ද්‍ර නෙත්‍රයන්ට පසුව සී කුමුදු කමල් නීලොත්පලයන් පිළිවෙළින් යෙදෙන හෙයින්, ක්‍රමාලඞ්කාරයි.

ක්‍රමාලඞ්කාර නිමි.

---

**272.** පිය නම් කල්වදන්—රසවත් නම් රෙසෙන් යුත්,
හිමි නම් දුනු අභිකර—ලකරසිරි තුන් මෙ නියර.

**272.** පියනම්, ප්‍රෙයොලඞ්කාරය නම්; කල් වදන්, මනොඥ වච නයි; රසවත් නම්, රසාලඞ්කාරය නම්; රෙසෙන් යුත්, (ශෘඞ්ගාරාදි) රසයෙන් යුක්තය; හිමි නම්, ඌර්ජස්වී නම් (අලඞ්කාරය); දුනු අභිකර, ජනිතවූ අහඞ්කාර ඇත්තේය; ලකර සිරි තුන්, (මේ යථොක්තවූ) අලඞ්කාරශ්‍රී තුණ; මෙ නියර, මේ ආකාරයි.

**273.** යමෙක්ද අද ගොවිඳු—සතොස් ගෙ ආ කල්හි,
තම්හට උපන් ගේ වෙනු—පිළි තා මෙ ආ ගමනින්.

**273.** ගොවිඳු, ගොවින්‍දයා; ගෙ ආ කල්හි, ගෘහයට ආ කල්හි; අද, අද දවස්; තමහට උපන්, මට උපන්නාවූ; සතොස්, සන්තොෂය; යමෙක්ද, යම් පමණෙක්ද; හේ, එබදු සන්තොෂයෙක්; පිළි, නැවත; තා මෙ ආ ගමනින්, තා මේ ආවාවූ ගමනින්; වෙනු, වන්නේ වේනුයි. මේ—විදුර්‍ය තමන්ගේ ගෙට ආ කල්හි උපන් ප්‍රීතිය නැවතත් උත්ම ආ ගමනකින් මිස අන් අයුරකින් නොවන තියාව කියා විදුර නරෙන්‍ද්‍ර යන් විසින් කළ ප්‍රීතිප්‍රකාශයයි. **ප්‍රෙයොලඞ්කාරයි.**

**274.** සිසි හිරු මරු දෙරණ—අග තො ගුවන් හුනන් යුත්,
න මේ විලසික්ම තෙනෙත්—කරතැස්සමු කවරමෝ.

**274.** තෙනෙත්, ත්‍රිනෙත්‍රය; සිසි, චන්‍ද්‍රයා හා; හිරු, සූර්‍ය්‍යයා හා; මරු, මාරුතය හා; දෙරණ, ධරණිය හා; අග, වහ්නිය හා; තො, ජලය හා; ගුවන්, ආකාශය හා; හුනන් යුත්, යාගයුක්තය හා හෙවත් ජයමාන හා; න මේ විලස්, තාගේ මේ (අෂ්ටමූර්ත්ති සඞ්ඛ්‍යාත) විලාසය; ඉක්ම, අතික්‍රාන්තව; ඇස් සමුකරත්, ප්‍රත්‍යක්ෂ කරන්නට; කවරමෝ, (අපි) කවරමෝද. මේ—තොපගේ අෂ්ටමූර්ත්තිය ඉක්ම විලාසය දක්නහෙමෝදැයි ඊශ්වරයන් දක රාමවම්න් රජනු කී ප්‍රිය වචනයි. **ප්‍රෙයස් නම්.**

ප්‍රෙයොලඞ්කාර නිමි.

---

**275.** නිදුටු පෙර මිහුරු—පණ රස මෙහි පියඹ රෙස්,
විරු කුළුණු අසිරි වහස්—බියද, නැහැරුමට වේ.

**275** රස, රසාලඞ්කාරයතෙම; පෙර, පූර්‍වයෙහි හෙවත් ප්‍රථම

පරිච්ඡෙදයෙහි, මියුරු පණ නිදුටු, මධුරප්‍රාණයෙහි නිර්දිෂ්ටය, මෙහි, මේ ස්ථානයෙහි (රසයතෙම); පියඹ, ශෘඞ්ගාරය; රොස්, රෞද්‍රය; විරු, වීරය; කුළුණු, කරුණාය; අසිරි, අද්භූතය; වහස්, හාස්‍යය; බියදු, භයානකය; නැහැරුම්, බිභත්සයයි; අට වේ, අටක් වේ.

276. මියන ඇය සමගම—මියද යහදසුනිස්නා,
තමහට එතර මෙ සියෝ—සිරිසර කවර සේ වී.

276. මියන, මියන කල්හි; ඇය සමගම මියද, ඒ කාන්තාව හා එක්වම මෘත්‍යුවයද; යහදසුන් ඉස්නා, ප්‍රියදර්ශනයන් කැමැත්තාවූ; තමහට්, මහට; එතරම්, ඒසා මහත්වූ; එ සියෝ සිරිසර, ඒ සම්භොග ශ්‍රීසාරය; කවරසේ වී, කවර පරිද්දෙකින් වීද. මේ ආදි විද්‍යුත්තාව සිට සම්භොගයට පැමිණියාවූ පුරුෂයාගේ වචනයෙහි රතිගුණය විප්‍රලම්භයෙන් ශෘඞ්ගාරභාවයට පැමිණ රසවත්වූ බව දතයුතු. ශෘඞ්ගාර රසයි.

277. රැගෙණ කෙහෙපත ඇ—යමැදිද මා පෙරට ලා,
පව්වූ එ දුස්සන් දුටු—මොහොතෙක්හි කුම් දෙනුයේ.

277. යම්, යමෙක්; ඇ, ඒ ද්‍රෞපදිය; කෙහෙපත රැගෙණ, කෙශයෙහි හැරගෙණ; මා පෙරට ලා ඇදිද, මාගේ අභිමුඛයෙහි ලා ආකර්ෂණය කෙළේද; දුටු, දක්නාලද්දේය; පව්වූ එ දුස්සන්, පාපිවූ ඒ දුශ්‍යාසනයතෙම; මොහොතෙක්හි, මුහූර්තයෙක්හිද හෙවත් ක්‍ෂණයෙක්හිද; කුම් දෙනුයේ, කුමට ජීවත්වන්නේද. මෙසේ තමා අඹු ද්‍රෞපදිය දූසෙහිදිනීන් හිසකේ ගෙණ ඇද්දාවූ දුර්යොධන සහොදරවූ දුශ්‍යාසනයාට භීමසෙනයාගේ ක්‍රොධය වැඩී රෞද්‍රවී. රෞද්‍ර රසයි.

278. නොංදුන සහ සයුරු—දෙරණ නොකැර මහහුනන්,
නොපවත්වා මහත් දන්—මිහිපල් වනෙම් ම කෙසේ.

278. සහසයුරු දෙරණ, සසාගරවූ ධරණිය; නොදූන, ජයනොගෙණ; මහහුනන් නොකැර, මහායාග නොකොට; මහත් දන් නොපවත්වා, මහාදාන නොපවත්වා; ම කෙසේ මිහිපල් වනෙම්, මම් කෙසේ රජ නම් වෙම්ද. මෙසේ උත්කෘෂ්ට උත්සාහය වීරරස නම් වේ. වීර රසයි.

279. එ කොමලඟහට මල්—යහතුදු හොත රද දෙනේ,
හෝ දූන් හොංවී කවරසේ—සියාදෙලෙහි වියෝ වී.

279. එ කොමලඟහට, ඒ කොමලාඞ්ගියට; මල් යහතුදු හොත, කුසුම ශයනයද පවා; රද දෙනේ, රූජ්ජනනය කරන්නේය; හෝ, ඒ කාන්තාව; දූන්, දූන්මනාහි; වියෝ වී, විප්‍රයොගයට පැමිණ; සියාදෙලෙහි, චිතකාග්නියෙහි හෙවත් දරසෑයෙහි; කවරසේ නොවී, කෙසේනම් වැද හොව්දෝ. කරුණා රසයි.

280. පල රඟ පට කිසල්—රුසිරබරණ කුසුම්රැස්,
ඝනසා වර නිවෙස් මේ—විසිතුරු එ නඳන තුරුන්.

280. එ නඳන තුරුන්, ඒ නන්දනොද්‍යානයෙහි වෘක්ෂයන්ගේ; කිසල්, කිශලය නම්; පල රඟ, ව්‍යක්තවූ පැහැ ඇති; පට, පට වස්ත්‍රමය; කුසුම්රැස්, කුසුමරාශිය නම්; රුසිරබරණ, රුචිරාභරණමය; ඝනසා, ඝනවූ ශාඛා නම්; වර නිවෙස්, උත්තමවූ නිවේශමය; මේ විසිතුරු, මේ විචිත්‍රරස නම්. **අද්භූත රසයි.**

281. තුබුන් මලැතිය මේ—පියපුරුබර වොරජනා,
නවලද පැටි කරත් පත්—නිශරජ උතුරුසළුයෙනි.

281. තුබුන් මලැතිය, අභිනවවූ හෙවත් නොමිරිකුනාවූ මල්දම් ඇති තැනැත්තිය; වොරජනා, විරාජමානවූ; මෙ පියපුරුබර, මේ පයෝධරභාරයෙහි; නවලද, අභිනවව ලද්දාවූ; නිශරජ, නිශාරජිය; උතුරුසළුයෙන්, උත්තරසාටකයෙන්; පැටිකරත් පත්, මුවහකරත් හොත් යුක්තයි. මෙහි—"තුබුන් මල්" යී කීමෙන් අභිනව විවාහය කීහු. **හාස්‍ය රසයි.**

282 මෙ සුරරජ විදුරව්—දරඅතොසල හුතැස් යුත්,
සමරුත් දිතඟනො යමක්-දුහැ සත්න හෙත්ද තෙලෙ

282. යමක් සමරුත්, යම් ආයුධයක් සමරණය කරත්ම; දිතඟනො, දෛත්‍යාඞ්ගනාවෝ හෙවත් අසුර කාන්තාවෝ; සත්න දුහැ, සංඥාව හැර; තෙලෙ හෙත්ද, සතලයෙහි පතිතවෙද්ද; දරඅත්, ධාරාන්තයෙහි; ඔඃල, ආශ්‍රිතවූ හෙවත් පිහිටියාවූ; හුතැස්යුත්, වහ්නිඇති; මෙ සුරරජ විදුරව්, මේ ශක්‍රයාගේ වජ්‍රායුධයයි. **භයානක රසයි.**

283. බිබී තා සතුරන්—හුරිරු දෙහොතින් උකහා,
නසිත් පිසස්හු කවද—සුවහස් සහතුණබරණ.

283. තා සතුරන් හුරිරු, තාගේ ශත්‍රූන්ගේ රුධිරය; දෙහොතින්, හස්තසම්පුටයෙන්; උකහා බිබී, උකාහෙණ පානය කරමින්; අතුණු අබරණ, අන්ත්‍රයන් ආභරණකොට ඇති හෙවත් බඩවැල් පලන්; පිසස්හු, පිශාචයෝ; කවද සුවහස් සහ, කවන්ධ සහස්‍රයන් හා එක්ව; නසිත්, නටන්නාහ. **බිභත්ස රසයි.**

රසාලඞ්කාර නිමි.

---

284. නොවේවා බිය තා—මෙනෙහි පිළිවක්මි වී,
වැළහෙත්නමොවූනතුරේ—පිළි නොපවති තමා කග.

284. පිළිවක්මි වී, ප්‍රතිපක්ෂයෙම් කියා; තා මෙනෙහි, තාගේ සිත්හි; බිය නොවේවා, භයක් නොවේවා; වැළහෙත්නම්, (යම් කෙනෙක්) සැඟවෙන්නාහු වූහුනම්; ඔවුනතුරේ, ඔවුන් අතුරෙහි; තමා කග, මාගේ ඛඩ්ගය; පිළි නොපවති, නැවත ප්‍රවෘත්තිත නොවේ.

මෙහි—බිඳුනු තැනැත්තන් නොමරන්නේයි කී හෙයින් මේ වීරපුරුෂයාගේ අහඞ්කාර යුක්ත වචනය ඌර්ජස්වී නම්. **ඌර්ජස්ව්‍යලඞ්කාරයි.**

ඌර්ජස්ව්‍යලඞ්කාර නිමි.

---

285. කැමතියත නොකියා—පිළි ඒම සිදුවන් නව,
පිළිපදනා වදන් යම්—පරියාකිහුම් හෙ මෙසේ.

285 කැමතියත නොකියා, අභිප්‍රෙතාර්ථය නොකියා; පිළි, නැවත; ඒම සිදුවන්නව, ඒ අර්ථයම සිඬවන පිණිස; පිළිපදනා, ප්‍රතිපාදනය කරන්නාවූ; යම් වදන්, යම් වචනයෙක් ඇද්ද; හෙ, එය; පරියාකිහුම්, පර්‍ය්‍යායොක්ති නම් වේ; මෙසේ, (ඒ) මෙ පරිද්දෙනි.

286. කඩා මල් කොවුල්—නවලොඳුල අඹයටියේ,
මමෙ වළකම් උයන්හි—දෙදෙනා යෙහෙන් වසත්වා.

286 උයන්හි, උද්‍යානයෙහි; නවලොඳුල, අභිනවව සඤ්ජාතවූ; අඹයටියේ, චූතයෂ්ටියෙහි; මල්, කුසුමයන්; කොවුල්, පරභෘතතෙම; කඩා, කඩයි; මම් එ වළකම්, මම් ඒ නිවාරණය කෙරෙමි; දෙදෙන, (තොපි) දෙදෙනා; යෙහෙන්, සුවසේ; වසත්වා, වාසයකරත්වා. මෙහි—සම්භොගාර්ථිවූ ස්ත්‍රීපුරුෂ දෙදෙනාට අවකාශ දෙන අභිප්‍රායෙන්, ඒ අර්ථසිඬියට අනුරූපව කියනලද අනික් කාරණයවූ මේ වාක්‍යය, **පර්‍ය්‍යායොක්ති නම් වේ.**

පර්‍ය්‍යායොක්ති අලඞ්කාර නිමි.

---

287. සමහිත නම් යමක්—නිපදමෙහි බද නැත්හට,
පුන ඒම සාහනුවා—විදින් පිළිලබ හෙ මෙසේ.

287. යමක්, යම් අර්ථයක්; නිපදමෙහි, නිෂ්පාදන කිරීමෙහි; බද නැත්හට, බඬොත්සාහ ඇත්තාහට; පුන, නැවත; ඒම, ඒ අර්ථයම; සාහනුවා, සාදන්නක්හුගේ; විදින්, දෛවයෙන්; පිළිලබ, ප්‍රතිලාභය; සමහිතනම්, සමාහිතාලඞ්කාරනම්වේ, හෙ මෙසේ, ඒ මේආකාරයෙනි.

288. සහවන්නසින් ඇය—කරණ සරණත මුදුනේ,
තමහට වැහරව යෙහෙන්-ගනගැඹුම්පන් එ කෙණේ.

288. ඇය සහවන්නසින්, ඇය හා සමගවන අධ්‍යශයෙන්; සරණත, චරණය; මුදුනේ කරණ, මස්තකයෙහි කරන්නාවූ; තමහට, මට; යෙහෙන් වැහරම, සුවසේ උපකාරව; එ කෙණේ, ඒ ක්ෂණයෙහි; ඝනගැඹුම් උපන්, මෙඝ ගර්ජනය උපනි. මේ, ස්ත්‍රිය වශගකොට ගැන්මෙහි බඬාධ්‍යශයෙන් පාදනමස්කාර කරන්නහුගේ දෛවයෙන් ඇගේ මානභඞ්ගයට හෙතුවූ ඝනගර්ජනය ලැබීම, **සමාහිත නම්.**

සමාහිතාලඞ්කාර නිමි.

289. සැපතට සිතට හෝ—අනුතුරු යම් මහත්බැව්,
කියත් වියත් මහත්මෝ—උදාත්ත යෙත් හෙ මෙසේ.

289. සැපතට, සම්පත්තියට හෝ; සිතට හෝ, චිත්තයට හෝ; අනුතුරු, උත්තරයක් නැත්තාවූ; යම් මහත්බැව්, යම් මහත්භාවයක්; කියත්, කියත් හොත්; වියත් මහත්මෝ, ව්‍යක්තවූ මහාත්මයෝ; උදාත්තයෙත්, උදාත්තාලඞ්කාරයයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි.

290. රුවන්බිත් පුවුටු—පිළිබිඹු සහස්නි සියෝ,
හනුමත් තැතින් දත් ලක්—පුරෙහි දසගිවිනු සෙබේ.

290. ලක්පුරෙහි, ලඞ්කාපුරයෙහි; රුවන්බිත් පුවුටු, රත්නභිත්තියෙහි ප්‍රවිෂ්ටවූ; පිළිබිඹු සහස්නි, ප්‍රතිබිම්බ සහස්‍රයෙන්; සියෝ, යුක්තවූ; දසගිවිනු, දශග්‍රීවයා හෙවත් රාවණයා; හනුමත්, හනුමන්ත නම් වානර තෙම; සෙබේ, සභායෙහි; තැතින් දත්, යත්නයෙන් දති. මෙහි ස්ඵටික දර්පණභිත්ති ඇති සභාගෘහයෙහි හුන් රාවණයාගේ ඡායාරූප බොහෝ බැවින් හනුමත් ඔහු හැඳිනගත නොහී හිඳ, යත්නයෙන් හැඳිනගතැයි කීමෙන් රාවණයාගේ විභූතියෙහි උදාත්තතාව කී. **විභූත්‍යුදාත්තයි.**

291. නොවත් විලූ ඒ රම්—ගුරුහු වදනික්මෙන්නට,
යමෙක් ද වූයේ සහස්—දසගිවිනු හිස් සිඳුමට.

291. යමෙක්, යම් රාමයෙක්තෙම; දසගිවිනු, දශකණ්ඨයාගේ; හිස් සිඳුමට, ශිරශ්ඡේදනය පිණිස; සහස් වූයේද, සාහසික වූයේද; ඒ රම්, ඒ රාමතෙම; ගුරුහු වදනික්මෙන්නට, ගුරුහුගේ වචනය අතික්‍රාන්ත වන්නට; නොවත් විලූ, අසමර්ථ වීලූ. මෙහි, ත්‍රෛලොක්‍ය ජයීවූ රාවණයාගේ ශිරශ්ඡේදයට පවා සමර්ථවූ රාමයා තමා තුදුස් හවුරුද් දක් වල හිඳ අවුත් රජකරවයි වලට යවා; දශරථයන් මළ කල භරතයා ගොසින් රාජ්‍යයට ආරාධනාකළ කල්හි රාජ්‍යය නිසාද ගුරුන් කී අවධියට පූර්ව නොගිය හෙයින් ගුරුවචනය නොඉක්මවූ බැවි රාමයන්ගේ ආශයොදාත්ත බවයි. **ආශයොදාත්තයි.**

උදාත්තාලඞ්කාර නිමි.

---

292. පිළිසෙව් වෙ වලකා—එකක්හු අන්හු දසුන්,
හෙ මෙසෙ නොපස්හි කුසුම්—සර එව්හු සුවහස් වි.

292. එකක්හු වලකා, එක් පදාර්ථයක්හු නිවර්තනය කොට; අන්හු දසුන්, අනිකක්හු දක්වීම; පිළිසෙව් වෙ, ප්‍රතිෂෙධ හෙවත් අපහ්නුති (නම්) වේ; හෙ මෙසේ, ඒ මෙසේයි; කුසුම්සර, කුසුමශරයාගේ; නොපස්හි, පඤ්චබාණ නොවෙයි; එව්හු, ඒ අනඞ්ගයාගේ; සර සුවහස් වි, ශර ලක්‍ෂගණනැයි කියායි. මෙහි-අනඞ්ගයාගේ පඤ්චබාණබව වලකා ශරශතසහස්‍ර බව දක්වීමෙන්, අපහ්නුති නම් වි. **අර්ථාපහ්නුතියි.**

293. සඳුන් සිසිරැස් මරු—දකුණු වී මට හුතැස්රැස්,
සිඟිලැස්ලූ අන්නට යත්—විසාපිළිසෙව් නම් වේ.

293. සඳුන්, චන්‍ද්‍රයාද; සිසිරැස්, චන්‍ද්‍රරශ්මිද; දකුණු මරු, දක්‍ෂිණ මාරුතයද; මට හුතැස්රැස් වී, මට හුතාශනරශ්මි වීය හෙවත් ගිනිරැස් වීය; අන්නට, සෙස්සන්ට; සිඟිලැස්ලූ යත්, සීතලයෝයයි කියත්හොත්; විසාපිළිසෙව් නම් වේ, විෂයප්‍රතිෂෙධ නම් වේ. **විෂයාපහ්නුතියි.**

294. අමා මෙරජ සුපුන්—සිසි යත් නැත් තමා යේ,
වසඳ, රැසැත් මෙ වියත්—සියරු පිළිසෙව් නම් වේ.

294. සුපුන් සිසි, සම්පූර්ණ චන්‍ද්‍රතෙම; අමාමෙරජ යත්, අමෘත රශ්මියයි කියත්හොත්; යේ තමා නැත්, කාරණ තමාම නැත; මෙ, මේ චන්‍ද්‍රතෙම; වසඳ, විශද්‍යකවූ; රැසැත්, රශ්මි ඇත්තේයයි; වියත්, කියත්හොත්; සියරුපිළිසෙව් නම් වේ, ස්වරූප ප්‍රතිෂෙධ නම් වේ. **ස්වරූපාපහ්නුතියි.**

අපහ්නුත්‍යලඞ්කාර නිමි.

---

295. නොයෙක් අරුතින් යුත්—එක්රුවදන් සෙලෙස් නම්,
යේ වේ නුබුන්පද බුන්—පදඅත්මැ යි දෙනියර.

295. නොයෙක් අරුතින් යුත්, අනෙකාර්ථයෙන් යුක්තවූ; එක්රු වදන්, එකරූප වචනය; සෙලෙස් නම්, ශෙලෂ නම් වේ; යේ, ඒ ශෙලෂය; නුබුන් පද, අභින්න පදය; බුන්පදඅත්මැ යි, භින්නපදාත්මක යයි කියා; දෙනියර, ද්විප්‍රකාරයි.

296. දිය මුදුනට එක්—ලකර කෙසුරුසිරි සියෝ,
ලද පළතෙදිනි පුබුදු—පිළි දූත් මෙ රජකමලුදු.

296. දියමුදුනට, ජගත්මස්තකයට නොහොත් ජලමස්තකයට; එක් ලකර, එකාලඞ්කාරවූ; කෙසුරු සිරි, සිංහසමාන ශ්‍රීන් නොහොත් කෙශර ශ්‍රීන්; සියෝ, යුක්තාවූ; මෙ රජකමලුදු, මේ රාජෝත්තමද නොහොත් මේ නායක පද්මයද; පිළි දූත්, දූත්වනාහි, ලද, ලද්දාවූ; පළතෙදිනි, ප්‍රසිද්ධවූ තෙජස් කරණකොටගෙණ නොහොත් ව්‍යක්තවූ සූර්‍ය්‍යතාපය කරණකොටගෙණ; පුබුදු, ප්‍රබොධවී. මෙහි "දියමුදුනට" යන පදයද "කෙසුරුසිරි" යන පදයද, "මෙරජකමල්" යන පදයද, "පළතෙදිනි" යන පදයද ඔබින්ඔබ පදයන් නොබිඳ මේ දෙපක්‍ෂයටම අර්ථ ගතයුතු හෙයින්, මේ අභින්නපද ශෙලෂ නමි. **අභින්නපද ශෙලෂයි.**

297. සිට දසරදදමින්—ඒ රජනා වොරජනා,
අනුබඳ දන්සිරින් බඳ—සියසපු ලොලුන් අදහස්.

297. දසරදදමින් සිට, දශරාජධර්මයෙන් පැවත; වොරජනා, විරාජ මාන වන්නාවූ; ඒ රජනා, ඒ රාජෝත්තමතෙම; අනුබඳ දන්සිරින්,

නිරන්තරවූ දෘෂ්ටීන්, සියසපුලොලුන්, සුඛසම්පත්තිලුබ්ධයන්ගේ, අද හස් බද, අධ්‍යාස බඳ හෙවත් තමාගේ සම්පත්තිය කැමැත්තවුන් දෘෂ්ටියෙන් සිත් ගති. නොහොත්—සරද, සාරදවූ; දමින්, දමයෙන් හෙවත් යනැකිල්ලෙන්; සිටද, සජීතවද; චොරජනා, හොබනාවූ; ඒ නාරජ, ඒ හස්තිරාජතෙම; දන්සිරින්, මදශොභාවෙන්; අනුබඳ, අනුබද්ධවූ; සියසපුලොලුන්, ශතගණන් භෘඞ්ගලොලයන්ගේ; අදහස් බද, අධ්‍යාස ගති. මෙහි—"දසරද" යනාදිවූ පදයන් භින්නව ඔබ මොබ ගොස් දෙපක්ෂයට අර්ථ යෙදෙන හෙයින් භින්නපදශ්ලෙෂ නම්. **භින්නපදශ්ලෙෂයි.**

298, උවම් වැතිරෙක රූ—අකෙව් මෙ ඈ කළ විසා,
පෙර දක්වූ සෙලෙසිනත්-දෙයෙකැත් එතරවත්නෙම්.

298. උවම්, උපමාය; වැතිරෙක, ව්‍යතිරෙකය; රූ, රූපකය; අකෙව්, ආක්ෂෙපය (යන); මෙ ඈ, මේ ආදිය; විසාකළ, විෂයකළාවූ; පෙර දක්වූ, පූර්වයෙහි (ඒ ඒ අලඞ්කාරස්ථානයෙහි) දක්වූ; සෙලෙසින්, ශ්ලෙෂයෙන්; අත් දෙයෙකැත්, අන්‍යවූ ශ්ලෙෂයෙකුත් ඇත; එතර වත්නෙම්, ඉක්බිත්තෙන් කියම්.

299. නොබුන් කම් සනියම්—අවිරුදුකම් මෙයින් අන්,
විරුදත්ම නොවිරුදු රූ—නියම් අකෙව් සියෝ නම්.

299. නොබුන්කම්, අභින්නකර්මශ්ලෙෂය; සනියම්, සනියමශ්ලෙෂය; විරුදුකම්, විරුද්ධකර්මශ්ලෙෂය; මෙයින් අන්, මෙයින් අන්‍යවූ (අවිරුද්ධකර්මශ්ලෙෂය); විරුදත්ම, විරුද්ධාත්ම ශ්ලෙෂය; නොවිරුදු රූ, අවිරුද්ධරූපශ්ලෙෂය; නියම් අකෙව් සියෝ නම්, නියමාක්ෂෙප රූපක නම් ශ්ලෙෂදූයි (යන මේ) ශ්ලෙෂයෝ වෙත්.

300. සිනිඳු පිය මියුරු—පළටකළ රා වමියන්,
තුවනත්නු සිකිකත්හුදු—පියොදත්ම අදති පියන්.

300. සිනිඳු, ස්නිග්ධවූ; පියමියුරු, ප්‍රියමධුරවූ හෙවත් ස්වභාවසුන්දරවූ; රා පළටකළ, රාගය ප්‍රකාශකළාවූ; වමියන් තුවනත්නු, කාන්තාවන්ගේ නෙත්‍රයෝද; සිකිකත්හුදු, සඛීස්ත්‍රීහුද; පියොදත්ම, මෙහෙයත්ම; පියන් අදති, වල්ලභයන් ආකර්ෂණයකෙරෙත්. මෙහි—සිනිඳු බවද; ස්වභාව මධුර බවද; සිත ඇති රාගය ප්‍රකාශකරණ බවද, සමවූදෘෂ්ටිය හා දූතින් තමන් මෙහෙයත්ම වල්ලභයන් ඒ කාන්තාවන් කරා අදනා ක්‍රියාවද එකමිතු වී, අභින්නක්‍රියා නම් වේ. **අභින්නකර්මශ්ලෙෂයි.**

301. සපුරුහිමය විපක්—සලසැවිහි මෙ ගුණසිඳුම්,
ගජනතුරේ මෙදෙව්කර—නරනිඳු රකුත් න දෙරණ.

301. නරනිඳු, නරොත්තමය; න දෙරණ රකුත්, නා ධරණීය රක්ෂාකරණ කල්හි; විපක්, විපක්ෂයෙක් නොහොත් සාදෘශ්‍යයෙක්; සපුරුහිමය, සාගරයෙහිමය; ගුණසිඳුම්, ගුණ නැසීම නොහොත්

දුහුඹුය සිඳිම, මෙ සලසැව්හි, මේ චචලවූ චාපයෙහිමය; මෙදෙව්කර, මදවිකාරය නොහොත් මේ දෙව්කාරය, ගජනතුරේ, (මේ) හස්තින් කෙරෙහිමය. [මෙකී දේ] මෙහි මුත් සෙසු තැන නැතැයි හැඟවූ හෙයින් මේ සත්‍යමශ්ලේෂ නම්. **සනියමශ්ලේෂයි.**

302. විලිත්කළ රා දල—වල අඟ මගී තැවූමෙක්,
පුවස් නැසී සහස්රස්—මුවරදෙදෙ මෙ වැජඹෙතේ.

302. රා විලිත්කළ, රත්පැහැය ප්‍රකාශකළාවූ නොහොත් රාගය ප්‍රකාශකළාවූ, දලවල අඟ,ජ්වාලාකුල ශරිර ඇති; මගි තැවුමෙක්, පරිකයන්ට සන්තාපවූ; නොහොත්-දලවල අඟ, ඊශ්වරලලාට නෙත්‍රයෙන් නිෂ්ක්‍රාන්ත වහ්නිජ්වාලායෙන් අවලිඪවූ ශරිර ඇති, මගි තැවුමෙක්, පථිකයන්ට විප්‍රවාසි හෙයින් සන්තාප කරන්නාවූ; සහස්රස්, සහස්‍රරශ්මි තෙම, පුවස් නැසී, ප්‍රකාශවලා සැඟවිනු, මෙ මුවරදෙදෙ, මේ මකර ධ්වජතෙමේ; වැජඹෙතේ, පැලඹෙන්නේය. මෙහි—ශ්ලේෂයෙන් කී සූර්‍ය්‍ය කාම දෙදෙනා කෙරෙන් එකෙකු සැඟවෙන හෙයිනුත්, එකෙකු පැලඹෙන හෙයිනුත් මේ විරුඬක්‍රියා නම්. **විරුඬ කර්මශ්ලේෂයි.**

303. මිහුරු මනකල් රා—වඩන කොමල කෙවිල්ලන්,
ඇසෙත් තෙපුල්හු සියල්—පැහැසෙත් නිලුපුලැසියෝ.

303. මිහුරු, මධුරවූ; මනකල්, චිත්තප්‍රියවූ; රා වඩන, රාගය වඩන්නාවූ; කොමල, කොමලවූ; කෙවිල්ලන්, කොකිලාවන්ගේ; තෙපුල්හු, වචනයෝ, ඇසෙත්, ශ්‍රොත්‍රවිෂය වන්නාහ; සියල් නිලුපුලැසියෝ, සකල නීලොත්පලාක්ෂීහු හෙවත් රූපස්ත්‍රීහු; පැහැසෙත්, ආලිඞ්ගනය වෙත්. මෙහි—ශ්ලේෂයෙන් කී කොකිලගිතිකා ඇසෙන බව හා ස්ත්‍රීන්ගේ පැහැසෙන ක්‍රියාව හා දෙක විරුඬ ක්‍රියා නොවන හෙයින් අවිරුඬකර්ම නම්. **අවිරුඬ කර්මශ්ලේෂයි.**

304. නොවෙන්වද සියල්—දිය රක්හි තො අනත්වද,
නොනාහි ඉසුරු වූවද—පිළි න බුජග සසග නැත්.

304. නොවෙන්වද, වෙනස් නොවද නොහොත් විපර්‍ය්‍යාස නොවද; තො සියල්දිය රක්හි, තෝ සමස්තලොකය රක්‍ෂාකරන්නෙහිය; අනත්වද, ගුණ ආදීන් අනන්තවද; නොනාහි, අනායකයෙහිය හෙවත් නායකයක්හු නැත්තෙහිය; නොහොත්—අනත්වද, අනන්ත නාගරාජ වද; නොනාහි, නාග නොවන්නෙහිය; පිළි, නැවත; න ඉසුරු වුවද, නා ඊශ්වර වුවද; බුජඟ සසග නැත්, ධූර්තයන්ගේ සංසර්ග නැත නොහොත් සර්පසංසර්ග නැති. **විරුඬාකාමශ්ලේෂයි.**

305. උදා එලඹි පතළ—තෙදුදුල දදිදු ලෝපල්,
විමලත්ම උතුම අනත්—සිරි ලකළ තො කලාංවත්.

305. උදා එලඹි, අභිවෘඬියට උපසම්පන්නවූ නොහොත් උදයාරූඪවූ; පතළ තෙද උදුල, ව්‍යාප්තවූ තෙජසින් උජ්වලිතවූ නොහොත්

චන්ද්‍රකාන්තවූ කාන්තියෙන් බබලන්නාවූ; දදිදු, බ්‍රාහ්මණයන්ට නායකවූ නොහොත් තාරකාවන්ට නායකවූ; ලෝපල්, ලෝ රක්නාවූ නොහොත් ලොකපාලවූ; විමලත්ම, නිර්මලවූ ආතම ඇති; කලාවත්, චතුෂෂ්ටිකලා ඇති නොහොත් ශොඩශකලා ඇති; තො උතුම අනත් සිරි ලකල, තෝ උත්තමවූ අනන්තශ්‍රියෙන් අලඞ්කෘතයෙහිය. අවිරූඩාත්මශෙලෂයි.

306. රකුත් නා මෙ දෙරණ—බලනත්හි වක් සැවිනී,
මෙහෙසු සිකිකතු නතුරේ—වම්යන් බැමපුගද වක්.

306. නා මෙදෙරණ රකුත්, නා මේ ධරණිය රක්ෂාකරණ කල්හි; වක්, වක්‍රබවෙක් නම්; බළනත්හි, හටයන්ගේ හස්තයෙහි වූ; සැවිනී, චාපයෙහිමැයි; නොහොත් එසේ නොවේ—සිකිකතුන් අතුරේ, සකි කාන්තාවන් අතරෙහි; මෙහෙයු, අවර්ජිතවූ; වම්යන්, කාන්තාවන් ගේ; බැම පුගද, භ්‍රැයුගමයෙහිද; වක්, ඒ වක්‍රතාව ඇත. මෙහි—රජනු රජකරණ කල්හි වක්‍රභාවය දුන්නෙහිමයයි නියමකොට, ඒ නියමය වළකා ස්ත්‍රීන්ගේ බැමයෙහිද ඇතැයි කී හෙයින් නියමාක්ෂෙප නම්. නියමාක්ෂෙපශෙලෂයි.

ශෙලෂාලඞකාර නිමි.

---

307. දූ කිරිය ගුණ වත්—හේ යම් වැයල් දස්නක්,
වෙසෙස් නිපැත්වීනම්—වෙසෙසැයි වියත් හෙ මෙසේ

307. දූ, ජතිය; කිරිය, ක්‍රියාය; ගුණ, ගුණය; වත්, වස්තුය; හේ, හෙතුය (යන මොවුන් සම්බන්ධවූ); යම් වැයල්දස්නක්, යම් කිසි විකල්පදර්ශනයක්; වෙසෙස් නිපැත්වීනම්, විශෙෂනිෂ්පත්ති ප්‍රකාශ කෙළේ නම්; වෙසෙසැයි වියත්, විශෙෂාලඞකාරයයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි.

308. නොවේ දෙවඟනකුදු—නොද ගඳඹකුලෙහි නිපන්,
ඉතිඳු මෙ කත් පොහොසත්—තව බිඳිනවස් බඹහුදු.

308. දෙවඟනකුදු නොවේ, දිව්‍යාඞ්ගනාවකුදු නොවෙයි; නොද ගඳඹකුලෙහි නිපන්, නොද ගන්ධර්වකුලප්‍රසූතය හෙවත් ගන්ධර්වකන්‍යාවකුත් නොවෙයි; ඉතිඳු, මෙසේද වුවත්; මෙ කත්, මේ කාන්තා තොමෝ; බඹහුදු, බ්‍රහ්මයාගේද; තව බිඳිනවස්, තපොභඞ්ගය කරණ පිණිස; පොහොසත්, සමර්ථයි. මෙහි—දිව්‍යාඞ්ගනා නොද වෙයි; ගන්ධර්වකන්‍යා නොද වෙයි කියා ජතියෙහි විකල්පතාව දක්වාලා, බ්‍රහ්මයාගේ ධ්‍යානභෙදයටද සමර්ථයයි කී හෙයින්, මේ ජතිවිශෙෂ නම්. ජතිවිශෙෂයි.

309. නොබුන් බැම ඩඟවෙංට—නොයල නොරත් නෙත් වී,
නරනිඳු වි න සියල්ලෙන්—විපක්කුල බිම් හැපිලී.

309. නරනිඳු, නරෙන්ද්‍රය; නා බැම, නාගේ බැම; නොබුන් වී,

නිතෘඃ නුවූයේය, මට, ඔබ්ඨය; නොඩනට, දළට නොකරණලදය; යළ, නැවත; නෙත්, නෙත්‍රය; නොරත් වී, රක්ත නොවී; (එතකුදු වුවත්) විපක් කුල, විපක්‍ෂ කුලය හෙවත් ශත්‍රුසමූහය; සියල්ලෙන්, සර්වාකාර යෙන්; බිම් හැපිලී, ව්‍යසනප්‍රාප්තවී. ක්‍රියාවිශෙෂයි.

310. අවි වියොවගනු නොද—තිපුණු පිළි නොද කැකුළු,
ඉතිදුහොත් දූනොනු විසින්—සියල් දියම දනනලද.

310. වියොවිගනු, අනඞ්ගයාගේ; අවි, ආයුධ; නොද තිපුණු, තීක්‍ෂ්ණත් නොවෙයි; පිළි, නැවත; නොද කැකුළු, කඨිශක් නොවෙයි; ඉතිදුහොත්, එතකුදු වුවත්; දූන්, දූන් වනාහි; ඔහු විසින්, ඒ අනඞ්ගයා විසින්; සියල් දියම, සකලලොකයම; දනනලද, ජය ගන්නාලදී. ගුණවිශෙෂයි.

311. නො අස්හුදු නොදරිය-නො ගජරජනු නො සෙබළෝ,
වහස්තිම දෙනෙත්මතු—මිහුලැස්හු මේ දිය සියල්.

311. නො අස්හුදු, අශ්වයෝත් නැත; නො රියද, රථත් නැත; නො ගජරජනු, හස්තිරාජයෝත් නැත; නොද සෙබළෝ, සෙවාභට යෝත් නැත; [ඒ හැම නැතද] මිහුලැස්හු, මෘගාක්‍ෂිහු, මෙ සියල් දිය, මේ සමස්තජගත්; වහස්තිම, දෘෂ්ටින්ම; දෙනෙත්මතු, ජයගත්හුත් මතු. ද්‍රව්‍යවිශෙෂයි.

312. රිය එක් සක් වසම්—අස්හු නො සැරි ගමන්සර,
පළතෙද හිරුස්මෙ සියල්—දිය යත් හේවෙසෙස් නම්.

312. රිය එක්සක්, රථයතෙම එකචක්‍රය; අස්හු, අශ්වයෝ; වසම්, විෂමයෝය; සැරිගමන් නොසර, ආචාර්‍ය්‍යයාගේ ගමන නොදසාරය; [එතකුදු වුවත්] පළතෙද, ව්‍යක්ත තෙජස් ඇති; හිරු, සූර්‍ය්‍යතෙම; සියල් දිය, සමස්ත ජගත්; ඇක්මෙ යත්; ආක්‍රමණය කෙරෙයි කියත් හොත්; හේවෙසෙස් නම්, හෙතුවිශෙෂ නම්. හෙතුවිශෙෂයි.

විශෙෂාලඞ්කාර නිමි.

---

313. කියවිවූ ගුණයෙන් - මහඅත්මන් සුදුසු කොට,
යමක්හු දක්වත්හොත් —සමයෝලකර මේ ගිත්.

313. කියවිවූ ගුණයෙන්, විවක්‍ෂිත ගුණයෙන් හෙවත් කියන්නා කැමති ගුණයෙන්; මහඅත්මන් සුදුසු කොට, මහාත්මයන් හා සදෘශ කොට; යමක්හු දක්වත්හොත්, යම්කිසි එකකු දර්‍ශනය කරත්හොත්; සමයෝලකර, තුල්‍යයොගාලඞ්කාරයි; මේ ගිත් (ඒ) මෙ පරිද්දෙනි.

314. යම කුවෙර වරුණිඳු—හිමිහුදු මහත්ව දියේ,
නො අත් සබද ලෝපල්—වියන වදන් සිරි දෙරෙත්.

314. යම, යමයාය; කුවෙර, වෛශ්‍රවණයාය; වරුණ, වරුණයාය;

ඉඳු, ශශාඞ්කයා; හිමිහුදු, සොමිහුද (යන මොහු); දීයේ, ලෝකයෙහි; මහත්ව, උදාරව; නො අන් සබඳ, අනන්‍යසම්බන්ධ නොවූ හෙවත් පෙස්සන් විසින් නොපැමිණිය හැකිවූ; ලෝපල් වියන, ලෝක පාලයසි කියන; වදන්සිරි, ශබ්ද නමැති ශ්‍රිය; දෙරෙත්, දරන්නාහුසි. **ස්තුතිතුල්‍යයොගයි.**

315. තුනුවගනහ සසග—ගෙනෙ බඳ විදුලිය විලස්,
කෙණෙකුදු නොසිටිනෙ වියත්-ගරහසමයෝ නම් යෙත්.

**315**. ගෙනෙ බඳ, සනකොට බඳනාලද්දාවූ නොහොත් මෙසයෙහි බඳනාලද්දාවූ; තුනුවගනන්, තන්වඞ්ගීන්ගේ; අඟ සසග, අඞ්ග සංසර්ගයද; විදුලියවිලස්, විද්‍යුල්ලතාවිලාසයද; කෙණෙකුදු, ක්‍ෂණයකුත්; නොසිටිනෙ වියත්, නොපවත්නේයයි කියත්හොත්; ගරහසමයෝ නම් යෙත්, නින්දාතුල්‍යයොග නමැයි කියත්. **නින්දාතුල්‍යයොගයි.**

තුල්‍යයොගාලඞ්කාර නිමි.

---

316. තැනෙක්හි එක් යම්—විරුදු පදඅත් සසගක්,
දසුන් වත් විරුදු වස්—විරුදු නම යෙත් හෙ මෙසේ.

**316.** යම් එක් තැනෙක්හි, යම් එක් ස්ථානයෙක්හි; විරුදු පදඅත් සසගක්, විරුඬ පදාර්ථයන්ගේ සංසර්ගයක්; විරුදු වස් දසුන්වත්, විරොධයපිණිස දක්වත්හොත්; විරුදු නම යෙත්, විරුඬාලඞ්කාරයයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි. ජාති; ක්‍රියා; ගුණ; ද්‍රව්‍ය යන මොවුන් කෙරෙහි විරුඬපදාර්ථයන්ගේ සංසර්ගයක් යම් තැනෙක කිවහොත් ඒ විරුඬාලඞ්කාර නම යනු මෙහි භාවයි.

317. වඩී වැජඹි මෙදෙන්—මනකල්ව රජහස් හඬ,
පිරිහේ රැව් සිකිකැලන්—සියල් වණ සොම්නස්වූ.

**317.** රජහස් හඬ, රාජහංසයන්ගේ කූජිතය; මෙදෙන් වැජඹි, මද යෙන් විජෘම්භිතව; මනකල්, මනොඥව; වඩී, (මේ ශරත්කාලයෙහි) වඩන්නේය; සියල් සොම්නස් වණවූ, සකලප්‍රීතියෙන් ව්‍යුක්තවූ; සිකි කැලන්, මයූර සමූහයන්ගේ; රැව්, රාවය; පිරිහේ, පිරිහෙන්නේය. මෙහි—“ වඩී ” “ පිරිහේ ” යන ක්‍රියා දෙක විරුඬ හෙයින් මේ **ක්‍රියාවිරොධයි.**

318. ලඹ දුවන් යුත් තුනු—තුනුමැද රතොට නිල්නෙත්,
ගැඹුරු නැබ උඩුවටු තෙන-තුනු කා නොනැස්මටවත්

**318.** ලඹ දුවන් යුත්, ගුරුවූ ජඝන ඇති හෙවත් පළල්වූ උකුළු ඇති; තුනු තුනුමැද, සිහින්වූ මධ්‍යප්‍රදෙශ හෙවත් ඉඟටි ඇති; රතොට, රක්තොෂ්ඨ ඇති; නිල්නෙත්, නීලවර්ණවූ නෙත්‍ර ඇති; ගැඹුරු නැබ, ගම්භීරවූ නාභි ඇති; උඩුවටු තෙන, ඌර්ධ්වමුඛවූ පයොධර ඇති; තුනු, ශරීරය; කා නොනැස්මට වත්, කාගේ විනාශයට

අසමූර්ඡද. මෙහි—පෑවුලයට තුනු දෙයද, රතට නිලද, නමනයට උෂ්ණිව්මුඛයද යොදා කීහෙයින් ඔවුනොවුන්ට විරොධනුයි, ද්‍රව්‍යපරස්පර විරොධ නම්. **ද්‍රව්‍යපරස්පර විරොධයි.**

319. පියගඳ මඳ සිහිල්—නෙලෙනා නාකුසුම් රොන්,
නුවනත නොලඟ වෙම්නිඳු-කෙනෙකුන් කඳුලු ගන්වා,

**319.** පියගඳ, ප්‍රියවූ ගන්ධ ඇති; සිහිල් මිඳනෙලෙන් අ, සීතලවූ මන්දමාරුතයෙන් ආවාවූ; නාකුසුම් රොන්, නාගකුසුම රේණුතෙම; නුවනත, නෙත්‍රයට; නොලඟ වෙම්නිඳු, සම්පසව නොවෙමින්ද; කෙනෙකුන්, සමහර කෙනෙකුන් හෙවත් පථිකයන්; කඳුලු ගන්වා, වාෂ්පග්‍රහණය කරවන්නේය. මෙහි - නාගකුසුමරේණූන් දකුත්ම විරහින් ඇස කඳුලුගන්නා හෙයින්, රේණුහු ඇස හි කරණ දෙය නොහිම කළ හෙයින්, ක්‍රියාවිරොධ නම්. **ක්‍රියාවිරොධයි.**

විරොධාලඞ්කාර නිමි.

---

**320.** නොපත් වැණුම් නම්—පර ඇසිරු දෙළෙනොබල,
මන ඇතියන් පවස්නා—වදනින් බිඳුම් හෙ මෙසේ.

**320.** නොපත් වැණුම් නම්, අප්‍රාප්තයාගේ වර්ණනාකිරීම [හෙවත් අප්‍රස්තුතාලඞ්කාරය] නම්; පර ඇසිරූ දෙළෙන්, අනුන් ආශ්‍රිත බුර යෙන්; ඔබල, දුර්වලවූ; මන ඇතියන්, සිත් ඇත්තවුන්; පවස්නා වද නින්, කියන බසින්; බිඳුම්, භෙදයෙකි; හෙ මෙසේ, ඒ මෙසේයි.

**321.** නො මෙරමන් ඇසුරු-මුවො වෙනෙහි යෙහෙන් දෙනෙත්
නිතැතිනි ලද සඳලෙන්—සිහිල්දෙලෙන් සියන් හා.

**321.** වෙනෙහි, වනයෙහි; මෙරමන් නොඇසුරූ, අනුන් ආශ්‍රය නොකළාවූ; මුවො, මෘගයෝ; නිතැතිනි ලද, අයත්නයෙන් ලද්දාවූ; සඳලෙන්, ශාඞ්වලයෙන්ද; සිහිල්දෙලෙන්, සීතලොදකයෙන්ද; සියන් හා, බන්ධූන් හා; යෙහෙන් දෙනෙත්, සුවසේ ජීවත්වෙත්. මෙහි—ජරානුවර්ත්තින් දුක්ඛිතවූ එකකු එතැනට ආක්‍රාන්තවූ වනයෙහි මෘගයන් ගේ ජීවතවෘත්තියට සතුතිකළ හෙයින්, **අප්‍රස්තුතසෙනාත්‍ර නම්.**

**322.** උපත්නා සිත්නෙනි—සත්හු සෙත්පත්හු දියේ,
සිතිවිලි සල්හි රෙදෙන්—හිදෙවූන් නොමතනන්නේ.

**322.** සිත්නෙනි උපත්නා, ප්‍රතිසන්ධ්‍යාදි චිත්තයෙන් උපදනාවූ; සත්හු, සත්වයෝ; දියේ, ජගත්හි; සෙත්පත්හු, ශාන්තිප්‍රාප්තයෝය; (කාරණ කිම යත්;) ඔවුන් හිද, ඔවුන්ගේ හෘදයතෙම; සිතිවිලි සල්හි රෙදෙන්, චින්තා නමැති ශල්‍යයෙහි පීඩායෙන්; නොම තනන්නේ, කම්පිත නොවන්නේය. මෙහි—සුඛදුඃඛානුභව යොග්‍යවූ ව්‍යක්ත ශරීර ඇති තමාගේ සිත සන්තාපයෙහින් දුඃඛිතව, අව්‍යක්ත ශරීරවූ

මාතෘකුක්ෂිස්ථ සත්වයන්ට ස්තුතිකළ හෙයින්, මෙයිත් අප්‍රස්තුත ස්තොත්‍ර නම්

අප්‍රස්තුතස්තොත්‍රාලඞ්කාර නිමි.

---

**323.** කියත් නත්ගි අගුණු—හුදු ගුණයම බණත්හොත්,
දෙසක් වැනි ගුණසුලබ—කළ වැදවැණුම් ඉති වේ.

323. අගුණු කියත්නන්හි, අගුණ කියත්නන් මෙන්; හුදු ගුණ යම බණත්හොත්, කෙවල ගුණයම කියත්හොත්; දෙසක් වැනි, දෝෂයක් වැනිවූ; ගුණ සුලබකළ, ගුණ සුලභකළහොත්; වැදවැණුම්, ව්‍යාජවර්ණනාසි; ඉති වේ, (ඒ) මෙසේ වෙයි.

**324.** දිනිද රම් යමක්—තවුස්ව රජ විද තා,
දිනූ දූතේදෙරණම—පිළි ත මදනොකරත් පත්.

324. රම්, රාමතෙම; තවුස්ව, තාපසව; යමක් දිනිද, යම් පෘථිවියක් ජයගත්තේද; තා රජවිද, තා ක්ෂත්‍රිය වීත්; දූන් දිනූ, දූන් ජයගත්තේ; එ දෙරණම, ඒ ධරණියමය; පිළි ත, තා වනාහි; මද නො කරත් පත්, මදනොකරන්නට සුදුසුයි. මෙහි—හුදකලා තපස්විව වල හුන් රාමයන් විසින් ජයගත් මේ පොළොව, රජවූ සේනාවාහන සම්පන්නවූ තොප ජයගන්නේ කවර ආශ්චර්යයක්ද, එපමණකට තොපි මදනොවෙයි කී හෙයින් රාමයන් හා සම වික්‍රම ඇති නියාව හැඟේනුයි, නින්දාව්‍යාජයෙන් ස්තුතිකළ නියායි.

**325.** කලතුරු ත මෙ පොළොා්—සියැහ බුජහ සසඟ ලද,
දූන් අහ්කර කවරසේ—පහළවී හො ත මුලුදියේ.

325. ත කලතුරු, තාගේ කලත්‍රැවූ හෙවත් තා අඹුවූ; මෙ පොළොා්, මේ මහිතොමෝ; සියහ, සතතයෙන්; බුජහ සසඟ ලද, අනන්ත නාග රජයා (ගේ එණසථ හෙයින් ඔහු) හා සංසර්ග ලද තොහොත් බුජි යන් හා සංසර්ග ලද; (එහෙයින්) ත අහිකර, තාගේ අහඞ්කාරය; දූන්, මෙකල්හි; මුලුදියේ, සමස්ත ජගත්හි, කවර සේ, කවර පරිද්දෙකින්, පහළවී හො, ව්‍යක්තවීදෝ. මෙහි—රජහට කලත්‍රැවූ මහිකාන්තාව භුජඞ්ගසංසර්ග කරණ හෙයින් අහඞ්කාරය මස්තකප්‍රාප්ත නොවෙයි කියා නින්දාකරණ ලෙශයෙන්, අනන්තයා විසින් දරණලද චතුස්සාගරාන්ත සකලපෘථිවිය මොහුට අයිති බව හඟවා ස්තුතිකළ නියායි.

ව්‍යාජස්තුත්‍යලඞ්කාර නිමි.

---

**326.** පෙර දක්වා වතක්—එවත් සුදුසු පලක් ඉදි,
දක්වත් එයින් අන් හෝ—නිදසුන් වෙ ගේ මේ ගින්.

326. පෙර, පූර්වාර්ධයෙහි, වතක් දක්වා, එක් වස්තුවක් පෑ; එවත් සුදුසු, ඒ වස්තුව හා සදෘශවූ; ඉදි පලක් හෝ, ඍජු ඵලයක් හෙවත්

සත්ඵලයක් හෝ, එයින් අන් හෝ, එයින් අනැවු (අසත්ඵලයක්) හෝ, දක්වත්, පවුත්හොත්; හේ නිදසුන් වෙ, ඒ නිදර්ශනාලඞ්කාර නම් වෙයි; මේ ගින්, මේ ආකාරයෙනි.

327. නැගෙත් තමා ගිරු—සිරි පතුරා තඹරවෙනෙ,
පොහොසත් හෙ හඟවන්නට—පළවූ සුළානුගුරු.

327. ගිරු, සූර්‍යයාතෙම; නැගෙත්, උදාවත්ම; තඹරවෙනෙ, තාමරසවනයෙහි; තමා සිරි පතුරා, ස්වකීය ශ්‍රිය විස්තාරකරන්නේය; පළවූ, ව්‍යක්තවූ; සුළානුගුරු, සහායානුග්‍රහය; හඟවන්නට, ප්‍රකාශකරන්නට; හෙ පොහොසත්, ඒ සූර්‍යයා සමර්ථයි. මෙහි—උදාවන සූර්‍යයා පද්ම වනයෙහි ශ්‍රී පිහිටුවන්නේය; මිත්‍රයන්ගේ අභිවෘද්ධියනම් තමාගේ මිත්‍රයන්ට අනුග්‍රහකිරීමයයිද ඒ සූර්‍යයාම හඟවන්නේය; එහෙයින් මේ **සත්ඵල නිදර්ශනයි.**

328. අසුරබෙළො සහරෙස්—නසිත් නසුත් රුදුරු,
දියෙහි ඉසුරු විරුදුනට—වනස් වතු දන්වතුවෝ.

328. රුදුරා නසුත්, ඊශ්වරයා නාශ කරත්ම; සහරෙස්, රොෂසහිතවූ; අසුරබෙළො, අසුරභටයෝතුමූ; දියෙහි ඉසුරු, ජගදීශ්වරයන්ට නොහොත් ලොකයෙහි මහෙශ්වරයන්ට; විරුදුනට, විරුද්ධවූ සත්වයන්ට; වනස් වතු, විනාශ වීම; දන්වතුවෝ, හඟවන්නාහු; නසිත්, විනාශ වෙත්. මෙහි – සම්පත්ති ආදීන් ඊශ්වරවූවන් කෙරෙහි විරුද්ධවූවන්ට වන විනාශය හඟවන්නවුන් මෙන්, ඊශ්වරයා සඞ්ඝාතනාශය කරත්ම, අසුරයන් විනාශයට යෙතියි කී හෙයින්, මේ **අසත්ඵල නිදර්ශනයි.**

නිදර්ශනාලඞ්කාර නිමි.

---

329. සමබැව් කියමනින්—සහකියමන් නම් වේ,
ගුණකම් එදෙක පෙරළුම්—පිරිවැති නම් වෙ මේ ගින්.

329. ගුණකම්, ගුණක්‍රියා දෙදෙනාගේ; සමබැව් කියමනින්, එකවටබව කීමෙන්; සහකියමන් නම් වේ, සහොක්ති නම් වෙයි; පෙරළුම්. [ඒ ගුණ ක්‍රියා දෙදෙනාගේ] විපර්‍යාසය; පිරිවැති නම් වෙ, පරිවෘත්ති නම් වෙයි; එ දෙක, ඒ සහොක්ති පරිවෘත්ති දෙක; මේ ගින්, මේ ආකාරයෙනි.

330. දිගුවීමැයි මෙ රෑ - සමඟ තමා නිසස් හා,
වසනා පලඳන තමා—පඬුපැහැ ගත් සමගිනඟ.

330. මෙ රෑ, මේ රාත්‍රිතොමෝ; තමා නිසස් හා සමග, තමාගේ නිඃශ්වාසය හා එක්ව; දිගුවීමැයි, දීර්ඝවිමැයි; වසනා පලඳන, චන්ද්‍රයා ප්‍රසාධනකොට ඇත්තී; තමා අඟ සමගින්, මාගේ ශරීර අවයව හා එක්ව; පඬුපැහැ ගත්, පාණ්ඩුවර්ණ ගතු. රාත්‍රිතොමෝ තමා නිඃශ්වාසය හා සමග දික්ව තමා ශරීර අවයව හා සමග පඬුපැහැ වූයයි කී හෙයින් මේ **සහොක්ත්‍යාලඞ්කාරයි.**

සහොක්ත්‍යාලඞ්කාර නිමි.

331. කල රුස් විමල් සඳ—රුස් රුපු දෙරණිසුරන්;
සියල් යස ගත්හි සෙරෙන්—තා අත්හි කගපහර දී.

331. තා අත්හි, තාගේ අතින්; කගපහර දී, ඛඩ්ගප්‍රහාර දී; රුපු දෙරණිසුරන්, ශත්‍රුරාජයන්; සෙරෙන් රුස්කල, චිරකාලයක් රාශි කරණලද හෙවත් චිරාර්ජිතවූ; සඳරුස් විමල්, චන්ද්‍රරශ්මි සේ නිර්මලවූ; සියල් යස ගත්හි, සකල යසස් පැහැරගත්හි. මෙහි—කඩුපහර දී යසස් ගත් හෙයින් ගණුදෙනුයි, **පරිවෘත්ති අලඞ්කාරයි.**

පරිවෘත්ති අලඞ්කාර නිමි.

---

332. කැමැතිය වත්හි වූ—පැතිවිලි වෙ ආසි නම්;
හෙ මෙසේ තා රකීවා—තෙනෙත් විසියත් නොවිසං.

332. කැමැතිය වත්හි වූ, අභිමත වස්තුයෙක්හි ප්‍රවෘත්තවූ; පැතිවිලි, ප්‍රාර්ථනා; ආසි නම් වෙ, ආශීර්වාද නම් වෙයි; හෙ මෙසේ, ඒ මෙසේයි; විසියත් නොවිසා, වාක්චිත්ත විෂයනුවූ; තෙනෙත්, ත්‍රිනෙත්‍රයා; තා රකීවා, තා රක්‍ෂාකෙරේවා. මෙහි—අභිලාෂිවූ රක්‍ෂණය ආශංසන විනුයි, **ආශීර්වාද නමි.**

ආශීර්වාදාලඞ්කාර නිමි.

---

333. ලකරක් එක් ලකල ලකරිනි නොඑක් උවමැ,
සුදුසු රුවන්දම් මුසු—වියත් විසිතුරු හෙ මෙසේ.

333. උවමැ, උපමාදිවූ; නොඑක් ලකරිනි, අනෙකාලඞ්කාරයෙන්; ලකල, අලඞ්කෘතවූ; එක් ලකරක්, එක් අලඞ්කාරයක්; රුවන්දම් සුදුසු, රත්නදාමයක් සදෘශවූයේ; විසිතුරු, විචිත්‍රතාව ඇත්තේ; මුසු වියත්, සඞ්කීර්ණයයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි.

334. නැහෙත් පියුම් රිවි—සිරිමත් වත්සඳෙව් තා,
පළුතෙදුහුදු පැමිණෙත්—සබඳහු පැලඹෙත් දියේ.

334. රිවි නැහෙත්, සූර්ය්‍යයා උදාවත්; පියුම්, පද්ම; තා වත්සඳෙව්, තාගේ වක්ත්‍රචන්ද්‍රයා මෙන්; සිරිමත්, ශ්‍රීමත් විය (ඒ එසේමැයි); පළු තෙදුන්, ව්‍යක්තවූ තෙජස් ඇත්තවුන්; උදා පැමිණෙත්, උදයප්‍රාප්ත වත්ම; දියේ, ජගත්හි; සබඳහු, මිත්‍රයෝ; පැලඹෙත්, විජෘම්භනය කෙරෙත්. මෙහි—අර්ථාන්තරන්‍යාසවූ පූර්වාර්ධයෙහි කටයුතු අපරාර්ධයෙන් හඟවන හෙයින්ද, වත්සඳෙව් සිරිමත් සී උපමාය; වත්සඳයයි කියා රූපකය; රිවි නැහෙත් පියුම් යන භාවකාරක හේතුය යන මෙතෙක් අලඞ්කාරයෙන් මිශ්‍ර හෙයින්, මේ **සඞ්කීර්ණාලඞ්කාරයි.**

සඞ්කීර්ණාලඞ්කාර නිමි.

335. කිවිඳු කිවින් වදන්—ලකරජ යම් විසාකල,
එ හැඟුම් නම් වේ එයට—නිදසුන් හැම පබඳ වේ.

335. කිවින්, කවීන්ගේ; වදන් පබඳ, වාක්‍යප්‍රබන්‍ධය; විසාකල, විෂයකළාවූ; යම් ලකරක්, යම් අලඞ්කාරයෙක් ඇද්ද; එ හැඟුම්නම්, ඒ භාවික නම් වෙයි; එයට නිදසුන්, ඒ භාවිකාලඞ්කාරයට නිදර්ශන; හැමපබඳ වේ, සකල ප්‍රබන්‍ධයෙහි වන්නේය. සියලු කාව්‍යප්‍රබන්‍ධයෙහි පැතිර සිටි කවිහුගේ භාවයෙන් වූ භාවික නම් අලඞ්කාරයට සියලු රචනාම නිදර්ශනයයි සේයි.

336. නොතොරවුවද හැඟුම්—ලකර ලකරෙහි සියල්,
හඟවත් නම්හි වෙන්කැරැ—උතුනියර ව්‍යතැදුරෝ.

336. හැඟුම් ලකර, භාවිකාලඞ්කාරය; නොතොර වුවද, තොර නොවුවද; සියල් ලකරෙහි,(ස්වාභාවිකාදි) සියලු අලඞ්කාරයෙහි; උතුනියර, උක්තප්‍රකාරයයි; නම්හි වෙන්කැරැ, නාමයෙන් වෙනස්කොට; ව්‍යතැදුරෝ, ව්‍යාක්‍යාචාර්‍ය්‍යයෝ; හඟවත්, ප්‍රකාශ කෙරෙත්.

337. වත්කියම්තුදු හවි—සිරිසර ලකර දෙනියර,
සිරිසර්තුදු පවා හවි—සෙලෙස් ලකරුතුමැයි යෙත්.

337. වත්කියමතුදු, ස්වභාවොක්තියද; හවිසිරිසර, සර්‍වශ්‍රීසාරය හෙවත් වක්‍රොක්තිද යන; ලකර දෙනියර, අලඞ්කාර ද්විප්‍රකාරය; හවි සිරිසර්තුදු පවා, ඒ දෙකිතුදු වඩා [වක්‍රොක්තිය, ස්වභාවොක්තිය යන දෙකට වඩා]; සෙලෙස්ලකර, ශ්ලෙෂාලඞ්කාරය; උතුමැයි යෙත්, උත්තමයයි කියත්.

338. නොතැන්හි වැණුමෙවත්-නොවෙසෙස් කියමන් කිවින්,
නොසබඳ පබඳදු සවන්—පියබස් නොමකරත් පත්.

338. නොතැන්හි වැණුම්, අස්ථානයෙහි වර්‍ණනාද; නොවෙසෙස් කියමන්, අවිශෙෂකථනයද; එවත්, අව්‍යක්ත වචනයද; නොසබඳ පබඳදු, අසම්බන්‍ධවූ ප්‍රබන්‍ධද; සවන් පියබස්, ශ්‍රවණප්‍රිය වචන ඇති; කිවින්, කවීන්; නොමකරත් පත්, නොකරන්නට සුදුසුයි. මෙහි—සම්භොග යෙහි, වසන්ත වර්‍ණනාය; සන්‍ධ්‍යා වර්‍ණනාය; චන්‍ද්‍ර වර්‍ණනාය; මධුපාන වර්‍ණනාය; වන්දිවාක්‍යාදි වර්‍ණනාය; වසන්තයෙහි, උද්‍යානක්‍රීඩා; ජලක්‍රීඩාද; විරහයෙහි, වර්‍ෂාවර්‍ණනාද; යුඩප්‍රාණයෙහි, ශරද්වර්‍ණනාදිවුද පූර්‍ව කවීන් කිලෙස වර්‍ණනා නොකිර්ම අස්ථාන වර්‍ණනා නම් වෙයි. යම් වචනයක් කිකල නායක නායිකා දෙන්නාගේ කිසි ගුණ විශෙෂයක් නොපෙණෙන්නේ විනම් ඒ අවිශෙෂකථන නම් වේ. ඒ අස්ථාන වර්‍ණනා ඇත්තේද අවිශෙෂ කථන ඇත්තේද අව්‍යක්ත වචන නම් වෙයි. පළමුවන (ආදි) සර්‍ගයන්ගෙන් ඔවුනොවුන්ට උපකාරි බවක් නැත් නම් ඒ අසම්බන්‍ධ නම් වෙයි. මේ ව්‍යක්තවූ කවීන් විසින් නොකියයුතුය යනු භාවයි.

භාවිකාලඞ්කාර නිමි.

339. විතරත්නි සුලුකල—ලකරනි පසුතුරු තිස්,
පිළි මුලුකව් සුරනුවර—මග මෙ මැදුම් සග ගියේ.

339. පසුතුරු තිස් ලකරනි, පසක් උතුරුකොට ඇති තිස් අලඞ්කාරයෙන් හෙවත් අලඞ්කාර පන්තිසින්; සුලුකල, සවලඞ්කෘතවූ; අත්ති විතර, අර්ථයෙන් විස්තරවූ; පිළි, නැවත; මුලුකව්, සමස්ත කාව්‍ය නමැති; සුරනුවර, දිව්‍යනගරයට; මග, මාර්‍ගවූ; මෙ මැදුම්සග ගියේ, මේ මධ්‍යම සර්ගය අතික්‍රාන්ත විය.

දෙවන සග නිමි.

---

# තු න් ව න ස ග.

මෙසේ දශ [විධ කාව්‍ය] ප්‍රාණයද අලඞ්කාර පන්තිසද දක්වා, ඉක්බිති යමකබන්ධනස්වරූප දක්වන්නාහු "කරු දුරු තුදුරු" යනාදි කීහු.

340. කරු දුරු තුදුරු හැම—පදන් ඇ මැද අවසනැ,
සමවණ්නි පිළිවත්වත්—යමා නම යෙත් හෙ මෙසේ.

340. දුරු තුදුරු කරු, දූරාවිදූර කොට හෙවත් ව්‍යවහිත අව්‍යවහිත කොට; හැමපදන්, සියලු පාදයන්ගේ; ඇ, ආදියෙහිද; මැද, මධ්‍යයෙහිද; අවසනැ, අවසානයෙහිද; සමවණ්නි, එකසදෘශ අක්‍ෂරයන් විසින්; පිළිවත්වත්, නැවත නැවත වනකල්හි; යමා නම යෙත්, යමක නමැයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි. සූත්‍රයි.

341. වසත වසත කලුන්—උයනතහි ත ලද වරල්,
ගෙනෙ බද විදුලිය පැරුදූ—පලබර සිනිදු මදමත්.

341. සිනිදු, සනිග්ධවූ; ලද, තරුණවූ; වරල්, කෙශකලාප ඇති; වසතමද මත්, වසන්තමදයෙන් මත්වූ; කලුන්, කාන්තාවන්; පලබර, පල්ලවභාර ඇත්තාවූ; ත උයනතහි වසත, තාගේ උද්‍යානාභ්‍යන්තරයෙහි වසන කල්හි; ගෙනෙ බද, මෙඝයෙහි බඩවූ; විදුලිය, විද්‍යුල්ලතාව; පැරුදූ, පරාජිතවී. අදූරවිදූර යමකයි.

මෙසේ ආදිපාදයෙහිද, දෙවන පාදයෙහිද, තුන්වන පාදයෙහිද, අන්තපාදයෙහිදැයි අදූරයමක දතයුතුයි. මේ හැමට ලක්‍ෂණ පවුත් නොත් ග්‍රන්ථවිස්තාරයක්ය වන හෙයින්, ආදිලක්‍ෂණයට "වසත වසත" යනාදි කව දක්වාලා, සෙස්ස නොකියා, අන්තලක්‍ෂණවූ අන්තපාදයෙහි අන්තාදූරයමක කියන්නාහු "සලා සඳුන්සලල" යනාදි කීහු.*

* සංක්‍ෂෙපනය බැලිය යුතුයි.

342. සලා සඳුන් සලල—ලබමිනි තා රුදුපියන්,
මරණට වී පහස් මේ—සුලඟ ලඟ ගඟුල මල.

342. සඳුන් සලල, චන්‍දන සලල වෘක්‍ෂයන්; සලා, චලිතකොට; මලගඟුල පහස්, මලය නිර්ඣරයෙහි ස්පර්ශ; ලබමිනි, ලබමින්; ලඟ, සමීපවූ; මෙ සුලඟ, මේ මාරුතයතෙම; තා රුදු පියන්, තාගේ ශත්‍රුකාන්තාවන්ගේ; මරණට වී, ජීවිතවිනාශයට වූයේය. **අනන්‍ය පාදදූර යමකයි.**

343. නුදුරුයමා මෙසේ—සියල්හි මැද්වසන්හිදු,
යළු සියලැ මැදහිදු—බඳ සදලකරුතුම් වේ.

343. සියල්හි, සකලපාදයෙහිද; මැදවසන්හිදු, මධ්‍යවසානයෙහිද; නුදුරු යමා, අදූර යමක; මෙසේ, මෙපරිද්දෙනි; යළු, නැවත; සියල්, හැමතන්හි හෙවත් හැමපාදයෙහිද; ඇ මැදහිදු, ආදිමධ්‍යයෙහිද; බඳ, රචනාකළ; සදලකර, ශබ්දාලඞ්කාරය; උතුම් වේ, උත්තමවේ. මෙහි—සතර පාදයෙහිම මධ්‍යාන්තයෙහි අදූරයමක පැණෙනම්ද, එසේම සතර පාදයෙහි ආදිමධ්‍යයෙහි අදූරයමක ඇතද උත්තමය යනු භාවයි.

344. පවත්නෙ මෙසේ බැඳුම්—වත්හොත් බැඳුම්නී යමා,
කිවිමග වූවොත් පෙර කී—නියම්නී ධූත් බඳුත්හොත්.

344. බැඳුම්, බන්ධන; යමාබැඳුම්නි වත්හොත්, යමකබන්ධනයෙන් වත්හොත්; මෙසේ පවත්නෙ, මේ ආකාරයෙන් ප්‍රවෘත්ත වන්නේය; කිවි මග වූවොත්, ප්‍රසන්නප්‍රාණාදිවූ කාව්‍යමාර්ගය වුවහොත්; පෙර කී නියම්නි, පූර්වෝක්ත ක්‍රමයෙන්; බඳුත්හොත් යුත්, රචනාකරන්නට යුක්තයි.

345. පියුම් සියුරු පෙදෙන්—එක්පද පමණඩපමණ,
නොබෙජේ යම අඩ බෙජේ—එබැවිනි කව් දෙලොස් මේ

345. පියුම්, පියුම්හි හෙවත් කව්හි; සියුරු පෙදෙන්, සතරපාදයෙන්; එක්පද පමණ, එක්පද ප්‍රමාණයෙක්ද; අඩපමණ, භාගප්‍රමාණයෙක්ද; යම නොබෙජේ, යමක භජනය නොකරන්නේය; අඩ බෙජේ, භාගයක් භජනයකරන්නේය; එබැවිනි, එහෙයින්; මේ කව්, මේ රචනා; දෙලොස්, දොළසෙක් වේ. මෙහි—එක් පාදය යමක නොවන පියුම් සතරෙක; දෙපාදය යමක නොවන සතරෙක; තුන්පාදය යමක නොවන සතරෙකැයි දොළොස් ආකාරය යනු භාවයි.

346. තැනෙක බැඳැ යම එක්—බඳුතු එකෙකැ නොඑක් තැන
නොබැඳැ යමා පියුම්නිදු—එකෙකැ යමා සියපමණ.

346. එක්තැනෙක, (සතර පාදයෙන්) එක්ස්ථානයෙක; යම බැඳැ, යමකබන්ධනය කොට; එකෙකැ, අන්තැනෙක්හි; යමා නොබැඳැ, යමකබන්ධනය නොකොට; නොඑක් තැනදු, බහුස්ථානයක් හැරද; පියුම්නි බඳුතු, කව්බඳුත්හොත්; යමා සියපමණ, යමක ශතප්‍රමාණයි.

347. විසාකල අෑ මැද—වසත් සිඝල් දුරුයමං,
නුදුරු යමා මුස්සෙත්—මේ ගිත් අත් සෙනුදු වේ.

347. අෑ මැදවසත් විසාකල, ආදිමධ්‍යාවසාන විෂයකළාවූ; දුරු යමා, දූරයමකය; සියල් නුදුරු, සර්වප්‍රකාරයෙන් අදුර යමකය යන මෙසින්ද; යමාමුස්සෙන්, දූරාදූර මිශ්‍රවූ යමකයෙක්ද (යන); මේ ගින්, මේ ආකාරයෙන්ද (මෙසි); අත් සෙනුදු වේ, මෙසී දෙසින් අන්‍ය ප්‍රකාරයෙනුදු වේ.

348. නටත් නටත් රත්—ගිරිමුදුනෙ සිදුවම්යෝ,
මහරජ වැද ත රුපුබල—නුවන්පල ලදගු නමං.

348. මහරජ, මහාරාජය; ත රුපු බල, තාගේ ශත්‍රුභටයන්; නටත්, නටනකල්හි; රන්ගිරිමුදුනෙ, සුවර්ණපර්වත මස්තකයෙහි; වැද, ප්‍රවිෂ්ටව; සිදුවම්යෝ නටත්, සිද්ධාඞ්ගනාවෝ නෘත්‍ය කෙරෙත්; තමා නුවන්පල ලදගු, තමාගේ නෙත්‍රඵල ලදහ. මේ ආදි ඒක්තැනෙක බැඳි යමකයි.

349 වියත් වියත් කරු වී—පළ තෙද තා පවත්වත්,
සහස් සහස් පණ දරණ—නැස්මෙ නත අක්සුනු කරු

349. තා, තාගේ; පළතෙද පවත්වත්, ප්‍රකටවූ තෙජස පවත්වන කල්හි; වියත්, පක්ෂිවාහනතෙම හෙවත් විෂ්ණුතෙම, නත, අනන්තයාගේ; පණසහස්, ඵණසහස්‍රය; වියත් කරු, විතානකොට; දරණ, භොගය; අක්සුනු කරු, තිරස්කරණීය හෙවත් කඩතුරා කොට; නැස්මෙ, සැතපිමෙහි; සහස් වී, සාහසිකවී. මෙහි—"වියත් වියත්" කියාද, "සහස් සහස්" කියාද අදූරයමකයි.

350. කලතුරු කළ තුරුගි—නසුත් නසුත් පැසසි තම,
කිඳුරන් රන්ගිරිරහෙහි—අරණැසුරු තා රුපුරජ.

350. රජ, නරෙන්ද්‍රය; අරණැසුරු, අරණ්‍යාශ්‍රිතවූ; තා රුපු, තාගේ ශත්‍රුපක්ෂිකතෙම; රන්ගිරිරහෙහි, සුවර්ණපර්වත රඞ්ගයෙහි; කිඳුරන් කල තුරු, කින්නරයන්ගේ කලත්‍රැ හෙවත් කින්නරීන්; කළ තුරුහි, කළාවූ තූර්‍ය්‍යවාද්‍යයෙහි; නසුත්, නෘත්‍යකරණ කල්හි; තමා නසුත් පැසසී, තමා නැටවීමට ප්‍රසංශාකලේ හෙවත් තෙමේ නෘත්‍ය කරන්නට කැමැතිවී. මෙහි—"කලතුරු කළතුරු" කියාද, "නසුත් නසුත්" කියාද, "රන් රන්" කියාද අදූරයමකයි.

351. තුණෙකින් දෙකින් මෙසේ—යුත් එක්නිඳු හුදුපෙදෙන්,
වත්හොත් සිව්පස්වණින්—මහායමා පමණ වේ.

351. මෙසේ, මේ ආකාරයෙන්; තුණෙකින්, තුන්පාදයෙකින්ද; දෙකින්, දෙපාදයෙකින්ද; එක්නිඳු, එක්පාදයෙකින්ද; හුදින්, කෙවලයෙන්ද හෙවත් සතරපාදයෙන්ද; යුත්, යුක්තවූ; සිව්පස්වණින් වත්හොත්, සතරපස් අක්ෂරයෙකින් වත්හොත්; මහායමා පමණ වේ; මහායමක ප්‍රමාණ වේ.

352. සිඳුරුපද පිදුම්—කරු එහි යම්දෙපදෙක්,
කරත් යමා එක්වණින්—ගේ වටම්හයමා වේ.

352. සියුරුපද පියුම් කරු, චතුෂ්පාදකවූ පියුම් කොට; එහි යම් දෙපදෙක්, එහි යම් පාදවයෙක්; එක්වණින්, එකාක්ෂරයෙන්ම; යමා කරත්, යමක කරත්හොත්; ගේ වටමහයමා වේ, ඒ පරිවෘත්ති මහා යමක නම් වේ.

353. මිණි ලකළ සල් දොර—මිණි ලකළ සල් දොර වී,
සරණ රුපුරජුනතපුර—තුරඟ සුවහස් ගදඹිස්.

353. මිණි ලකළ, මාණික්‍යයෙන් අලඞ්කෘතවූ; සල්දොර, අපන වාර ඇති; තුරඟ සුවහස් තුරඞ්ග හෙත් අශ්වසහස්‍රයන් හා; ගදඹිස්, ගාන්ධර්ව හස්තීන්; සරණ, සචාරණයකරන්නාවූ, රුපුරජුන් අතපුර, ශත්‍රුරාජයන්ගේ අන්තඃපුරයෙහි හෙවත් ශත්‍රුපුරාභ්‍යන්තරයෙහි; මිණිලකළ සල් දොර වී, මිණිලගස් හා සල්ගස් හා දොරගස් ඇතිවී. **ප්‍රථම ද්විතියපාද යමකයි.**

354. පළ නල වරණ සියෙන්—න මෙ නුවරද රුපුන් පුර,
පළ නල වරණ සියෙන්—ගැවසුනු ඒ සියල්ලෙන්.

354. න නුවරද, නාගේ නගරයද; රුපුන් පුර, ශත්‍රුපුරයද; සියල් ලෙන් ගැවසුනු, සමස්තයෙන් ආකීර්ණවිය; මෙ, මේ නගරය; පළ නල වරණ සියෙන්, ම්‍යක්තාවූ පවනට බඳු වාරණශතයා විසින් ආකීර්ණ විය, ඒ; ඒ ශත්‍රුනගරය; පල නල වරණ සියෙන්, පලගස් හා නුනගස් හා වරණගස් ශතයෙන් ආකීර්ණ විය. **ප්‍රථම තෘතියපාද යමකයි.**

355. පුවුටු එදා විල්—සැලලී නිල් වලාගැප්,
පබවත් පබවත්වත්—සඳවත් සඳවත් සොද.

355. එදා, එදිනයෙහි හෙවත් කුසරාජයාගේ ජලක්‍රීඩායෙහි; විල් පුවුටු, සරඃප්‍රවිෂ්ටවූ; සැලලී, තරුණවූ; සඳවත්, චන්ද්‍රමුඛිවූ; පබවත්, ප්‍රභාවතී තොමෝ; පබවත්, ප්‍රභාවත්වූ; සඳ, චන්ද්‍රයා; නිල්වලාගැප් පුවුටුවත්, නීලාභ්‍රගර්භයට ප්‍රවිෂ්ටවූවත්; සොඳ සඳවත්වත්, මනාවූ චන්ද්‍රයාට අනුවූ. **තෘතිය චතුර්ථපාද යමකයි.**

356 පිඳුම් සිඳුරුපෙදෙන්—අවසන්හි දෙමැද මෙසේ,
එහිදු නොබඳන බඳ—පදඅන්හි නොබඳුන් පත්.

356. පියුම්, පියුම්හි; සියුරු පෙදෙන්, සතරපාදයෙන්; මැද, මධ්‍යයෙහිද; දෙමැද, ද්විතීය තෘතිය පාදයෙහිද; අවසන්හි, කෙළවරෙහිද හෙවත් අන්ත්‍යපාදයෙහිද; මෙසේ නොබඳන, මෙසේ මහායමකයන් රචනා නොකරන්නේ; බඳ එහිදු, රචනාකරණලද්දාවූ ඒ සතර භෙදයෙහිද; පදඅන්හි නොබඳුන් පත්, පාදාන්තයෙහි බන්ධනය නොබඳුන් සුදුසුයි. පාදාන්තයෙහි එකිඑකී අකුරු නොබැන්දද දෝෂනැතැයි සේයි

357. පිදුම්හි නන් පදන්—පදවසනකර සමවත්,
නන්වද නුත් නොවෙනස්-මහායම යෙත් හෙ මෙසේ.

357. පිදුම්හි, පද්මබන්ධනයෙහි; නන් පදන්, නානා පදයන්; පද වසනකර, පදාවසාන අක්ෂරයන්; නුත්, ශුන්‍යවද; නොවෙනස්, නානා ප්‍රකාර නොවද හෙවත් වෙනස් නොවද; නන්වද, නානාප්‍රකාරවද; සමවත්, (සෙසු මුලුල්ල) සමවත්හොත්; මහායම යෙත්, (ඒ) මහා යමකයයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි.

358. නොතමා තමා මන—මන නො තමා තමා වූ,
නොතමා තමා වී—මන නොතමා තමා සේ.

358. ත මා මන, තාගේ හා මාගේ හා චිත්තය; නො ත මා, තාගේ හා මාගේ හා නොවෙයි හෙවත් ස්වාධීනනොවෙයි; තමා මන නො තමාවූ, ස්වකීය චිත්තපරාධීන නොව; තමා, ආත්මයාගේ; මන නො, මානයෙක් නැත; තමා සේ, තමා වැනිවූ; ත, තාගේද; මා, මාගේද; ත මා වී, තාය මායයි යන; මන නො, චිත්තයෙක් නැති හෙවත් තාය මායයි යන චෙතනක් නැති.

359. මෙකල් වනනට කල්—මෙකල් වණනට කල් සේ,
මෙකල් වණනට කල්—මෙකල් වණනට කල් වේ.

359 මෙ කල්, මෙසකාලය තෙම; වනනට කල්, වනයන්ට කාන්තය; වණ නට, නෂ්ට විරහතෙම හෙවත් ප්‍රියසම්භොග ලත් පුරුෂතෙම; මෙකල්, මෙසකාලයට; කල්,කාන්තය හෙවත් කැමතිය; මෙ කල්, මේ කාලය; වණනට, විරහින්ට; කල් සේ, කාලය සේය හෙවත් යමයා වැනිය; මෙ කල්, මේ යථොක්ත ගුණඇත්තාවූ කාලය; වණනට කල් වේ, කවීන්ගේ වර්ණනාවට කල් වේ හෙවත් වර්ණනා කිරීමට සුදුසු ප්‍රස්ථායයි. මේ දෙක මහායමකයි.

360. වණෙක්හි යම් පද—අවසන් කරු එම වණින්,
ලඟ පෙදෙහිදු කළ පටන්-සඳටයම යෙත් හෙ මෙසේ.

360. යම් වණෙක්හි, යම් වර්ණයෙකින්; පදවසන් කරු, පාදාවසානය කොට; එම වණින්, එම වර්ණයෙන්ම; ලඟ පෙදෙහිදු, සමීප පාදයෙහිද; පටන් කළ, ආදිය කළහොත්; සඳටයම යෙත්, සන්දෂ්ට යමකයයි කියත්; හෙ මෙසේ, ඒ මෙසේයි. පාදාන්තයෙහි අකුරු එකක් දෙකකින් අවසානය කොට එම වර්ණම ඉක්බිති පාදයෙහි ආදි යට ගතහොත් සන්දෂ්ට යමක නම්.

361. හඹා එක් දෙවණින්—වඩ බඳුතුදු කව්හි යළ,
වණෙක්හිදු එක් කෙවල—පළටකළ අත් හෙ මෙසේ.

361. කව්හි, කාව්‍යයෙහි; එක් දෙවණින් කෙවල, එක් දෙඅක්ෂර යෙකින්; වඩ බඳුතුදු, අර්ථයක් බඳුත්හොත්ද; හඹා, පමණය; යළ,

නැවාතු; එක් වණෙක්නිදු, එකාක්‍ෂරයෙකුදු (කව වන්නේය); පලට කළ අත්, ප්‍රකටීකෘතවූ අඞී ඇති; හෙ, ඒ බන්ධනය; මෙසේ, මෙ පරිද්දෙනි.

362. මගරු විමල් ගුවන්—ගුවන් දිවිම් සුරනවුන්,
නවුන්ව තා දියරුවන්—රුවන් විමන් දහම් ගත්.

362. දිය ගුවන්, ජගද්ගුරුයන්ගේ; ගුවන් විමල්, ආකාශය සේ නිර්මලවූ; මගරු, මහාඝ්වූ; වන්, වණී ඇති හෙවත් අක්‍ෂරයන් ඇති; දහම්, ධර්‍මයන්; ගත්, ශ්‍රැතිපථයෙන් ගත්තාවූ; තා වනවුන්, තා හා සදෘශවූ; සුරනවුන්, සුරනායකයන්ගේ; රුවන් විමන් දිවිම්, රත්න විමානයන් නිරීක්‍ෂණය කෙළෙම්. මේ සෑඩිමත් රහත්කෙනෙකුන් වහන්සේ තමන්දූගේ කුළුපගවූ රජ්ජුරුකෙනෙකුන්ට කී බසි. සන්ධ්‍යෂටයමකයි.

363. තනනා තනන් තුනු—තුනු නිත්තෙන් තෙනා නි,
සිරිසරු සිරිසර රුසිරු—සිසිරුස් සේ සරසිරි.

363. තුනු තුනු, කෘශවූ ශරීර ඇති; නි, තිගේ; තනනා, තිනී යෙන්නාවූ; තනන්, පයෝධරයන්; සරසිසිරුස් සේ, ශරච්චන්‍ද්‍රරශ්මි සෙව්‍යවූ හෙවත් මුකුලිතවූ; අසිරිසරු, ආශ්චය්‍ර්‍යස්වරූපවූ; රුසිරු, රුචිරවූ; සරසිරි, පද්මශ්‍රීය; නිත්තෙන්, නිරන්තරයෙන්; තෙනා, මොලොගන්ති හෙවත් සොරා ගණිත්. චතුරක්‍ෂරයි.

364. නවවූ නත් වෙනෙන්—නොවන්වැ නේ නි වන්,
වනනින් වැව් වානෙන්—නිව්නී වෙනෙන් වැවෙනුවා.

364. නවවූ නත් වෙනෙන්, අභිනවවූ නානාවනයෙන්; නො වන්වැ, නිර්විශෙෂයෙන්; නේ නී වන්, අනෙක නදීන් ප්‍රවිෂ්ටවූ; වන, ජලයතෙම; වැව්, වාපියෙහි; වානෙන් නින්, වානෙන් නික්මිණ; නිව්නි, ගොවිනි හෙවත් කෘෂිකාරයෙනි; වෙනෙන් වැවෙනුවා, ජලයෙන් වැවෙත්වා හෙවත් සැනහෙත්වා. ව්‍යක්‍ෂරයි.

365. නා නි නු නේ නි—නි නා නුනා නිනො,
නොනූ නා නේ නා—නී නී නු නාන් නාන් නි.

365. නී, නදියට; නු, අනුවූ; නේ, පමණ නැති; නි, ජලය තෙම; නු, අනුගතවූ; නී, බක්මි ගස්ද; නා, නා ගස්ද; නා, හස්තිද; නා, නාගයන්ද; නි, ගෙණයන්නේය; නොනුනා, අනූනවූ හෙවත් පැතිරයන්නාවූ; නේ නා, පමණ නැති නාද ඇති හෙවත් මහාඝොෂා ඇති; නී නී, ගඞ්ගා ජලයතෙම; නු, අනුගතවූ; අන්නන්, නානාප්‍රකාරවූ අන්‍යයන් හෙවත් දියට ලඟවූ ස්‍ෙසු අපාද ද්විපාද චතුෂ්පාද බහු පාදාදීන් හා වෘක්‍ෂයන්; නිනො, නැඟියේ වේනුයි. මෙහි—ගඟලඟ සිටි බක්මිගස් හා නාගස්ද, ඇතුන් වැනි සිවුපාවුන්ද, නයින් වැනි අපාදයන්ද ගෙණ කළුගඟ පුරා පැතිරයන මහාඝොෂා ඇති ජල ප්‍රවාහය, ගඟ දෙපාර්ශ්වයෙහි සිටි වෘක්‍ෂයන් හා ක්‍ෂුද්‍ර සතුන් ගෙණ

සත්තේයයි වෂිා කාලයෙහි එකකු කී බසි. අන්තත් සන්තෙහි අකාරය නොහු සත්තෙහි අන්ත අකාරයෙන් හැරහෙයින් ලොප්වි. **එකාක්ෂර යමකයි.**

366. පෙර දෙපෙදෙන් පෙරුම්—පද එක්හි එක් දක්වා,
කළත් තිසරින් වඩයම—යමාතිසර පැයිම් මෙසේ.

366. පෙර දෙපෙදෙන්, පූර්වපදවයෙන්ද; පෙරුම්පද, අපර පද (ව)යෙන්ද; යමාතියර, යමකප්‍රකාර; එත්හි එක් දක්වා, එකින් එක දක්වා, අන් තියරින් කළ, අන්‍යප්‍රකාරයෙන් කරණලද (යමකද); වඩයම, අර්ධයමකද (යන යමකයන්); මෙසේ පැයිම්, මේ ආකාරයෙන් දක්විමි.

367. පිළිලොම් හත්බදුරු—මිහිගුබහතුදු ගෝමුත්,
නැතද බැදෙන පියුම්නෙන්—පියුම් සක්රක් පැයෙම්.

367. පිළිලොම්, ප්‍රතිලොම යමකද; මිහිගුබහතුදු, මුරජබන්ධන යමකද; ගෝමුත්, ගොමූත්‍රිකාද; හත්බදුරු, සර්වතොභද්‍රද; පියුම්, පද්මබන්ධනද; සක්, චක්‍රබන්ධනද (යන මෙකී දුෂ්කර යමකයන්); නැතද, අවිද්‍යමානවුවද; පියුම්නෙන් බැඳෙන, පද්මයෙන් බැඳෙන්නාවූ; අරක් පැයෙම්, ලක්ෂණ දක්වීම්:

368. නව බිය මග මගන—පරවැඩ තමත්වැඩ කළ,
තමන් නිවූ තුසිත් යුත්—කිවිනට මෙ බැඳුම් යෙදේ.

368. නවබිය, නෂ්ටවූ භීති ඇති හෙවත් නිර්භයවූ; මග මගන, මාර්ග පරීක්ෂාකරන්නාවූ; පරවැඩ තමත්වැඩ කළ, පරාභිවෘද්ධියම ස්වාභිවෘද්ධි කළාවූ; තමන් නිවූ, පාපයන් නැසූ; තුසිත් යුත්, විනීතවූ සිත් ඇති; කිවිනට, ප්‍රාඥයන්ට; මෙ බැඳුම් යෙදේ, මේ බන්ධනය යුක්තයි.

369. පැණුනු බැවින් මෙසේ—කිවිගුණ සමග මේ මග,
සියල් වසම් බැඳුම්හිදු—කිවින් පියල්වනු යෙදේ.

369. කිවිගුණ සමග, කවිගුණයෙන් සමග්‍රවූ; මේ මග, මේ මාර්ගය; මෙසේ පැණුනු බැවින්, මෙසේ දර්ශිතවූ බැවින්; සියල් වසම් බැඳුම් හිදු, සකල විෂම බන්ධනයෙහිද; කිවින්, කවින්; පියල්වනු යෙදේ, ප්‍රබලවනු යතපති.

370. නොසබඳ සිඳුම් හුන්—විරුදත් එකත් බුන්සඳ,
නොපුසද නොපිළිවෙළ හා—සැකී දෙසවිරුදුද ඈ.

370. නොසබඳ, අසම්බන්ධද; විරුදත්, විරුද්ධාර්ථද; එකත්, එකාර්ථද; සැකී, ශඞ්කාද; නොපිළිවෙළ හා, අපක්‍රමයද; නොපුසද, අපශබ්දද; සිඳුම් හුන්, පදච්ඡේද ශූන්‍යද හෙවත් යතිභ්‍රෂ්ටද; බුන්සඳ, භින්නඡන්දස්ද; දෙසවිරුදු ඈද, දෙශවිරොධාදියද (හෙවත් දෙශ කාල කලා ලොක න්‍යායාගම විරොධද).

371. කිවින් මේ නවදෙස්—කිවිකමැ පියන්නට යුත්,
නොසබඳ මෙගි මතුමත්—බල්නට මුතනුනාට දෙස්.

871. මේ නවදෙස්, මේ යථොක්තවූ නව දෙෂ; කිවින්, ප්‍රාඥයන් විසින්; කිවිකමැ, කවිකර්මයෙහි; පියන්නට යුත්, හරණට යුක්තයි; මෙහි, මේ නවවිධවූ දෙෂයෙහි; නොසබඳ, අසම්බන්ධය; මත් උමත් බල්නට මුත්, මත්තොන්මත්ත බාලයන්ට මුත්; අනුනට, අන්‍ය ජන යාට; දෙස්, දෙෂයි.

372. මෙ මුහුදු බො මේ තවුස්-මම දුන් දෙරෙන් දිරුණෙම්,
වැජඹෙ මේ මේගැජුම්—දෙවිඳුට වී එරවණ කල්.

872. මෙ මුහුදු මෙ තවුස් බො, මේ සමුද්‍රය මේ තාපසයා අනුභව කෙරෙයි; මම දුන් දෙරෙන් දිරුණෙම්, මම දුන් ජරාවෙන් ජීර්ණ වීමි; මේ මේ ගැජුම් වැජඹෙ, මේ මෙඝගර්ජනය විජෘම්භිතවෙයි; දෙවි ඳුට එරවණ කල්වී, ශක්‍රයාට ඓරාවණයා ප්‍රියවී. මෙහි—වෙන වෙන අර්ථ ඇති බව මුත් මුලුල්ල එක්කළ කල ගැනෙන සම්බන්ධයක් නැති හෙයින්, අසම්බන්ධයි.

373. පෙර පස්හි නොසුදුසු—විරුදත් තො සතුරන් හැර,
කුළුණුතම සව්සත්නට—තට රුපු කවර යනු සේ.

873. පෙර, පූර්වයෙහිද; පස්හි, පශ්චිමයෙහිද; නොසුදුසු, අසදෘශ වූයේ හෙවත් පූර්වාපර විරුඩ වූයේ; විරුදත්, විරුඩාර්ථ නම් වෙයි, තො සතුරන් හැර, තෝ ශත්‍රූන් දුරුකර; සව්සත්නට, සකලසත්ත්‍ව යන්ට; කුළුණුතම, කරුණාතමකය; තට රුපු කවර යනු සේ, තට ශත්‍රුනු කව්රුදැයි යනු මෙනි. මෙහි—තෝ සතුරන් දුරුකරැයි කී පූර්ව වචනය සර්වසත්වානුකම්පකය තට ශත්‍රූනු කවරහුදැයි කී අපර වච නයට විරුඩයි. මෙසේ පූර්වාපරාර්ථ විරුඩ වූයේ, විරුඩාර්ථයි.

374. සදත්හි පෙර යු එක්—යළ කියතේ එකත් නම්,
හෙ මෙසේ මේ විදුවත්—උකටලි කල කුසිකෙරේ.

874. සදත්හි එක්, ශබ්දාර්ථයෙන් එක්වූ; පෙරයු, පූර්වෝක්තයක්; යළ කියත්, පුනපුනා කථනයකරත් නම්; ඒ එකත්නම්, ඒ එකාර්ථ නම හෙවත් පුනරුක්ත නම; හෙ මෙසේ, ඒ මෙසේයි; විදුවත්, විදුලිය ඇත්තේ; මේ, මෙඝය; උකටලි කල, උත්කණ්ඨිතවූ කාන්තාව; කුසි කෙරේ, උත්කණ්ඨා කෙරේ. මෙහි—විදුවත්, මේ, යනුද; උක ටලි, කුසි, යනුද එකාර්ථයි. ආවෘත්ත්‍යලඞ්කාරයෙහි කී ලෙස මුත් මෙලෙස කළහොත් පුනරුක්ත නම්. පුනරුක්තයි.

375. කියුම්හිදු පිළි දෙස්—නැත කුළුණු අතිසයෙන්,
මලවිය කල් වනසා—පියතෙපල කල් වනසා.

875. කුළුණු අතිසයෙන්, කරුණාදිවූ ගුණයන්ගේ අධිකත්‍වයෙන්, පිළි කියුම්හිදු දෙස්නැත, පුනරුක්තයෙහිදු දෙෂ නැත, [ඒ මෙසේයි] මලවිය, පුෂ්පායුධතෙම; කල් වනසා, කාන්තදෙහිනිය නසන්නේය,

පියතෙපල කල් වනහා, ප්‍රියවූ වචන ඇති කාන්තාව හසන්නේය. මේ ශොකාධිකත්වයෙන් නැවත නැවත කී වචනයි; මෙසේම—ක්‍රොධ, සන්තොෂ, විස්මය, ප්‍රසාද, ප්‍රශංසා, භය, කුතුහලත්වාදියෙහි ඒ ක්‍රොධාදීන්ගේ අධිකබව හඟවන පිණිස කියන ආම්‍රෙඩිත වචනයෙහි දොෂ නැත, එකාර්ථවූ පුනරුක්ත වචනයම එකාර්ථ දොෂ නම් වේ.

376. නිරණට යූ වදන්—කුහුලට වැටෙත් සැකි නම්,
නියවත් දෙනෙ සෙරෙන් පත්—ගුණහුන්නන්ට වසදේ

376. නිරණට යූ වදන්, නිර්ණයට කිවාවූ වචන හෙවත් -පාඨා ශඞ්කාවන පිණිස කියනලද වචන; කුහුලට වැටෙත්, එසේද්‍යෝ මෙසේද්‍යෝ යන කුතුහලයට වැටෙත්හොත්; සැකිනම්, ශඞ්කා නම් වේ. (ඒ මෙසේයි) නියවත් දෙනෙ, ඥාණවන්ත ජනයා; සෙරෙන් පත්, චිරකාලයකින් ප්‍රාප්තවූ; ගුණහුන්නන්ට, ගුණවන්තයන්ට; වස දේ, (ආතිථෙය්‍ය පිණිස) පැන් දෙන්නාහුයි; (මේ අභිමතාර්ථයි,) නියවත් දෙනෙ, ඥාණවන්ත ජනයා; සෙරෙන් පත්, චිරකාලයකින් පැමිණියාවූ; ගුණහුන්නන්ට, ගුණයුක්තයන්ට; වස දේ, විෂ දෙන්නේය. මෙසේ වූ අනභිමතාර්ථයක්ද පැමිණේ එසේද්‍යෝ මෙසේද්‍යෝයි [නොහොත් පූර්වාර්ථය ද්‍යෝහෝ විතියාර්ථය ද්‍යෝහෝයි කියා] සංශය උපදනා වචනය සංශය නම් වේ. **සංශයයි.**

377. පෙර යූ වන යළ කියූ—නොයෙදෙන නොපිළිවෙළ නම්,
මැවුම් පැවතුම් හැකුලුම්—හර බඹ ගොවිඳුහු කෙරෙත්.

377. පෙර යූ වන, පූර්වොක්ත වස්තුයෙහි; යළ කියූ, පශ්චාත් කථිතය; නොයෙදෙන, අයුක්ත වූවහොත් (උද්දෙශයට අනුද්දෙශය අසම්බන්ධ වූවහොත්); නොපිළිවෙළ නම්, අපක්‍රම නම; (ඒ මෙසේයි) මැවුම් පැවතුම් හැකුලුම්, නිර්මාණය, ස්ථිතිය, සංහාරය යන තුණ; හර බඹ ගොවිඳුහු කෙරෙත්, ඊශ්වර, බ්‍රහ්ම, විෂ්ණුහු කරන්නාහුයි. ලොකයාගේ නිර්මාණය බ්‍රහ්ම කෙරෙයි; රක්ෂණය විෂ්ණු කෙරෙයි; ප්‍රලය ඊශ්වර කෙරෙයි යනු සිද්ධාන්ත ප්‍රසිද්ධයි. එයින් නිර්මාණස්ථිති සංහාර ආදී උද්දෙශකොට පසුව දෙවතාවන් අනුද්දෙශකරණ කල නුසුදුසුකොට පිළිවෙළ වරදවා කීහ. මෙසේ "යථාසාඛ්‍යමනුද්දෙශස්සමානානාම්" යනාදි ආප්තවචනයට විරුද්ධවූ බන්ධනය ක්‍රමාලඞ්කාරයෙන් පිටත් හෙයින්, **අපක්‍රමයි.**

378. නොමගා ලක් ලකුණු—පියසු වදන් නොසුසද,
දලතිඳු මේවුල් මෙ දෙරණ—නරනිඳුහට බුජෙහි රකී.

378. ලක් ලකුණු නොමගා, ලක්ෂ්‍ය ලක්ෂණ පරීක්ෂා නොකොට; පියසු වදන්, කියනලද වචනය; නොසුසද, අපශබ්ද නම; (ඒ මෙසේයි) දලතිඳු මෙවුල්, සාගරය මෙඛලාදාම කොට ඇති; මෙ දෙරණ, මේ ධරණීය; නරනිඳුහට, නරෙන්ද්‍රයාගේ; බුජෙහි රකී, හස්තයෙහි රක්ෂාකරන්නේය. මෙහි—නරෙන්ද්‍රයාගේ හස්තයතෙම රක්ෂා

කරන්නේයයි කිවමනා තන්හි, නරතිඳුගේ යන ෂෂ්ඨිවචනයට "නර තිඳුහට" යයි චතුර්ථි කළහ. බුජයයි කියා ප්‍රථමා වුවමනා තන්හි "බුජෙහි" යයි කියා සප්තමි කළහ; මෙසේ ඒ ඒ අර්ථය නොහඟවන්නාවූ ව්‍යාකරණ විරොධිවූද, පූර්වකවීන්ගේ ප්‍රයොගයට අනුසාර නොවූද, එහෙයින්ම ලක්ෂ්‍ය ලක්ෂණයට විරුඬවූ වචනයද, ස්වභාෂායෙහි නොපෙණෙන මාගධ සංස්කෘතාදි අන්‍යභාෂාවන්හි වූ වචනද කිවහොත් අපශබ්ද නම් වේ, අපශබ්දයි.

379. සියබසැ කියූ පියුම්—ලකුණු කී පද නොබිඳුතු,
ගුන්පදසිඳුම් දෙස් වේ—බුන්සඳ අඩුවැඩි වෙණෙන්.

379. පියුම් ලකුණු කී, පද්මාදි බන්‍ධනයන්ගේ ලක්ෂණ දක්වූ; සියබසැ, සිංහල ඡන්‍දස් ශාස්ත්‍රයෙහි; කියූ පද නොබිඳුතු, උක්තස්ථානයෙහි පදභිනන නොකරත්හොත් හෙවත් කරන්නට කී ස්ථානයෙහි යතිය නොකරත්හොත්; ගුන්පදසිඳුම් දෙස්, පදච්ඡෙදගුත්‍ය නම් දොෂය වන්නේය හෙවත් යතිභ්‍රෂ්ට නම් වන්නේය; අඩුවැඩිවෙණෙන්, ඌනාධිකාක්ෂරයන් කරණකොටගෙණ; බුන්සඳ, භින්නඡන්‍දස් නම් දොෂය වන්නේය. මෙහි—පදච්ඡෙද දක්වන්නට සියබසැ කී ස්ථානයෙහි පදසම්භෙද නොපැ ශබ්දයෙන් එක්කොට කියත් යතිභ්‍රෂ්ට නම් දොෂ වෙයි; ඒ ඒ ඡන්‍දසට නියමකළ මාත්‍රාගණනට අකුරු අඩුවැඩිව ශ්‍රවණීය නොවේනම් භින්නවෘත්ත නම් දොෂයි. යතිභ්‍රෂ්ට භින්නවෘත්ත දෙකයි.

380. දෙස් කල් කලාවට—ලෝ හේ විදු මහගතට,
වන වරද කිවි පමදින්—පිළි නිවරදද කියනෙම්.

380. දෙස්, දෙශයටද; කල්, කාලයටද; කලාවට, කලාවටද; ලෝ, ලොකයටද; හේ විදු, හෙතුවිද්‍යාවටද; මහගතට, මහාශාස්ත්‍රයටද; කිවි පමදින් වන, කවීන්ගේ ප්‍රමාදයෙන් වන්නාවූ; වරද, විරොධයද; පිළි, නැවත (ඉන් ඉක්බිති); නිවරදද, (කවීන්ගේ කෞශල්‍යයෙන් වන්නාවූ) අවිරොධයද; කියනෙම්, (ක්‍රමයෙන්) කියමි. මෙහි—දෙශ නම්, රට-පව්-වල්-ආදියයි; කාල නම්, දිවා රාත්‍රි දෙක හා වසන්ත ග්‍රීෂ්ම වර්ෂා ශරත් හිම සිසිර යන සෘතු සයයි; කලා නම්, අර්ථකාමාශ්‍රයවූ නෘත්‍යගීතාදි චතුෂ්ෂෂ්ටි කලායි; ලොක නම්, ජඞ්ගමස්ථාවර සත්වයන්ගේ ප්‍රවෘත්තියි; හෙතුවිද්‍යා නම්, න්‍යායශාස්ත්‍රයයි; මහගත් නම්, ඍග්-යජුස්-සාම-අථර්වන් යන චතුර්වෙදාදිවූ ආගමයි. මෙකී සයෙහි සිඬනුවූ යම් කිසිවක් කීම දෙශාදි විරොධ නම් වේ.

381. මෙ දකුණුමරු සුවඳ—කපුරුතුරුන් පහස් ලද,
කලිඟුවෙනෙ ගජරැස් පිරි—අගිළින් සැදි සොළිගහ,

381. කපුරු තුරුන්, කර්පූරද්‍රැමයන්ගේ; පහස් ලද, ස්පර්ශ ලද්දාවූ; සුවඳ, සුගන්‍ධවූ; මෙ දකුණුමරු, මේ දක්ෂිණමාරුතයයි; කලිඟු වෙනෙ, කාලිඞ්ග වනයෙහි; ගජරැස් පිරි, හස්තිරාජ රාශි පූරිතවිය;

සොළිගන, සොළිරට ගඩහාව හෙවත් කාවෙරිය; අගිලින් සැදි, අගරු වෙනෙන් සජ්ජිතයි. මෙහි—මලයදෙශයෙහි චන්දන මුත් කර්පූර නැති හෙයින් දක්ෂිණ මාරුතයට කර්පූරසංසර්ගීය කිම දෙශවිරොධයි; අරමණයෙහි මුත් කලිඟුරට හස්තින්ගේ බොහෝ ප්‍රසිද්ධියක් නැති හෙයින් කලිඟුවනයෙහි ඇතුන් පිරිනැඟි යනුදු දෙශවිරොධයි. මෙසේම කාවෙරියෙහි කලුවැල් කිමද දෙශවිරොධයි. මෙසේ රාෂ්ට්‍ර වන පර්වතාදියෙහි අප්‍රවෘත්තවූවක් වර්ණනාකිරීම දෙශවිරොධ නම්. **දෙශවිරොධයි.**

382. පිපේ පියුම්විළු රෑ—කුමුදිළු දහවල් පිපේ,
වසත් පුල් දියඹ්දෙල්—සිරිකඬ සිසිරකල් කල්.

382. පියුම්විළු, පද්මවනය; රෑ, රාත්‍රියෙහි; පිපේ, ප්‍රබොධ වන්නේය; කුමුදිළු, කෞමුද වනය; දහවල්, දිවාභාගයෙහි; පිපේ, ප්‍රබුද්ධ වන්නේය; වසත්, වසන්ත කාලයතෙම; පුල් දියඹ්දෙල්, ප්‍රබුද්ධ නිචුලද්‍රැම ඇත්තේය; සිරිකඬ, චන්දනය; සිසිරකල් කල්, සිසිරකාලයට මනොඥයි. මෙහි—දිවාභාගයෙහි ප්‍රබුද්ධවන පද්ම රෑයට කී හෙයින්ද, කුමුදු දහවලට කී හෙයින්ද, වර්ෂාකාලයෙහි ඇති නිචුලකුසුම වසන්තයට කී හෙයින්ද, ඝර්මයට සුදුසු සඳුන් සිසිරකාලයට මනොඥයයි කී හෙයින්ද කාලවිරොධ නම්. **කාලවිරොධයි.**

383. විරු පියඹ දෙරෙසේ—සිටිනා කෝ විස්ම බැව්,
වෙණෙහි දවගම් නවනා—සරස ගමුනුවිසිමුසන්.

383. විරු පියඹ දෙරෙසේ, වීර ශෘඞ්ගාර (යන) රසවයෙහි; සිටිනා බැව්, ස්ථායිභාවනම්; කෝ විස්ම, ක්‍රොධ විස්මය දෙකයි; නවනා, නැවත; වෙණෙහි, වීණායෙහි; සරස, ස්වර සයෙක; දවගම්, ග්‍රාම දෙකෙක; ගමු, (ඒ) ග්‍රාමවයෙහි; උනුවිසිමුසන්, මූර්ච්ඡන ඌනවිස්සෙකි. මෙහි—වීරරසයට ස්ථායීභාව නම්, උත්සාහයයි; ශෘඞ්ගාර රසයට ස්ථායීභාව නම්, රතියයි; ඒ දෙක හැර රෞද්‍රරසයට ස්ථායීභාව වන්නාවූ ක්‍රොධය හා අද්භූත රසයට ස්ථායීභාව වන්නාවූ විස්මය හා දෙක වීර ශෘඞ්ගාර දෙකට ස්ථායීභාවකළ හෙයින්ද කාලවිරොධනම්; වීණායෙහි සප්තස්වරයෙක්ද, තාර මධ්‍ය උච්ච යන ග්‍රාම තුණෙක්ද, මූර්ච්ඡනා විස්සෙක්ද වෙයි; එකිදෙය හැර නොහොත් එයින් එකක් එකක් හැර භෙද කීහෙයින් මේද කලාවිරොධ නම්. **කලාවිරොධයි.**

384. සලං ගජ කෙසුරු—සලං තුරඟ තිසුණු හඟ,
ගුරුසර ගඳඹඅත් තුරු—මෙ කිහිරිතුරු සරවියෝ.

384. ගජ, හස්තිතෙම; කෙසුරු සලා, කෙශරචජටාවන්; සලා, ධූනනය කරන්නේය; තුරඟ, තුරඞ්ගයා; තිසුණු හඟ, තීක්ෂණවූ ශෘඞ්ග ඇත්තේය; ගඳඹඅත් තුරු, ගාන්ධර්වහස්ති ද්‍රැමය; ගුරු සර, මහත්වූ සර ඇත්තේය; මෙ කිහිරිතුරු, මේ ඛදිරද්‍රැමය තෙම, සර වියෝ, සර නැත්තේය. **ලොක විරොධයි.**

385. මුනිවිරු සව්සකර—නොනසි වී සබා වී,
එසෙමනො හෝ සියුරුනෙත්—පවති අදද ලෙහි මා.

385. මුනිවිරු, සර්වඥවීරතෙම; සව්සකර නොනසි වී, සර්වසංස්කාර අවිනශ්වරයයි කියා; සබා වී, සත්‍යයක් කී; එසෙමනො, එසේම නො වේද; සියුරුනෙත්, චකොරනෙත්‍රිවූ; හෝ, ඒ කාන්තාතොමෝ; මා ලෙහි, මාගේ හෘදයෙහි; අදද පවතී, දැනුදු පවතී. මෙහි—මළාවූ ප්‍රියාවක් තමා සිතින් නොයන නියාව කී මේ වචනයද, සර්වඥයන් වහන්සේ සර්වසංස්කාරයන් නිත්‍යය නොකී හෙයින්, ඒ නිත්‍යයයි කීයේය යන වචනයද, හෙතුවිද්‍යා නම්වූ න්‍යායශාස්ත්‍රයට විරුඬනුයි, මේ න්‍යායවිරොධ නම්. හෙතුවිද්‍යා විරොධයි.

386. නොමකල සකරකම්—දදපිත් වෙද අදරා,
පියවි වර පිරිසිදු පිළි—මිණියට සකරකම් කුම්.

386. සකරකම් නොමකල, සංස්කාරකර්මම නොකළාවූ; දදපිත්, බ්‍රාහ්මණපුත්‍රතෙම; වෙද අදරා, වෙදය අධ්‍යයනය කෙරෙයි; (ඒ මෙසේයි) වර, උතුම්වූ; පියවි පිරිසුදු, ප්‍රකෘතිපරිශුඬවූ හෙවත් ස්වභාව යෙන් නිර්මලවූ; පිළිමිණියට, ස්ඵටික මාණික්‍යයට; සකරකම් කුම්, සංස්කාරක්‍රියායෙන් (කාරණා) කිම. උපනයනය නොකළ බ්‍රාහ්මණ කුමාරයන් වෙදාධ්‍යයනය නොකට හැකි බව වෙදශාස්ත්‍රයෙහි පෙණෙන හෙයින් මේ වචනය ඒ ශාස්ත්‍රයට විරුඬනුයි ආගමවිරොධ නම්. ආගම විරොධයි. මෙසේ කවීන්ගේ ප්‍රමාදයෙන් වන විරො ධය, කවිකෞශල්‍යයෙන් දොෂ ගන්නා බව ඉක්ම ගුණවිෂයට බස්නා, මෙම දෙශවිරොධාදියට අවිරුඬ ස්වරූප දක්වන්නාහු "එරජහු පින් තෙදින්" සනාදී කීහු.

387. එ රජහු පින්තෙදින්—සිරිසරවී ඔහු උයන්,
විසිතුරු වතුරු පලුපත්—අසිරි සුරතුරු සියෙන්.

387. එ රජහු පින්තෙදින්, ඒ රජහුගේ පුණ්‍යතෙජසින්; ඔහුඋයන්, ඔහුගේ උද්‍යානය; විසිතුරු, විචිත්‍රවූ; වතුරු, වස්ත්‍ර නමැති; පලුපත්, පලලව් ඇති; සුරතුරු සියෙන්, කල්පද්‍රුම ශතයෙන්; සිරිසරවී, ශ්‍රීසාර විය; අසිරි, ආශ්චර්‍ය්‍යයි. මනුෂ්‍ය ලොකයෙහි කල්පද්‍රුමයන් කීම "එ රජහු පින්තෙදින්" යන ශබ්දසාමර්ථ්‍යයෙන් දෙශවිරොධ නොවී. දෙශවිරොධාභාවයයි.

388. කොළඹවන රෙන් ඉගි—කපවන සත්පත් කුසුම්,
හඟවන වනස් තිරිඳුන්—හැසිරිති කැකුළු මෙ පවන.

388. කොළඹවන රෙන් ඉගි, කදම්බවන රෙණුන් සමග; සත් පත් කුසුම්, සප්තපර්ණ පුෂ්පයන්; කපවන, කම්පාකරවන්නාවූ; තිරි ඳුන්, නරෙන්ද්‍රයන්ගේ; වනස් හඟවන, විනාශය ප්‍රකාශ කරන්නාවූ; කැකුළු මෙපවන, චණ්ඩවූ මේ මාරුතය; හැසිරිති, සඤ්චාරණය කෙළේ. මෙහි—වර්ෂා කාලයෙහි ඇති කොළඹමල්රෙන් හා, ශරත්කාලයෙහි

ඇති රුක්අත්තන මල් සමග කම්පිත කරමින පවනයයි කීමද, "තිරිඳුන් වනස් හනමන" යයි කී හෙයින් මේ කාලවිරොධ නොවී. **කාලවිරොධාභාවයයි.**

**389.** දවන සෙද හෝවිලි—නැගී බියපත් වමියන්,
මියෙන් වසම් ලියගී—රස දන්නන් වැඩි රා.

**389.** හෝවිලි, දෝලා; සෙද දවන, ශීඝ්‍රව දවන කල්හි; බියපත්, භයප්‍රාප්තවූ; වමියන්, වනිතාවන්ගේ; මියෙන් නැඟී, මුඛයෙන් උද්ගතවූ; වසම් ලියගී, විෂම ලයාන්විත ගීතිකා; රස දන්නන්, රසඥජන යන්ගේ; රා වැඩී, රාගවර්ධනය කළා. මෙහි—හෝවිලි සැල්මෙන් ත්‍රස්ත ස්ත්‍රීන්ගේ විෂම ලයාන්විතවූ ගීතිකා රාග වඩන්නට කාරණ නොවතුදු, කාමින්ගේ රාගය වැඩියයි කීමෙන් මේ කලාවිරොධ නොවේ. **කලාවිරොධාභාවයයි.**

**390.** වියවුල් කල් වියෝ—මන වස සඳට වැඩිකල්,
සඳරුසටද වඩා අග—සිහිලැසි දෙනා සලකා.

**390.** කල්වියෝ, කාන්තාවගේ වියොගයෙන්; වියවුල්, ව්‍යාකුලවූ; මන, සිත් ඇත්තේ; වස, විෂය; සඳට වැඩි කල්, චන්‍දනයට වඩා මනොඥකොටද; අග, වහන්සිය; සඳරුසටද වඩා, චන්‍ද්‍රරශ්මියටද වඩා; සිහිලැසි, සිතල කොටද; දෙනා ශලකා, අත්‍යන්තයෙන් සලකත් තේය. ලොක ප්‍රසිද්ධවූ සීතලවූ චන්‍දන චන්‍ද්‍ර දෙකට වඩා විෂවිගී හා ගිනි සිහිලැසි කිවද, ප්‍රිවිප්‍රයොගයෙන් ව්‍යාකුල චිත්ත ඇති පුරුෂයායයි කීහෙයින් ලොකවිරොධ නොවේ. **ලොකවිරොධාභාවයයි.**

**391.** අපමණ පමණවද—පෙණෙම්නුදු නොපෙණෙනු වූ,
එක්නමවද නොඑක්වූ—නමකර සියල්වෙස් තව.

**391.** පමණවද, ප්‍රමාණවද; අපමණ (ගුණයෙන්) අප්‍රමාණවූ; පෙණෙම්නුදු, දෘශ්‍යමානවද; නොපෙණෙනු වූ, (තත්වයෙන්) අදෘශ්‍යමානවූ; එක්නමවද, (ස්වභාවයෙන්) එකාත්මවද; නොඑක්වූ, (අවස්ථාභෙදයෙන්) අනෙකවූ; සියල් වෙස්, විශ්වමූර්තිවූ; තව, තොපට; නමකර, නමස්කාරයි. මේ විෂ්ණුස්තොත්‍රයෙහි ප්‍රමෙය කල් අප්‍රමෙය වන්නේ කෙසේදැයි යනාදීන් න්‍යායවිරොධ දෝෂෝ යන ශඞ්කාව එලවුවද, විශ්වමූර්තිබව කීහෙයින් න්‍යායවිරොධනොවී. **හෙතුවිද්‍යාවිරොධාභාවයයි.**

**392.** පස්පඬිපුතන් එක්—කලතුරුවූ දෙරෙබ නම්,
පැතිනියනට අගවූ—මෙලෙසි දෙවියන් තිපැදුම්.

**392.** පස්පඬිපුතන්, පඤ්චපාණ්ඩුපුත්‍රයන්ගේ, එක් කලතුරුවූ, එක කලත්‍රැවූ; දෙරෙබ නම්, ද්‍රෞපදී නම් එකක්; පැතිනියනට අගවූ, පතිව්‍රතාවන්ට අග්‍රවී; දෙවියන් තිපැදුම්, දෙවතාවන්ගේ නියාපත්තිය; මෙලෙසි, මෙබඳුයි. මෙහි—යුධිෂ්ඨිරය, භීමසෙනය, අර්ජුනය,

නකුලය, සහදේවය යන පචපාණ්ඩවයන්ට කලත්‍රවූ ද්‍රෞපදිය, පතිව්‍රතාවන්ට අග්‍රවූවයි කී කල්හි, එක් පුරුෂයා නකා ජිවිනී පතිව්‍රතා එකකැයි කියයුතු ආගමවිරොධ බවට හෙතු වුවද, පස් අංශයක්ව උපන්නේ එකම විෂ්ණුයයි සමයප්‍රසිද්ධ හෙයින් ආගම විරොධ නො වේ. **ආගමවිරොධාභාවයයි.**

මේ සතැන යථාක්‍රමයෙන් එරජහු පින්තෙදින් යනුද, නිරිඳුන්වනස් හඟවන යනුද, රස දන්නන් යනුද, කල්වියෝ යනුද, නමකර සියල් වෙස් යනුද, මෙලෙසි දෙවියන් නිපැදුම් යනුද දෙශවිරොධාදියට යානොද්දී ගුණපක්‍ෂයෙහිම සිටවී.

393. පෙණෙනත් අත්බෙලෙන්—එන අරුතුදු සදතු දෙක,
යම් සද සවණතෙහි හෙත–හැගෙනු පෙණෙනත නම්වේ

393. පෙණෙනත්, දෘශ්‍යවූ අර්ථය හා; අත්බෙලෙන් එන අරුතුදු, අර්ථබලයෙන් එන්නාවූ අර්ථයදැයි; සදතු දෙක, ශබ්දාර්ථ දෙකින්; යම් සද සවණතෙහි හෙත, යම් ශබ්දයක් කර්ණයෙහි පතිතවත්ම; හැඟෙනු, වැටහෙන්නේ; පෙණෙනත නම් වේ, දෘශ්‍යාර්ථ නම් වේ.

394. වෙන වෙන දුටු සදින්—බදනෙව් පහනින් පෙණෙන,
දැනෙන අනුමෙනෙනරු තට–අත්බෙලෙනෙනරුත් වියත්

394. පහනින් පෙණෙන, ප්‍රදීපයෙන් දෘශ්‍යවූ; වෙන බදනෙව්, අන්‍යවූ භාජනයක් මෙන්; දුටු සදින් වෙන, දෘෂ්ටවූ ශබ්දයෙන් අන්‍යවූ; අනුමෙනෙන් දැනෙන, අනුමානයෙන් දැනෙන්නාවූ; අරුතට, අර්ථයට; අත්බෙලෙනෙන, අර්ථබලයෙන් එන්නාවූ; අරුත් වියත්, අර්ථයයි කියත්.

395. තුමුල් සිරුරැති මේ—දහවල් බත නොබුදි යන,
දහවල්නොකනු පෙණෙනත–රැබිත් බෙලෙනෙන අරුත්

395. තුමුල් සිරුරැති මේ, ස්ථූලවූ ශරීර ඇති මේ පුරුෂතෙම; දහවල් බත නොබුදි යන, දිවාභාගයෙහි භොජනය අනුභව නොකරන්නේයයි කියන්නොත්; දහවල් නොකනු පෙණෙනත, දිවාභාගයෙහි අනුභව නොකිරීම දෘශ්‍යවූ අර්ථයි; රැ බිත්, රෑ අනුභව කිරීම; බෙලෙනෙන අරුත්, සාමර්ථ්‍යයෙන් හැඟෙන්නාවූ අර්ථයි. තර තැනැත්තේ දහවල් බත් නොකයි කී කල එබස කර්ණ හෙත්ම හැඟෙන්නාවූ දහවල් නොකෑම දෘශ්‍යවූ ස්වභාව අර්ථයි; පහන් තබා ලූකල්හි ඉන් පිටත් භාජනය පෙණෙන්නා සේ දහවල් නොකයි යන වචනයම මෙසින් පිටත්වූ අනුමානයෙන් හැඟෙන්නාවූ රෑ කෑම සාමර්ථ්‍යයෙන් එන හෙයින් හැඟෙන්නාවූ අර්ථය අර්ථශක්ති නම් වෙයි; මේ ශක්තින් එන අර්ථය හා ස්වභාවයෙන් එන අර්ථය හා දෙක එක්කොට දැක්වූ ශක්තිස්වභාවාර්ථයි.

396. වසම් පලග දෙසක්—ලන මහකව් ඇඳින්මෙහි,
පැනසසග ලද දනහට—උවවූ වසම්සග මේ.

396. මහකව්, මහාකාව්‍යයෙහි; වසම් පලග, විෂමබන්ධන ප්‍රමාණ ස්ථානයේ; දෙසක් ඇඳින්මෙහි, දෙශයක් ඇඳිනගැන්මෙහි; ලග, ලගනාවූ; පැනසසග ලද, ප්‍රඥාසංඥක ලද්දාවූ; දනහට, ජනයාහට හෙවත් විඥය හට; උවවූ, උපාගවූ; මේ වසම්සග, මේ විෂමසර්ගයයි.

යමකාදි තුන්වන සගයි.

---

397. ලකුණු පණ අත සද—ලකරද ඔසළ එක්දෙස්,
බොලඳ තමා මෙ වදනුදු—හුදු පරවැඩෙහි වේවා.

397. ලකුණු, කාව්‍යලක්ෂණද; පණ, ප්‍රාණද; අත, අර්ථද; සද, ශබ්දද; ලකරද, අලංකාරද (යන මෙයින්); එක්දෙස්, එකදෙශයකට; ඔසළ, අවතීර්ණවූ; තමා බොලඳ මෙ වදනුදු, තමාගේ මුග්ධවූ මේ වචනද; හුදු පරවැඩෙහි, කෙවල පරාර්ථයෙහි; වේවා, පවතීවා.

398. වළඳව සත්ලොවට—සඳම්දුළුදු මහත්මෝ,
පහන් මෙනෙන් පවත්නට-කෙරෙත්නු මනපිණිදහන්

398. මහත්මෝ, මහාත්මයෝ; සඳම්දුළුදු, (තමන්ගේ) සඳම්දුළුදු; සත්ලොවට වළඳව, සත්වලොකයට අනුභවනීයව; පවත්නට, ප්‍රවර්තන වන්නට; පහන් මෙනෙන්, ප්‍රසන්න චිත්තයෙන්; මනපිණිදහන් කෙරෙත්නු, මනොප්‍රණිධාන කරන්නෝම වෙත්නුයි. පිණැතියෝ තමන්ගේ සඳම්දුළුද ලොකයට උපකාර පිණිස පවත්නට ප්‍රාර්ථනා කෙරෙත්; එහෙයින් මාගේ වචනය ශාස්ත්‍රයොගයෙන් ලොවට ප්‍රයොජනවත් වේවා යනු මෙහි අභිප්‍රායි.

399. කිව්ගුණ මැණ මදෙස්—තිදෙස් මැතිසිරි නිවෙස්,
කළතැතිනෙකත්ම තමා—අමරගිරිකසුබුතුමා.

399. කිව්ගුණ, කවිගුණ නමැති; මැණ, මාණික්‍යයන්ට; මදෙස්, මඤ්ජූෂාවූ; තිදෙස් මැතිසිරි නිවෙස්, තිර්දෙශ අමාත්‍යශ්‍රියට නිවෙසවූ; තමා එකත්ම, තමා හා එකාත්මවූ [හෙවත් තමාගේ සහොදරවූ]; අමරගිරිකසුබුතුමා, අමරගිරිකාශ්‍යප නම් උත්තමයා; කළ තැතින්, කළාවූ යත්නයෙන් හෙවත් ආරාධනාවෙන්.

400. සිරිමත් සෙන් වියත්—මිණිරස්නි කිරුළු මෙ සත්,
පැහැයු වස් සේසත්කිස්—තිරිඳු කෙළෙ සලමෙවන්.

400. මෙ සත්, මේ ශාස්ත්‍රය; සිරිමත්, ශ්‍රීමත්වූ; වියත් සෙන්, ව්‍යක්ත සෙනාව ඇති; කිරුළු මිණිරස්නි, මෞලිමාණික්‍ය රශ්මියෙන්; සේසත් කිස්, ශ්වෙතච්ඡත්‍ර කුක්ෂිය; පැහැයු වස්, ආලොක කළාවූ වංශ ඇති; සලමෙවන් තිරිඳු කෙළේ, ශිලාමෙඝවර්ණ නරෙන්ද්‍රයා කෙළේයි.

401. විසිතුරු දසපණින්—ලකර මිණැත් මහයමැ,
නවදොස් යූ මෙ සියබස්—ලකරෙහි සිව්සියක් කව්.

401. දසපණින්, දශප්‍රාණයෙන්; විසිතුරු, විචිත්‍රවූ; ලකරමිණැත්, අලඞ්කාර නමැති මාණික්‍ය ඇති; මහයමැ, මහායමක ආදිවූ යමකද; නවදොස්, නවවිධ දොෂද; යූ, කියා දක්වූ; මෙ සියබස්ලකරෙහි, මෙ ස්වභාෂාලඞ්කාරයෙහි; සිව්සියක් කව්, සාරසියක් කවිහුයි.

සියබස් ලකර නිමි.

---

1. තෙවළාදහම් දැනැ—නෙකරඟ කව්නළු සයුරු,
විහිදි නිය අතලෙන්—අතුටගත් කුඹුයොන් මෙන්.

1. තෙවළාදහම්, ත්‍රිපිටකධර්මය; දැනැ, විජානනය කොට; නෙකරඟ, අනෙකාකාරවූ; කව්නළු සයුරු, කාව්‍යනාටක නමැති සමුද්‍රය; විහිදි, විස්තීර්ණවූ; නිය, ප්‍රඥා නමැති; අතලෙන්, හස්තසම්පුටයෙන්; අතුට ගත්, නගා ගත්තාවූ; කුඹුයොන් මෙන්, අගස්ති ඍෂියා වැනිවූ.

2. මහරු කිවි ගෙළෙ බඳ—රුවන් රුවන්මිඇදුරු,
මෙ ලකරසත් අරුත් පළ—කොළේ සියබස් රුසිරු.

2. කිවිගෙළෙ, කවීන්ගේ කණ්ඨයෙහි; බඳ, බඳනාලද; මහරු රුවන්, මහාඝ රත්නයක් බඳුවූ; රුවන්මිඇදුරු, රත්නමිධවාචාය්‍ය්‍යයන් විසින්; සියබස්, ස්වභාෂාමයවූ; රුසිරු, මනොඥවූ; මෙ ලකර සත්, මේ අලඞ්කාර ශාස්ත්‍රයෙහි; අරුත්පළ, අර්ථවර්ණනාව; කොළේ, කරණලද්දේය.

---

PRINTED AT THE "GRANTHAPRAKASA" PRESS. COLOMBO.



